පිටබැද්දර ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයට ඇතුළත් වූ යම් ඉඩමක් වෙන්දේසිකරුවෙකු හෝ තැරැව්කරුවෙකු හෝ ඔහුගේ සේවකයෙකු හෝ අනු නියෝජිතයා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ හෝ අන්‍යාකාරයකින් විකුණනු ලබන අවස්ථාවක ඒ ඉඩම් විකිණීමෙන් ලත් මුදලින් 1%ක සමාන බද්දක් විකුණුම්කරු හෝ වෙන්දේසිකරු හෝ ඔහුගේ සේවකයා හෝ අනු නියෝජිතයා විසින් පිටබැද්දර ප්‍රාදේශීය සභාවට ගෙවිය යුතු බවට 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 154 (1) වැනි වගන්තිය යටතේ 2017 වර්ෂය සඳහා අය කිරීමට පිටබැද්දර ප්‍රාදේශීය සභාවේ ලේකම් නෙළුව ලියනගේ ප්‍රේමසිරි වන මා විසින් 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9 (3) වගන්තිය ප්‍රකාරව 2016 සැප්තැම්බර් මස 15 වැනි දින තීරණ අංක 217 යටතේ තීරණය කරන ලද බව මෙයින් දන්වා සිටිමි.

නෙළුව ලියනගේ ප්‍රේමසිරි,
ලේකම්,
පිටබැද්දර ප්‍රාදේශීය සභාව.

2016 සැප්තැම්බර් මස 15 වැනි දින,
පිටබැද්දර ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

10 - 855/9

---

**පිටබැද්දර ප්‍රාදේශීය සභාව**

2017 වර්ෂය සඳහා ජල ගාස්තු පැනවීම

1987 අංක 06 දරන පළාත් පාලන (සම්මත අතුරු ව්‍යවස්ථාව) පනත යටතේ 1952 අංක 06 දරන පළාත් පාලන නිවාස හා ඉදිකිරීම් අමාත්‍යතුමා විසින් සාදන ලද 1988.08.23 වැනි දින අංක 520/7 දරන *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ* IV (ආ) කොටසේ පළකරන ලද්දා වූ පොදු ආදර්ශ අතුරු ව්‍යවස්ථාවල අංක 34 ජල සම්පාදන අතුරු ව්‍යවස්ථා අනුව මෙම සභාව මගින් පාලනය වන ජල යෝජනා ක්‍රමය සඳහා වූ ජල ගාස්තු 2017 වර්ෂය සඳහා පනවා අය කිරීමට පිටබැද්දර ප්‍රාදේශීය සභාවේ ලේකම් නෙළුව ලියනගේ ප්‍රේමසිරි වන මා විසින් 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9 (3) වගන්තිය ප්‍රකාරව 2016 සැප්තැම්බර් මස 15 වැනි දින තීරණ අංක 218 යටතේ තීරණය කරන ලද බව මෙයින් දන්වා සිටිමි.

නෙළුව ලියනගේ ප්‍රේමසිරි,
ලේකම්,
පිටබැද්දර ප්‍රාදේශීය සභාව.

2016 සැප්තැම්බර් මස 15 වැනි දින,
පිටබැද්දර ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

01.

| *විස්තරය* | *නේවාසික* *රු. ශත* | *ව්‍යාපාරික* *රු. ශත* |
|---|---|---|
| 01. ස්ථාවර ගාස්තු | 50 0 | 100 0 |
| 02. පළමු ඒකක 10 සඳහා ගාස්තු | 85 0 | 20 0 (සෑම ඒකකයකටම) |
| 03. ඒකක 11 සිට 20 දක්වා | 5 0 | |
| 04. ඒකක 21 සිට 30 දක්වා | 7 50 බැගින් | |
| 05. ඒකක 31 සිට වැඩිවන සෑම ඒකකයක් සඳහාම | 15 0 බැගින් | |

02.

| කරාම ගාස්තු : | නේවාසික රු. ශත | ව්‍යාපාරික රු. ශත |
|---|---|---|
| 1. කරාම 01 සඳහා | 250 0 | 400 0 |
| 2. කරාම 02 සඳහා | 350 0 | 600 0 |
| 3. කරාම 03 සඳහා | 450 0 | 800 0 |
| 4. කරාම 04 සඳහා | 550 0 | 1,000 0 |
| 5. කරාම 05 සඳහා | 650 0 | 1,200 0 |
| 6. කරාම 06 සඳහා | 750 0 | 1,400 0 |

මෙම ක්‍රමය අනුව වැඩිවන ඒකකවලට නියම කරන ජල ගාස්තු ගෙවිය යුතු ය.

*03. නැවත සවි කිරීමේ ගාස්තු :*

| | රු. ශත |
|---|---|
| 01. ගෘහ | 300 0 |
| 02. ව්‍යාපාරික | 500 0 |

10 - 855/10

---

**දැරණියගල ප්‍රාදේශීය සභාව**

2017 වර්ෂය සඳහා ප්‍රසිද්ධ රඟ දැක්වීමේ ආඥාපනත අනුව ගාස්තු අයකිරීම

දැරණියගල ප්‍රාදේශීය සභාවේ ලේකම් වන එම්. එල්. ඩී. ඉන්ද්‍රානි මඩවල වන මා විසින් 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9.3 වගන්තිය සමග කියවිය යුතු ප්‍රසිද්ධ රඟ දැක්වීමේ ආඥාපනතේ 3 වැනි වගන්තිය ප්‍රකාරව දැරණියගල ප්‍රාදේශීය සභාවේ බලතල, කාර්යය, කර්තව්‍ය ක්‍රියාත්මක කරන නිලධාරි වශයෙන් 2017 වර්ෂයට දැරණියගල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ පැවැත්වෙන විනෝද කටයුතු සඳහා පහත උපලේඛනයේ සඳහන් පරිදි බලපත්‍ර ගාස්තු පැනවීම් සම්බන්ධයෙන් පහත සඳහන් තීරණය වර්ෂ 2016ක් වූ සැප්තැම්බර් මස 19 වැනි දින තීරණ අංක 282 යටතේ ගන්නට යෙදුණු බව මෙයින් නිවේදනය කරමි.

එම්. එල්. ඩී. ඉන්ද්‍රානි මඩවල,<br>
ලේකම්,<br>
බලතල, කාර්යය, කර්තව්‍ය<br>
ක්‍රියාත්මක කරන නිලධාරි,<br>
දැරණියගල ප්‍රාදේශීය සභාව.

2016 සැප්තැම්බර් මස 30 වැනි දින,<br>
දැරණියගල ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

**තීරණය**

දැරණියගල ප්‍රාදේශීය සභාවේ ලේකම් වන එම්. එල්. ඩී. ඉන්ද්‍රානි මඩවල වන මා විසින් 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9.3 වගන්තිය සමග කියවිය යුතු ප්‍රසිද්ධ රඟ දැක්වීමේ ආඥාපනතේ 3 වැනි වගන්තිය ප්‍රකාරව දැරණියගල ප්‍රාදේශීය සභාවේ බලතල, කාර්යය, කර්තව්‍ය ක්‍රියාත්මක කරන නිලධාරි වශයෙන් 2017 වර්ෂයට දැරණියගල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ පැවැත්වෙන විනෝද කටයුතු සඳහා පහත උපලේඛනයේ සඳහන් පරිදි බලපත්‍ර ගාස්තු පනවා අය කිරීමට මම තීරණය කරමි. එනම්,

*උපලේඛනය*

01. තාවකාලික චිත්‍රපට දර්ශන, මැජික් දර්ශන, සර්කස් දර්ශන, නාට්‍ය දර්ශන සඳහා එක් දිනකට රු. 100ක් ද, ඊට වැඩි වන සෑම දිනකටම රු. 25.00 බැගින්ද.

02. සංගීත සංදර්ශනයකට එක් දිනකට රු. 200.00 බැගින් ද,

03. වාර්ෂික බලපත්‍ර ගාස්තුව රු. 750.00 බැගින් ද අය කරනු ලැබේ.

10-1256/9

---

**දැරණියගල ප්‍රාදේශීය සභාව**

2017 වර්ෂය සඳහා පෝරම ගාස්තු හා වෙනත් සේවා ගාස්තු අය කිරීම

දැරණියගල ප්‍රාදේශීය සභාවේ ලේකම් වන එම්. එල්. ඩී. ඉන්ද්‍රානි මඩවල වන මා විසින් 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9.3 වගන්තිය අනුව දැරණියගල ප්‍රාදේශීය සභාවේ බලතල, කාර්යය, කර්තව්‍ය ක්‍රියාත්මක කරන නිලධාරි වශයෙන් 2017 වර්ෂයට අදාළ පෝරම ගාස්තු හා වෙනත් සේවා ගාස්තු අය කිරීම සම්බන්ධයෙන් පහත සඳහන් තීරණය වර්ෂ 2016ක් වූ සැප්තැම්බර් මස 19 වැනි දින තීරණ අංක 281 යටතේ ගන්නට යෙදුණු බව මෙයින් නිවේදනය කරමි.

එම්. එල්. ඩී. ඉන්ද්‍රානි මඩවල,
ලේකම්,
බලතල, කාර්ය, කර්තව්‍ය
ක්‍රියාත්මක කරන නිලධාරි,
දැරණියගල ප්‍රාදේශීය සභාව.

2016 සැප්තැම්බර් මස 30 වැනි දින,
දැරණියගල ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

**තීරණය**

දැරණියගල ප්‍රාදේශීය සභාව විසින් 2017 ජනවාරි මස 01 වැනි දින සිට බලපැවැත්වෙන පරිදි පහත ආකාරයට ගාස්තු පැනවීමට තීරණය කරමි.

*උපලේඛනය*

| | *I වැනි තීරය* | *II වැනි තීරය* රු. ශත |
|---|---|---|
| 01 | ගොඩනැගිලි අයදුම්පත්‍ර | 750 0 |
| 02 | ගොඩනැගිලි අනුකූලතා සහතික | 1,000 0 |
| 03 | ජාතික ගොඩනැගිලි පර්යේෂණ ආයතනයේ ඉල්ලුම්පත්‍ර ගාස්තුව | 25 0 |
| 04 | වීථි රේඛා අයදුම්පත් ගාස්තුව | 150 0 |
| 05 | වීථි රේඛා සහතික පත් ගාස්තුව | 1,000 0 |
| 06 | අනතුරුදායක ගස් ඉවත් කිරීමේ ගාස්තු - කොස් ගස් සඳහා | 350 0 |
| | කොස් නොවන වෙනත් ගස් සඳහා | 250 00 |
| 07 | ජල ගිවිසුම් පත්‍ර ගාස්තුව | 25 0 |
| 08 | පරිසර බලපත්‍ර පරීක්ෂණ ගාස්තු | 750 0 |
| 09 | පරිසර බලපත්‍ර ගාස්තු | 4,000 0 |
| 10 | පරිසර අයදුම්පත්‍ර ගාස්තුව (නව කර්මාන්ත සඳහා) | 100 0 |
| | (බලපත්‍ර අළුත් කිරීම සඳහා) | 50 0 |

| *I වැනි තීරය* | *II වැනි තීරය* රු. ශත |
|---|---|
| 11 දේපළ අයිතිය ලියාපදිංචි කිරීමේ අයදුම්පත් ගාස්තුව | 500 0 |
| 12 වරිපනම් උධෘත නිකුත් කිරීම (එක් වසරකට) | 25 0 |
| 13 ඡායා පිටපත් කිරීමේ ගාස්තු - තනිපිට | 5 0 |
| - දෙපිට | 7 0 |
| 14 ජල අයදුම්පත් ගාස්තුව - ගෘහස්ත (තැන්පත් මුදල) | 500 0 |
| වෙළඳ (තැන්පත් මුදල) | 750 0 |
| 15 මිහිදන් කිරීමේ ගාස්තු | 10 0 |
| 16 ගොඩනැගිලි අයදුම්පත් කාලය දීර්ඝ කිරීමේ ගාස්තුව | 200 0 |

17 ගොඩනැගිලි අයදුම්පත් පරීක්ෂණ ගාස්තු අය කිරීම :

| *ගෙබිම විශාලත්වය වර්ග අඩි* | *නිවාස සඳහා* රු. | *ව්‍යාපාර සඳහා* රු. |
|---|---|---|
| 483.75 අඩු | 500 0 | 1,000 0 |
| 483 - 967.50 | 1,500 0 | 2,000 0 |
| 967.50 - 1161 | 2,500 0 | 3,000 0 |
| 1161 - 2902.50 | 3,500 0 | 4,000 0 |
| 2902.50 - 4837.50 | 4,.500 0 | 6,000 0 |
| 4837.50 - 7256.25 | 5,500 0 | 8,000 0 |
| 7256.25 - 9675.00 | 6,500 0 | 10,000 0 |
| 9675.00 - 13168.75 | 7,500 0 | 12,000 0 |
| 13168.75ට වැඩි | 7,500 0 | 12,000 0 |
| | වර්ග අඩි 13168.75කට වඩා වැඩි වන සෑම වර්ග අඩි 967.5ක් වන එක් එක් අමතර ගෙබිම ප්‍රමාණ සඳහා රු. 1,000.00 බැගින් | වර්ග අඩි 13168.75 කට වඩා වැඩි වන සෑම වර්ග අඩි 967.5ක් වන එක් එක් අමතර ගෙබිම ප්‍රමාණ සඳහා රු. 1,000.00 බැගින් |

18. ප්‍රාදේශීය සභාව සතු ක්‍රීඩා පිටි කුලියට ලබා දීම

* පොදු වෙළඳපල අසල ක්‍රීඩා පිටිය

වර්ග අඩි 50ට අඩු ප්‍රමාණයන් නම් දිනකට රු. 100 බැගින් ද වර්ග අඩි 50ට වැඩි ප්‍රමාණයන් නම් වර්ග අඩියකට රු. 2.00 බැගින් දින ගණනට අය කරනු ලැබේ.

* ප්‍රාදේශීය සභාව පිටු පස ඇති ක්‍රීඩා පිටිය

දිනකට රු. 5,000 බැගින් අය කරනු ලැබේ.

19. යන්ත්‍ර සූත්‍ර කුලියට දීම :

| *වාහනය/යන්ත්‍රය* | *මිල ගණන* රු. ශත | *කාලය* | *ඉන්ධන* රු. ශත |
|---|---|---|---|
| ලෙලන තලනය | 4,500 0 | පෙ.ව. 8.00 සිට ප.ව. 5.00 දක්වා වැඩ කරන සෑම දිනකම | රහිතයි |
| බැක්හෝ ලෝඩරය - ජේසීබී | 2,500 0 | මීටර් පැයකට (යාමට ගතවන කාලය සමග) | සහිතයි |
| කම්පන තලනය | 2,500 0 | පෙ.ව. 8.00 සිට ප.ව. 5.00 දක්වා වැඩ කරන සෑම දිනකම | රහිතව |
| ජල බවුසරය | 7,700 0 | පෙ.ව. 8.00 සිට ප.ව. 5.00 දක්වා වැඩ කරන සෑම දිනකම | සහිතයි |
| ටිපර් රථය කියුබ් 2.5 | 9,500 0 | පෙ.ව. 8.00 සිට ප.ව. 5.00 දක්වා වැඩ කරන සෑම දිනකම | සහිතයි |

ගලි බවුසරය

| | | | |
|---|---|---|---|
| බල ප්‍රදේශය තුළ | 5,000 0 | එක් වාරයක් සඳහා | සහිතයි |
| බල ප්‍රදේශයෙන් පිටත | 7,000 0 | | |
| ස.අ. 75 ට්‍රේලරය සමග ට්‍රැක්ටරය | 6,000 0 | පෙ.ව. 8.00 සිට ප.ව. 5.00 දක්වා වැඩ කරන සෑම දිනකම | සහිතයි |
| ස.අ. 90 ට්‍රේලර්ය සමග ට්‍රැක්ටරය | 6,000 0 | | |

20. ප්‍රචාරක දැන්වීම් පුවරු සඳහා ගාස්තු : රු. ශත

| | |
|---|---|
| * බැනර් ප්‍රදර්ශනය කිරීම වර්ග අඩි 01ක් සඳහා එක් මාසයකට හෝ ඉන් කොටසකට | 40 0 |
| * වෙළඳ නාම පුවරු ප්‍රදර්ශනය කිරීම සඳහා වර්ග අඩි 01ක් සඳහා එක් වර්ෂයකට හෝ ඉන් කොටසකට | 50 0 |

10-1256/8

---

**දැරණියගල ප්‍රාදේශීය සභාව**

2017 වර්ෂය සඳහා ජල ගාස්තු පැනවීම

දැරණියගල ප්‍රාදේශීය සභාවේ ලේකම් වන එම්. එල්. ඩී. ඉන්ද්‍රානි මඩවල වන මා විසින් 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9.3 වගන්තිය සමග කියවිය යුතු 1979.05.25 දිනැති ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* IV (ආ) කොටසේ අනුමත කරන ලද සම්මත අතුරු ව්‍යවස්ථාවේ අංක 27හි පනවා ඇති ජල අතුරු ව්‍යවස්ථාව ප්‍රකාරව දැරණියගල ප්‍රාදේශීය සභාවේ බලතල, කාර්යය, කර්තව්‍ය ක්‍රියාත්මක කරන ඉටු කරන නිලධාරි වශයෙන් 2017 වර්ෂයට අදාළ ජල ගාස්තු පැනවීම සම්බන්ධයෙන් පහත සඳහන් තීරණය වර්ෂ 2016ක් වූ දෙසැම්බර් මස 19 වැනි දින තීරණ අංක 280 යටතේ ගන්නට යෙදුණු බව මෙයින් නිවේදනය කරමි.

එම්. එල්. ඩී. ඉන්ද්‍රානි මඩවල,
ලේකම්,
බලතල, කාර්යය, කර්තව්‍ය
ක්‍රියාත්මක කරන නිලධාරි,
දැරණියගල ප්‍රාදේශීය සභාව.

2016 සැප්තැම්බර් මස 30 වැනි දින,
දැරණියගල ප්‍රාදේශීය සභාව,
දැරණියගල.

**තීරණය**

දැරණියගල ප්‍රාදේශීය සභාවේ ලේකම් වන එම්. එල්. ඩී. ඉන්ද්‍රානි මඩවල වන මා විසින් 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9.3 වගන්තිය සමග කියවිය යුතු 1979.05.25 දිනැති ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* IV (ආ) කොටසේ අනුමත කරන ලද සම්මත අතුරු ව්‍යවස්ථාවේ අංක 27හි පනවා ඇති ජල අතුරු ව්‍යවස්ථාව ප්‍රකාරව දැරණියගල ප්‍රාදේශීය සභාවේ බලතල, කාර්ය, කර්තව්‍ය ක්‍රියාත්මක කරන නිලධාරි වශයෙන් 2016 වර්ෂයේ අයකරන ලද ජල ගාස්තුව 2017 වර්ෂය සඳහා පනවා අය කිරීමට තීරණය කරමි. එනම්,

***උපලේඛනය***

| *ඒකක ප්‍රමාණය* | *ගෘහස්ථ* රු. ශත | *ඒකක ප්‍රමාණය* | *වෙළඳ* රු. ශත |
|---|---|---|---|
| 01 - 10 | 20 0 | 01 - 10 | 100 0 |
| 11 - 20 | 50 0 | 11 - 30 | 150 0 |
| 21 ට වැඩි | 100 0 | 31ට වැඩි | 200 0 |

01. ජල ගාස්තු නොගෙවීම හෝ අතුරු ව්‍යවස්ථාව කඩකිරීමක් මත විසන්ධි කරනු ලබන ජල සේවාවන් නැවත ලබාදීම සඳහා රු. 500.00කි.

02. අනවසරයෙන් ජලය පරිහරණය කරනු ලබන බවට හෙළිවුවහොත් මාස 12ක් ඇතුළත මනු ගතව තිබූ උපරිම ඒකක ගණන මෙන් දස ගුණයක් වූ ඒකක සඳහා වන ගාස්තුව දඩ ගාස්තුවක් ලෙස ද ඊට අමතර රු. 2,500 ක අතිරේක ගාස්තුවක් ද අය කෙරේ.

03. පාරිභෝගිකයාගේ ඉල්ලීම මත විසන්ධි කරනු ලබන සේවාවන් නැවත ලබා දීම සඳහා රු. 500.00ක් අය කෙරේ.

04. රජයේ පාසල් හා ආගමික ස්ථාන ජල ගාස්තුවලින් නිදහස් වේ.

10-1256/7

---

**දැරණියගල ප්‍රාදේශීය සභාව**

2017 වර්ෂය සඳහා ව්‍යාපාර බදු පැනවීම

දැරණියගල ප්‍රාදේශීය සභාවේ ලේකම් වන එම්. එල්. ඩී. ඉන්ද්‍රානි මඩවල වන මා විසින් 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9.3 වගන්තිය සමග කියවිය යුතු එම පනතේ 152 (1) වැනි උපවගන්තිය ප්‍රකාරව දැරණියගල ප්‍රාදේශීය සභාවේ බලතල, කාර්ය, කර්තව්‍ය ක්‍රියාත්මක කරන නිලධාරි වශයෙන් 2017 වර්ෂයට අදාළ ව්‍යාපාර බදු පැනවීම සම්බන්ධයෙන් පහත සඳහන් තීරණය වර්ෂ 2016 ක් වූ සැප්තැම්බර් මස 19 වැනි දින තීරණ අංක 279 යටතේ ගන්නට යෙදුණු බව මෙයින් නිවේදනය කරමි.

එම්. එල්. ඩී. ඉන්ද්‍රානි මඩවල,
ලේකම්,
බලතල, කාර්යය, කර්තව්‍ය
ක්‍රියාත්මක කරන නිලධාරි,
ප්‍රාදේශීය සභාව දැරණියගල.

2016 සැප්තැම්බර් මස 30 වැනි දින,
දැරණියගල ප්‍රාදේශීය සභාව,
දැරණියගල.

**තීරණය**

දැරණියගල ප්‍රාදේශීය සභාවේ බලතල ක්‍රියාත්මක කරන, කාර්ය, කර්තව්‍ය ඉටු කරන දැරණියගල ප්‍රාදේශීය සභාවේ ලේකම් එම්. එල්. ඩී. ඉන්ද්‍රානි මඩවල වන මම 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9.3 වගන්තිය සමග කියවිය යුතු එම පනතේ 152 (1) උපවගන්තියෙහි විධිවිධාන ප්‍රකාරව දැරණියගල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය සඳහා 2017 වර්ෂයට අදාළව ව්‍යාපාර බදු නියම කිරීම පහත සඳහන් ආකාරයට විය යුතු බවට තීරණය කරමි. එනම් ;

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9.3 වගන්තිය සමග කියවිය යුතු 152 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තිය යටතේ දැරණියගල ප්‍රාදේශීය සභාවට පැවරී ඇති බලතල ප්‍රකාර එකී පනතේ හෝ ඒ යටතේ සාදන ලද අතුරු ව්‍යවස්ථාවක විධිවිධාන යටතේ බලපත්‍රයක් ලබා ගැනීම හෝ එම පනතේ 150 වැනි වගන්තිය යටතේ යම් බද්දක් ගෙවීම අවශ්‍ය නොවන්නා වූ යම් ව්‍යාපාරයක් දැරණියගල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය ඇතුළත 2017 වර්ෂයේ දී පවත්වාගෙන යන සෑම තැනැත්තෙකුගෙන්ම එම ව්‍යාපාරයේ 2016 වර්ෂයේ ආදායම මෙහි පහත උපලේඛනයෙහි I වැනි තීරුවේ නිරූපිත යම් විෂයාංක සීමාවන් ඇතුළත පවතින අවස්ථාවක එකී II තීරුවේ අනුරූප සටහනේ නිරූපිත අනුප්‍රමාණයක ව්‍යාපාර බද්දක් 2017 වර්ෂය සඳහා නියම විය යුතු බවට මම තීරණය කරමි.

*උපලේඛනය*

| *I වැනි තීරුව* | *II වැනි තීරුව* |
|---|---|
| *2016 වර්ෂයේ දී ව්‍යාපාරයේ ආදායම* | *රු. ශත* |
| රු. 6,000 නොඉක්මවන අවස්ථාවක | කිසිවක් නොමැත |
| රු. 6,000 ඉක්මවන එහෙත් රු. 12,000 නොඉක්මවන අවස්ථාවක | 90 0 |

| *I වැනි තීරුව* | *II වැනි තීරුව* |
|---|---|
| *2016 වර්ෂයේ දී ව්‍යාපාරයේ ආදායම* | *රු. ශත* |
| රු. 12,000 ඉක්මවන නමුත් රු. 18,750 නොඉක්මවන අවස්ථාවක | 180 0 |
| රු. 18,750 ඉක්මවන නමුත් රු. 75,000 නොඉක්මවන අවස්ථාවක | 300 0 |
| රු. 75,000 ඉක්මවන නමුත් රු. 1,50,000 නොඉක්මවන අවස්ථාවක | 1,200 0 |
| රු. 1,50,000 ඉක්මවන විට | 3,000 0 |

10-1256/6

---

**දැරණියගල ප්‍රාදේශීය සභාව**

2017 වර්ෂය සඳහා කර්මාන්ත බදු පැනවීම

දැරණියගල ප්‍රාදේශීය සභාවේ ලේකම් වන එම්. එල්. ඩී. ඉන්ද්‍රානි මඩවල වන මා විසින් 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9.3 වගන්තිය සමග කියවිය යුතු එම පනතේ 150 (1) වැනි වගන්තිය ප්‍රකාරව දැරණියගල ප්‍රාදේශීය සභාවේ බලතල, කාර්යය, කර්තව්‍ය ක්‍රියාත්මක කරන නිලධාරි වශයෙන් 2017 වර්ෂයට අදාළ කර්මාන්ත බදු පැනවීම සම්බන්ධයෙන් පහත සඳහන් තීරණය වර්ෂ 2016 ක් වූ සැප්තැම්බර් මස 19 වැනි දින තීරණ අංක 278 යටතේ ගන්නට යෙදුණු බව මෙයින් නිවේදනය කරමි.

එම්. එල්. ඩී. ඉන්ද්‍රානි මඩවල,
ලේකම්,
බලතල, කාර්යය, කර්තව්‍ය
ක්‍රියාත්මක කරන නිලධාරි,
ප්‍රාදේශීය සභාව දැරණියගල .

2016 සැප්තැම්බර් මස 30 වැනි දින,
දැරණියගල ප්‍රාදේශීය සභාව,
දැරණියගල.

**තීරණය**

දැරණියගල ප්‍රාදේශීය සභාවේ බලතල, ක්‍රියාත්මක කරන කාර්යය, කර්තව්‍ය ඉටු කරන දැරණියගල ප්‍රාදේශීය සභාවේ ලේකම් වන එම්. එල්. ඩී. ඉන්ද්‍රානි මඩවල වන, මම 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9.3 වගන්තිය සමග කියවිය යුතු එම පනතේ 150 (1) වගන්තියෙහි විධිවිධාන ප්‍රකාරව දැරණියගල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය සඳහා 2017 වර්ෂයට අදාළව කර්මාන්ත බදු නියම කිරීම පහත සඳහන් ආකාරයට විය යුතු බව තිරණය කරමි. එනම්,

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9.3 වැනි වගන්තිය සමග කියවිය යුතු එම පනතේ 150 වැනි වගන්තිය (1) වැනි උපවගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර දැරණියගල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය ඇතුළත යම් පරිශ්‍රයක පවත්වාගෙන යනු ලබන මෙහි පහත උපලේඛනයෙහි I වැනි තීරුවේ නිරූපිත සෑම කර්මාන්තයක් සම්බන්ධයෙන් එම උපලේඛනයෙහි II තීරුවේ අනුරූප සටහනේ නිරූපිත ප්‍රමාණයක කර්මාන්ත බද්දක් 2017 වර්ෂය සඳහා නියම විය යුතු බවට මම තීරණය කරමි.

**උපලේඛනය**

I කොටස (150 වගන්තිය යටතේ බලපත්‍ර ගාස්තු)

| | *I වැනි තීරය*<br>*බලය දෙනු ලබන කාර්යය* | *II වැනි තීරය*<br>*පරිශ්‍රයෙහි වාර්ෂික වටිනාකම* | | |
|---|---|---|---|---|
| | | *රු. 750 නොඉක්මවන අවස්ථාවක* | *රු. 750 ඉක්මවන එහෙත් රු. 1,500 නොඉක්මවන අවසථාවක* | *රු. 1,500 ඉක්මවන අවස්ථාවක* |
| | | *රු. ශ.* | *රු. ශ.* | *රු. ශ.* |
| 01. | යන්ත්‍රයක් නොමැතිව සපත්තු හා බෑග් නිපදවීම | 500 0 | 750 0 | 1,000 0 |
| 02. | වේවැල් බඩු නිපදවීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |

| | I වැනි තීරය<br>බලය දෙනු ලබන කාර්යය | II වැනි තීරය<br>පරිශ්‍රයෙහි වාර්ෂික වටිනාකම<br>රු. 750 නොඉක්මවන අවස්ථාවක<br>රු. ශ. | <br><br>රු. 750 ඉක්මවන එහෙත් රු. 1,500 නොඉක්මවන අවසථාවක<br>රු. ශ. | <br><br>රු. 1,500 ඉක්මවන අවස්ථාවක<br>රු. ශ. |
|---|---|---|---|---|
| 03. | හඳුන්කූරු නිපදවීමේ ස්ථායක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 04. | ඉදල්/කොහු ආශ්‍රිත භාණ්ඩ නිපදවීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 05. | මැටි බඩු නිපදවීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 06. | බතික් වැඩ කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 07. | සුවඳ පියර නිපදවීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 08. | පපඩම් නිපදවීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 09. | වැලි විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |

10-1256/5

---

**දැරණියගල ප්‍රාදේශීය සභාව**

2017 වර්ෂය සඳහා බලපත්‍ර ගාස්තු පැනවීම

දැරණියගල ප්‍රාදේශීය සභාවේ ලේකම් වන එම්. එල්. ඩී. ඉන්ද්‍රානි මඩවල වන මා විසින් 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9.3 වගන්තිය සමග කියවිය යුතු එම පනතේ 147 වැනි වගන්තිය හා 149 වැනි වගන්තිය ප්‍රකාරව දැරණියගල ප්‍රාදේශීය සභාවේ බලතල, කාර්යය, කර්තව්‍ය ක්‍රියාත්මක කරන නිලධාරි වශයෙන් 2017 වර්ෂයට අදාළ බලපත්‍ර ගාස්තු පැනවීම සම්බන්ධයෙන් පහත සඳහන් තීරණය වර්ෂ 2016ක් වූ සැප්තැම්බර් මස 19 වැනි දින තීරණ අංක 277 යටතේ ගන්නට යෙදුණු බව මෙයින් නිවේදනය කරමි.

එම්. එල්. ඩී. ඉන්ද්‍රානි මඩවල,
ලේකම්,
බලතල, කාර්ය, කර්තව්‍ය
ක්‍රියාත්මක කරන නිලධාරි,
දැරණියගල ප්‍රාදේශීය සභාව.

2016 සැප්තැම්බර් මස 30 වැනි දින,
දැරණියගල ප්‍රාදේශීය සභාව,
දැරණියගල.

**තීරණය**

දැරණියගල ප්‍රාදේශීය සභාවේ බලතල, ක්‍රියාත්මක කරන කාර්ය, ඉටු කරන දැරණියගල ප්‍රාදේශීය සභාවේ ලේකම් වන එම්. එල්. ඩී. ඉන්ද්‍රානි මඩවල වන මම 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9.3 වගන්තිය සමග කියවිය යුතු එම පනතේ 147 වැනි වගන්තිය හා 149 වැනි වගන්තිය යටතේ මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව, දැරණියගල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය සඳහා 2017 වර්ෂයට අදාළව බලපත්‍ර ගාස්තු නියම කිරීම පහත සඳහන් ආකාරයට විය යුතු බව තීරණය කරමි. එනම්,

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9.3 වගන්තිය සමග කියවිය යුතු 147 වැනි වගන්තිය හා 149 වැනි වගන්තිය යටතේ මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, එකී පනතේ හෝ එකී පනත යටතේ සාදන ලද අතුරු ව්‍යවස්ථාවක විස්තර කර ඇති මෙහි පහත උපලේඛනයෙහි I වැනි තීරුවේ නිරූපිත යම් කාර්යයක් සඳහා දැරණියගල ප්‍රාදේශීය සභා ප්‍රදේශය ඇතුළත යම් ස්ථානයක් හෝ පරිශ්‍රයක් පාවිච්චි කිරීමට බලය දෙමින් 2017 වර්ෂයේ නිකුත් කරනු ලබන යම් බලපත්‍රයක් සම්බන්ධයෙන් එම උපලේඛනයේ II වැනි තීරුවේ අනුරූප සටහනේ නිරූපිත බලපත්‍ර ගාස්තුවක් 2017 වර්ෂය සඳහා නියම විය යුතු බවට ද,

තව ද, එකී ස්ථානය හෝ පරිශ්‍රය 1968 අංක 14 දරන සංචාරක මණ්ඩල පනතේ කාර්යය සඳහා සංචාරක මණ්ඩලයේ අනුමත කර ඇති, පිළිගෙන ඇති හෝටලයක්, ආපන ශාලාවක්, නවාතැන්පළක් වන විට දී, ඊට අදාළ බලපත්‍ර ලබාදීමේ දී එම ස්ථානයේ හෝ පරිශ්‍රයේ 2016 වර්ෂයේ ලැබීම්වලින් 1%ක් බලපත්‍ර ගාස්තුව ලෙස 2017 වර්ෂය සඳහා නියම විය යුතු බවටත් මම තීරණය කරමි.

*උපලේඛනය I*

| *I වැනි තීරය*<br>*බලය දෙනු ලබන කාර්යය* | *II වැනි තීරය*<br>*පරිශ්‍රයෙහි වාර්ෂික වටිනාකම* | | |
|---|---|---|---|
| | *රු. 750 නොඉක්මවන අවස්ථාවක* | *රු. 750 ඉක්මවන එහෙත් රු. 1,500 නොඉක්මවන අවස්ථාවක* | *රු. 1,500 ඉක්මවන අවස්ථාවක* |
| | *රු. ශත* | *රු. ශත* | *රු. ශත* |
| *අන්තරාදායක ව්‍යාපාර :* | | | |
| 01. අත්‍යන්ත්‍ර මගින් රබර් දුම් ගැසීම හා ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 02. කබොක්, බොරළු හැරීමේ ස්ථානයක් හෝ කලු ගල් කැඩීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 03. යන්ත්‍රානුසාරයෙන් පොල්තෙල් නිපදවීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 04. මුද්‍රණාලයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 05. යතුරු පැදි අළුත්වැඩියා කරන ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 06. ත්‍රිරෝද රථ අළුත්වැඩියා කරන ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 07. කෘත්‍රිම පොහොර නිපදවීමේ හෝ මිශ්‍ර කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 08. සිසිල් බීම නිෂ්පාදනය කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 09. කළුගල් පිපිරවීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 10. යන්ත්‍ර මගින් ක්‍රියාකර ලී මෝලක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 11. අම්ලකර වායු භාවිතා කරන යකඩ වැඩපලක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 12. යන්ත්‍රවලින් හෝ අතින් ක්‍රියාකර වීම, නූල් කැටීමේ හෝ රෙදි විවීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 13. රෙදි පිළි මෝස්තර නිර්මානය කිරීමේ හා පින්තාරු කිරීමේ මධ්‍යස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 14. විද්‍යුත් ලෝහාලේපනය කිරීම සඳහා යාන්ත්‍රික බලයෙන් ක්‍රියා කරන ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 15. බයිසිකල් අළුත්වැඩියා කරන ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 16. බෙලෙක් වැඩ කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 17. මෝටර් ගරාජයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 18. ලෑලි පෙට්ටි හෝ තේ පෙට්ටි නිෂ්පාදනය කරන ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 19. ගෝනි ගබඩා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 20. කුමන වර්ගයක හෝ තෙල් ගබඩාවක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 21. අයිස්ක්‍රීම් නිපදවීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 22. හකුරු නිපදවීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 23. පරණ ලෝහ භාණ්ඩ ගබඩා කර තැබීමේ මධ්‍යස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 24. පින්තාරු සඳහා ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 25. ඇස් කණ්නාඩි නිපදවීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 26. ඇඳුම් මැසීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 27. ලී කැටයම් කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 28. අභ්‍යාස පොත් නිෂ්පාදනය කරන ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 29. කුෂන් වැඩපලක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 30. කෘෂි රසායනික ද්‍රව්‍ය අලෙවි කරන ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 31. රබර් මිළට ගැනීමේ හා ගබඩා කිරීමේ මධ්‍යස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 32. ෆොටෝ කොපි/ලැමිනේටින්/බයින්ඩින්/දුරකථන සඳහා සේවා ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 33. පරිගණක/යතුරු ලියන සේවාව සඳහා ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 34. ඒජන්සි තැපැල් කාර්යාලයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 35. ලොතරැයි අලෙවි කුටි පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 36. ඇලුමිනියම් භාණ්ඩ අලෙවි කරන ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |

| *I වැනි තීරය* *බලය දෙනු ලබන කාර්යය* | *II වැනි තීරය* *පරිශ්‍රයෙහි වාර්ෂික වටිනාකම* | | |
|---|---|---|---|
| | *රු. 750 නොඉක්මවන අවස්ථාවක* | *රු. 750 ඉක්මවන එහෙත් රු. 1,500 නොඉක්මවන අවස්ථාවක* | *රු. 1,500 ඉක්මවන අවස්ථාවක* |
| | *රු. ශත* | *රු. ශත* | *රු. ශත* |
| 37. අවමංගල්‍ය භාණ්ඩ නිපදවීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 38. මංගල උත්සව භාණ්ඩ සැපයීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 39. මහන මැෂින් වෙළඳාම් කරන ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 40. මැටි භාණ්ඩ වෙළඳාම් කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |

*උපලේඛනය II*

*අප්‍රසන්න ව්‍යාපාර :*

| | | | |
|---|---|---|---|
| 01. පුවක් වේලා සකස් කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 02. මාළු අයිස් දැමීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 03. සජීවී සතුන් විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 04. විකිණීම සඳහා ඇති කරන මාළු ගබඩා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 05. කුකුළන් ඇති කරන ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 06. කපු නූල් සායම් පෙවීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 07. කුකුල් කෑම විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 08. මඩ පුවක් ගබඩා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 09. යන්ත්‍රානුසාරයෙන් සපත්තු හා පාවහන් නිපදවීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 10. භාණ්ඩ තොග වශයෙන් විකුණන ස්ථානයක් පවත්වාගෙන යාම (තොග ගබඩා) | 500 0 | 750 0 | 1,000 0 |
| 11. සම් බෑග් නිෂ්පාදන සඳහා ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 12. පුවක් මිළ දී ගැනීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |

*උපලේඛනය III*

*අන්තරාදායක හා අප්‍රසන්න ව්‍යාපාර :*

| | | | |
|---|---|---|---|
| 01. භෝජනාගාර/භෝජනශාලා/හෝටල් (සාමාන්‍ය) | 500 0 | 750 0 | 1,000 0 |
| 02. තේ හා කෝපි කඩ | 500 0 | 750 0 | 1,000 0 |
| 03. ලැඟුම්හල්/නවාතැන් පොළවල් | 500 0 | 750 0 | 1,000 0 |
| 04. බාබර් සාප්පුව | 500 0 | 750 0 | 1,000 0 |
| 05. මස්/මාළු විකිණීම | 500 0 | 750 0 | 1,000 0 |
| 06. ශීතකළ මස්, මාළු විකිණීම (නීත්‍යානුකූලව විධිමත් පරිදි ඇසුරුම් කරන ලද) | 500 0 | 750 0 | 1,000 0 |
| 07. එළවළු විකිණීම | 500 0 | 750 0 | 1,000 0 |
| 08. පළතුරු විකිණීම | 500 0 | 750 0 | 1,000 0 |
| 09. බත් කඩ | 500 0 | 750 0 | 1,000 0 |
| 10. ඇඳුම් මැසීමේ ස්ථාන පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 11. පොල්තෙල් හා වෙනත් ආහාර සඳහා අවශ්‍ය තෙල් ගබඩා කිරීම/අලෙවි කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 12. සංචාරක වෙළඳාම | 500 0 | 750 0 | 1,000 0 |
| 13. කඩල, රටකජු විකිණීම | 500 0 | 750 0 | 1,000 0 |
| 14. බුලත්විට, තැඹිලි විකිණීම | 500 0 | 750 0 | 1,000 0 |
| 15. අයිස්ක්‍රීම් විකිණීම | 500 0 | 750 0 | 1,000 0 |
| 16. ගෘහ භාණ්ඩ අලෙවි (ලී/වානේ) | 500 0 | 750 0 | 1,000 0 |
| 17. සහල් වෙළඳාම් කරන ස්ථාන | 500 0 | 750 0 | 1,000 0 |
| 18. සිංහල බෙහෙත් අලෙවිසැලක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |

| | *I වැනි තීරය* *බලය දෙනු ලබන කාර්යය* | *II වැනි තීරය* *පරිශ්‍රයෙහි වාර්ෂික වටිනාකම* | | |
|---|---|---|---|---|
| | | *රු. 750 නොඉක්මවන අවස්ථාවක* | *රු. 750 ඉක්මවන එහෙත් රු. 1,500 නොඉක්මවන අවස්ථාවක* | *රු. 1,500 ඉක්මවන අවස්ථාවක* |
| | | *රු. ශත* | *රු. ශත* | *රු. ශත* |
| 19. | ඉංග්‍රීසි බෙහෙත් අලෙවිසැලක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 20. | සිල්ලර බඩු අලෙවිසැල් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 21. | තේ කුඩු ගබඩා කිරීමේ හා විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 22. | ලොන්ඩරියක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 23. | වතුර බෝතල් පිරවීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 24. | යන්ත්‍ර භාවිතා නොකර ගෘහ භාණ්ඩ නිපදවීමේ ස්ථානයක් පවත්වාගෙන යාම (වඩුමඩු) | 500 0 | 750 0 | 1,000 0 |
| 25. | ගුවන් විදුලි යන්ත්‍ර, ටේප් රෙකෝඩර්, ටෙලිවිෂන් යන්ත්‍ර වෙළඳාම සඳහා ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 26. | සාප්පු බඩු වෙළඳාම් කරන ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 27. | රෙදි පිළි සාප්පුවක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 28. | සම් භාණ්ඩ වෙළඳාම් කරන ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 29. | මෝටර් රථ, මෝටර් බයිසිකල් අමතර කොටස් අලෙවි කරන ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 30. | මනාලියන් හැඩගැන්වීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 31. | රේඩියෝ අමතර කොටස් අලෙවි කරන ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 32. | පාවහන් වෙළඳාම් කරන ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 33. | ස්වර්ණාභරණ වෙළඳාම් කරන ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 34. | බයිසිකල් වෙළඳාම් කරන ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 35. | ලිපි ද්‍රව්‍ය වෙළඳසැලක්/පොත් සාප්පුවක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 36. | බේකරියක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 37. | කිරිහලක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 38. | දුම්කොළ/පුවක්/බුලත් වෙළඳාම් කරන ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 39. | විදුලි උපකරණ විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 40. | පින්තූර රාමු කරන ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 41. | ඇස් කණ්නාඩි වෙළඳාම් කරන ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 42. | ගොඩනැගිලි ද්‍රව්‍ය වෙළඳාම් කරන ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 43. | පුවත්පත්, සඟරා ආදිය වෙළඳාම් කරන ස්ථානයක් පවත්වාගෙන යාම (හාඩ්වෙයාර්) | 500 0 | 750 0 | 1,000 0 |
| 44. | මසා පිළියෙල කළ ඇඳුම් විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 45. | ක්‍රීඩා භාණ්ඩ අලෙවි කරන ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 46. | සෙල්ලම් බඩු අලෙවි කරන ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 47. | ඔරලෝසු වෙළඳාම් කරන ස්ථානයක් හා අළුත්වැඩියා කරන ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 48. | පටිගත කිරීමේ හා තැටිගත කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 49. | මල් පැළ හා මල් විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 50. | ඔසු පැන්හලක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 51. | වීඩියෝ දර්ශන පට කුළියට දීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 52. | කුළු බඩු විකුණන ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 53. | කුළු බඩු වර්ග පැකට් කර විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 54. | සීනි බෝල/ටොෆි/චොක්ලට් පැකට් කර විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 55. | ටයර් විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 56. | පාපැදි විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 57. | ප්ලාස්ටික් බඩු වෙළඳාම් කරන ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 58. | ප්‍රවෘත්ති පත්‍ර හෝ සඟරා විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |

| | *I වැනි තීරය* *බලය දෙනු ලබන කාර්යය* | *II වැනි තීරය* *පරිශ්‍රයෙහි වාර්ෂික වටිනාකම* | | |
|---|---|---|---|---|
| | | *රු. 750 නොඉක්මවන අවස්ථාවක* | *රු. 750 ඉක්මවන එහෙත් රු. 1,500 නොඉක්මවන අවස්ථාවක* | *රු. 1,500 ඉක්මවන අවස්ථාවක* |
| | | *රු. ශත* | *රු. ශත* | *රු. ශත* |
| 59. | රසකැවිලි නිෂ්පාදන/රසකැවිලි අලෙවි කරන ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 60. | පෞද්ගලික දන්ත සායනයක්, දත් බඳින ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 61. | විදුලි බලයෙන් ක්‍රියාකරන මුද්‍රණාලයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 62. | පින්තූර රාමු කරන ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 63. | ලී වෙළඳසැලක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 64. | විදුලි යන්ත්‍ර හෝ රේඩියෝ අළුත්වැඩියා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 65. | තීන්ත හෝ වාර්නිෂ් ගබඩා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 66. | තෙල් මෝලක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 67. | අම්ලකර පැස්සීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 68. | මෝටර් වාහන සර්විස් කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 69. | අළුත් හෝ පරණ ලෝහ ගබඩා කිරීම | 500 0 | 750 0 | 1,000 0 |
| 70. | ටින් කෑම, කිරි ආහාර වෙළඳාම් කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 71. | ඇසිඩ් වර්ග නිපදවීම හා ගබඩා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 72. | ගිනිකෙළි භාණ්ඩ හා රතිඤ්ඤා විකිණීම සඳහා ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 73. | විද්‍යුත් ලෝහාලේපනය කිරීම හෝ ක්‍රෝමියම් ලෝහාලේපනය කිරීම, රන් රිදී ලෝහාලේපනය කිරීමට යන්ත්‍ර බලයෙන් ක්‍රියා කරන ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 74. | යාන්ත්‍රික බලයෙන් ක්‍රියාකරන ටයර්, ටියුබ් අළුත්වැඩියා කරන ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 75. | ලියුම් කවර නිෂ්පාදනය කරන ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 76. | මෝටර් රථ, විදුලි උපකරණ අළුත්වැඩියා කරන ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 77. | ඔරලෝසු අළුත්වැඩියා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 78. | දැන්වීම් පුවරු සකස් කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 79. | ඇඹරුම්හලක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 80. | අශ්ව බල 5-20 අතර වී මෝලක්, ඇඹරුම්හලක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 81. | අශ්ව බල 20ට අධික වී මෝලක්, ඇඹරුම්හලක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 82. | බැටරි චාජ් කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 83. | ලියවන පට්ටල් භාවිතා කරන ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 84. | මෝටර් වාහන සඳහා බෝඩි සාදන ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 85. | ඉටිපන්දම් නිෂ්පාදනය කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 86. | ගෑස් ගබඩා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 87. | දැව ගබඩා කිරීමේ හා වෙළඳාම් කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |

10-1256/4

---

**දැරණියගල ප්‍රාදේශීය සභාව**

2017 වර්ෂය සඳහා වාහන හා සතුන් පිළිබඳ බදු පැනවීම

දැරණියගල ප්‍රාදේශීය සභාවේ ලේකම් වන එම්. එල්. ඩී. ඉන්ද්‍රානි මඩවල වන මා විසින් 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9.3 වගන්තිය සමග කියවිය යුතු එම පනතේ 147 වැනි වගන්තිය හා 148 වැනි වගන්තිය ප්‍රකාරව දැරණියගල ප්‍රාදේශීය සභාවේ

බලතල, කාර්යය, කර්තව්‍ය ක්‍රියාත්මක කරන නිලධාරි වශයෙන් 2017 වර්ෂයට අදාළ වාහන හා සතුන් පිළිබඳ බදු පැනවීම සම්බන්ධයෙන් පහත සඳහන් තීරණය වර්ෂ 2016ක් වූ සැප්තැම්බර් මස 19 වැනි දින තීරණ අංක 276 යටතේ ගන්නට යෙදුණු බව මෙයින් නිවේදනය කරමි.

එම්. එල්. ඩී. ඉන්ද්‍රානි මඩවල,
ලේකම්,
බලතල, කාර්යය, කර්තව්‍ය
ක්‍රියාත්මක කරන නිලධාරි,
දැරණියගල ප්‍රාදේශීය සභාව.

2016ක් වූ සැප්තැම්බර් මස 30 වැනි දින,
දැරණියගල ප්‍රාදේශීය සභාව,
දැරණියගල.

**තීරණය**

දැරණියගල ප්‍රාදේශීය සභාවේ බලතල ක්‍රියාත්මක කරන, කාර්යය, කර්තව්‍ය ඉටුකරන, දැරණියගල ප්‍රාදේශීය සභාවේ ලේකම් වන එම්. එල්. ඩී. ඉන්ද්‍රානි මඩවල වන මා විසින් 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9.3 වගන්තිය සමග කියවිය යුතු එම පනතේ 147 වැනි වගන්තිය හා 148 වැනි වගන්තියෙහි විධිවිධාන ප්‍රකාරව පහත උපලේඛනයෙහි දැක්වෙන ආකාරයට වාහන හා සතුන් පිළිබඳ වාර්ෂික බද්දක් දැරණියගල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය සඳහා 2017 වර්ෂයට අදාළව නියම කර අය කිරීමට තීරණය කරමි. එනම්,

***ඉහත කී උපලේඛනය***

| | රු. ශත |
|---|---|
| මෝටර් රථයක්, මෝටර් කාරයක්, මෝටර් ලොරියක්, මෝටර් බයිසිකලයක්, කරත්තයක්, ජින් රික්ෂෝවක්, බයිසිකලයක් හෝ ට්‍රයිසිකලයක් නොවන සෑම වාහනයක් සඳහා ගාස්තුව | 25 0 |
| සෑම බයිසිකලයක් හෝ ට්‍රයිසිකලයක් හෝ බයිසිකල් කාරයක් හෝ කරත්තයක් සඳහා : | |
| (අ) වෙළෙඳ කාර්යයන් සඳහා යොදවන්නේ නම් | 18 0 |
| (ආ) වෙළෙඳ කාර්ය නොවන කාර්යයන් සඳහා යොදවන්නේ නම් | 4 0 |
| සෑම කරත්තයක් සඳහා | 20 0 |
| සෑම අත් කරත්තයක් සඳහා | 10 0 |
| සෑම රික්ෂෝවක් සඳහා | 7 50 |
| සෑම අශ්වයෙකු හෝ පෝනියෙකු හෝ කොටළුවෙකු සඳහා | 15 0 |
| සෑම ඇතෙකු සඳහා | 50 0 |

විශ්කම්භය අඟල් 26 නොඉක්මවන රෝද ඇති ළමා වාහන, වීල්බැරෝ, හුදෙක් පෞද්ගලික ස්ථානවල පමණක් වෙළෙඳ කාර්ය සඳහා යොදවන අත් කරත්ත සහ වෙළෙඳ කාර්යය සඳහා නොයොදවන අත් කරත්ත මෙකී ගෙවීමෙන් නිදහස් කෙරේ.

(මෙම උපලේඛනයේ "වෙළඳ කාර්යය" යන්නට විකිණීම සඳහා හෝ අන්‍යාකාරයකින් හෝ යම් වෙළඳ ව්‍යාපාරයක් නැතහොත් කර්මාන්තයක් සඳහා වූ යම් ද්‍රව්‍ය හෝ බඩු හෝ යම් ලිඛිත නැතහොත් මුද්‍රිත ද්‍රව්‍ය ගෙන යාම හෝ ප්‍රවාහනය කිරීම ඇතුළත් වේ.)

10-1256/3

---

**දැරණියගල ප්‍රාදේශීය සභාව**

2017 වර්ෂයට අදාළ අක්කර බදු පැනවීම

දැරණියගල ප්‍රාදේශීය සභාවේ ලේකම් වන එම්. එල්. ඩී. ඉන්ද්‍රානි මඩවල වන මා විසින් 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9.3 වගන්තිය සමග කියවිය යුතු එම පනතේ 134 වැනි වගන්තිය ප්‍රකාරව දැරණියගල ප්‍රාදේශීය සභාවේ බලතල, කාර්යය, කර්තව්‍ය

ක්‍රියාත්මක කරන නිලධාරි වශයෙන් 2017 වර්ෂයට අදාළ අක්කර බදු පැනවීම සම්බන්ධයෙන් පහත සඳහන් තීරණය වර්ෂ 2016ක් වූ සැප්තැම්බර් මස 19 වැනි දින තීරණ අංක 275 යටතේ ගන්නට යෙදුණු බව මෙයින් නිවේදනය කරමි.

එම්. එල්. ඩී. ඉන්ද්‍රානි මඩවල,
ලේකම්,
බලතල, කාර්යය, කර්තව්‍ය
ක්‍රියාත්මක කරන නිලධාරි,
දැරණියගල ප්‍රාදේශීය සභාව.

2016 සැප්තැම්බර් මස 30 වැනි දින,
දැරණියගල ප්‍රාදේශීය සභාව,
දැරණියගල.

**තීරණය**

දැරණියගල ප්‍රාදේශීය සභාවේ බලතල ක්‍රියාත්මක කරන, කාර්යය, කර්තව්‍ය ඉටුකරන දැරණියගල ප්‍රාදේශීය සභාවේ ලේකම් වන එම්. එල්. ඩී. ඉන්ද්‍රානි මඩවල වන මා විසින් 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9.3 වගන්තිය සමග කියවිය යුතු එම පනතේ 134 වැනි වගන්තියෙහි විධිවිධාන ප්‍රකාරව දැරණියගල ප්‍රාදේශීය සභා සීමා ඇතුළත පිහිටියා වූ ද, ස්ථිර හෝ නිතිපතා ගොවිතැනක් යටතේ වූ ද එක් එක් ඉඩම් හෙක්ටයාර් එකක් මත පහත දක්වා ඇති අනුප්‍රමාණ නොඉක්මවන අක්කර බද්දක් අමාත්‍යවරයාගේ අනුමැතියට යටත්ව නියම කිරීම හා අයකිරීම කළ යුතුය.

තව ද, ඉහත කී පනතේ 134 වැනි වගන්තියෙහි සඳහන් විධිවිධාන අනුව පළාත් පාලන විෂයය භාර අමාත්‍යවරයා විසින් අක්කර බද්ද නියම කිරීමේ හා අයකිරීමේ කාර්යය සඳහා විශේෂ ප්‍රදේශයක් වශයෙන් සලකනු ලබන බව අංක 4 ආ කොටස හා 1989.03.10 දිනැති *ගැසට් පත්‍රයේ* ප්‍රකාශයට පත් කර ඇති නියමයට ඇතුළත් දැරණියගල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ ස්ථිර හා නිතිපතා ගොවිතැන් යටතේ සෑම ඉඩමක් වෙනුවෙන්ම, එකී ඉඩමේ විශාලත්ව මත පහත දක්වා ඇති පරිදි 2017 වර්ෂයට රුපියල් 50.00 බැගින් වන වාර්ෂික අක්කර බද්දක් පනවා අය කිරීමට තීරණය කරමි.

තව ද, 2017 වර්ෂයෙහි පහත උපලේඛනයෙහි සඳහන් එක් එක් කාර්තුව වෙනුවෙන් ඉදිරියෙන් නිරූපිත දිනයට පෙර එසේ නියම කරන ලද වාර්ෂික අක්කර බද්ද දැරණියගල ප්‍රාදේශීය සභා අරමුදලට ගෙවිය යුතු බවටත්, එලෙස වාර්ෂික අක්කර බද්ද 2017 වර්ෂයෙහි ජනවාරි මස 31 වැනි දින හෝ ඊට ප්‍රථම ගෙවන්නේ නම් වාර්ෂික අක්කර බද්දේ ප්‍රමාණයෙන් සියයට දහයක (10%) වට්ටමක් ද, එකී උපලේඛනයෙහි එක් එක් කාර්තුව ඉදිරියේ තුන්වන තීරුවේ නිරූපිත දිනයට පෙර අදාළ අක්කර බදු මුදල දැරණියගල ප්‍රාදේශීය සභා අරමුදලට ගෙවනු ලබන්නේ නම් එක කාර්තුවකට අදාළ මුදලින් 5%ක වට්ටමක් ද, දැරණියගල ප්‍රාදේශීය සභාව විසින් ලබා දිය යුතු බවටත් 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9.3 වගන්තිය ප්‍රකාරව මම තීරණය කරමි.

***උපලේඛනය***

| *කාර්තුව* | *ගෙවිය යුතු දිනය* | *5% වට්ටම සඳහා හිමිකම් ලබන අවසාන දිනය* |
|---|---|---|
| පළමු වන කාර්තුව | 2017.01.01 - 2017.03.31 | 2017.01.31 |
| දෙවන කාර්තුව | 2017.04.01 - 2017.06.30 | 2017.04.30 |
| තුන්වන කාර්තුව | 2017.07.01 - 2017.09.30 | 2017.07.30 |
| හතරවන කාර්තුව | 2017.10.01 - 2017.12.31 | 2017.10.31 |

10-1256/2

---

**දැරණියගල ප්‍රාදේශීය සභාව**

2017 වර්ෂය සඳහා වරිපනම් බදු පැනවීම

දැරණියගල ප්‍රාදේශීය සභාවේ ලේකම් වන එම්. එල්. ඩී. ඉන්ද්‍රානි මඩවල වන මා විසින් 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9.3 වගන්තිය සමඟ කියවිය යුතු එම පනතේ 134 (1) වැනි වගන්තිය ප්‍රකාරව දැරණියගල ප්‍රාදේශීය සභාවේ බලතල, කාර්යය, කර්තව්‍ය

ක්‍රියාත්මක කරන නිලධාරි වශයෙන් 2017 වර්ෂයට අදාළ වරිපනම් පැනවීම සම්බන්ධයෙන් පහත සඳහන් තීරණය වර්ෂ 2016ක් වූ සැප්තැම්බර් මස 19 වැනි දින තීරණ අංක 274 යටතේ ගන්නට යෙදුණු බව මෙයින් නිවේදනය කරමි.

එම්. එල්. ඩී. ඉන්ද්‍රානි මඩවල,
ලේකම්,
බලතල, කාර්යය, කර්තව්‍ය
ක්‍රියාත්මක කරන නිලධාරි,
දැරණියගල ප්‍රාදේශීය සභාව.

2016 සැප්තැම්බර් මස 30 වැනි දින,
දැරණියගල ප්‍රාදේශීය සභාව,
දැරණියගල.

**තීරණය**

දැරණියගල ප්‍රාදේශීය සභාවේ බලතල ක්‍රියාත්මක කරන, කාර්යය, කර්තව්‍ය ඉටුකරන දැරණියගල ප්‍රාදේශීය සභාවේ ලේකම් වන එම්. එල්. ඩී. ඉන්ද්‍රානි මඩවල වන මා විසින් 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9.3 වගන්තිය සමඟ කියවිය යුතු එම පනතේ 134 (1) වැනි වගන්තියෙහි විධිවිධාන ප්‍රකාරව දැරණියගල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය සඳහා 2017 වර්ෂයට අදාළව වරිපනම් බදු නියම කිරීම පහත සඳහන් ආකාරයට විය යුතු බවට තීරණය කරමි. එනම්,

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 146 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තිය යටතේ දැරණියගල ප්‍රාදේශීය සභාව වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ දියුණු කළ ප්‍රදේශ යැයි ප්‍රකාශයට පත්කර ඇත්තා වූ ප්‍රදේශය ඇතුළත පිහිටියා වූ නිවාසවල, ගොඩනැගිලිවල, ඉඩම්වල, ගෙපත්වල වාර්ෂික වටිනාකම සඳහා 2016 වර්ෂය සඳහා වූ තක්සේරුව/සත්‍යෝක්ෂණය 2017 වර්ෂය සඳහා තක්සේරුව/සත්‍යෝක්ෂණය ලෙස සම්මත කළ යුතු බවටත්, එකී තක්සේරුව මත 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9.3 වගන්තිය සමඟ කියවිය යුතු 134 (1) වැනි උපවගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර දැරණියගල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය දියුණු කළ ප්‍රදේශයක්/ප්‍රදේශ ලෙස පහත පළවන උපලේඛනයේ දක්වා ඇති බල ප්‍රදේශයේ සෑම නිශ්චල දේපලක් මතම සියයට දහයක (10%) වාර්ෂික වරිපනම් බද්දක් නියම විය යුතු බවටත්,

තව ද, 2017 වර්ෂයෙහි දෙවන උපලේඛනයෙහි සඳහන් එක් එක් කාර්තුව වෙනුවෙන් ඉදිරියෙන් නිරූපිත දිනයට පෙර එසේ නියම කරන ලද වාර්ෂික වරිපනම් බද්ද ප්‍රාදේශීය සභා අරමුදලට ගෙවිය යුතු බවටත්, එලෙස වාර්ෂික වරිපනම් බද්ද 2017 වර්ෂයෙහි ජනවාරි මස 31 වැනි දින හෝ ඊට ප්‍රථම ගෙවන්නේ නම් වාර්ෂික වර්පනම් බද්දේ ප්‍රමාණයෙන් සියයට දහයක (10%) වට්ටමක්ද, එකී උපලේඛනයෙහි එක් එක් කාර්තුව ඉදිරියේ තුන්වන තීරුවේ නිරූපිත දිනයට පෙර අදාළ වරිපනම් බදු මුදල ප්‍රාදේශීය සභා අරමුදලට ගෙවනු ලබන්නේ නම් එක කාර්තුවට අදාළ මුදලින් සියයට පහ (5%ක) වට්ටමක් ද ප්‍රාදේශීය සභාව ලබා දිය යුතු බවටත් තීරණය කරමි.

***පළවන උපලේඛනය***

| *බද්දට යටත් වන ප්‍රදේශය* | *දේපළ බද්ද* | *කසළ බද්ද* |
|---|---|---|
| 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 134 (1) වගන්තිය ප්‍රකාර කෑගල්ල ප්‍රාදේශීය පළාත් පාලන සහකාර කොමසාරිස්ගේ අංක සී/4 හා 1968.07.01 දිනැති ලිපියෙන් අනුමත කළ පහත සඳහන් දියුණු ප්‍රදේශ | | |
| 1. **දැරණියගල නගර ප්‍රදේශ** | | |
| දෙහිඕවිට නුරි පාරේ සැ. 8/9 බෝක්කුවේ සිට 10/3 බෝක්කුව දක්වා පාරේ මැද සිට දෙපසට දම්වැල් 3 බැගින් වූ ප්‍රදේශ | 6% | 4% |
| 2. **විදුහල් ප්‍රදේශ** | | |
| දෙහිඕවිට දැරණියගල ප්‍රසිද්ධ පාරේ විදුහල් හන්දියෙන් කි.මී. 14/1 දරන බෝක්කුව අසල සිට දැරණියගල ළිහිණියගල පාරේ 10 වැනි විදුලි කණුව දක්වා වූ දම්වැල් 38 දිග අඩි 16ක් දුරට එකී පාරේ මැද සිට දෙපසට දම්වැල් 3 බැගින් වූ ප්‍රදේශය තුළ | 6% | 4% |

| | *බද්දට යටත් වන ප්‍රදේශය* | *දේපළ බද්ද* | *කසළ බද්ද* |
|---|---|---|---|
| 3. | **බෝතොට පාර ප්‍රදේශය** | | |
| | දෙහිඕවිට ප්‍රසිද්ධ පාරේ කි.මී. 14/3 හා 14/4 දරන බෝක්කුව අතරින් ආරම්භ බෝතොට පොදු සුසාන භූමිය දක්වා වූ පාරේ දම්වැල් 9යි, අඩි 30ක් දුරට හා එම පාරේ මැද සිට දෙපසට දම්වැල් 3 බැගින් වූ ප්‍රදේශය තුළ | 6% | 4% |
| 4. | **මියනවිට පාර** | | |
| | දැරණියගල මියනවිට පාර ආරම්භයේ සිට 1/2 බෝක්කුව දක්වා (දේවාල අසල පාලම) මැද සිට දම්වැල් 03 බැගින් | 6% | 4% |
| 5. | **සිරිවර්ධන මාවත** | | |
| | දැරණියගල සිරිවර්ධන මාවතේ ආරම්භයේ සිට එම පාරේ මැද සිට දෙපසට දම්වැල් 03 බැගින් වූ ප්‍රදේශය තුළ | 6% | 4% |

***දෙවන උපලේඛනය***

| *කාර්තුව* | *ගෙවිය යුතු දිනය* | *5% වට්ටම සඳහා හිමිකම් ලබන අවසාන දිනය* |
|---|---|---|
| පළමු වන කාර්තුව | 2017.01.01 - 2017.03.31 | 2017.01.31 |
| දෙවන කාර්තුව | 2017.04.01 - 2017.06.30 | 2017.04.30 |
| තුන්වන කාර්තුව | 2017.07.01 - 2017.09.30 | 2017.07.30 |
| හතරවන කාර්තුව | 2017.10.01 - 2017.12.31 | 2017.10.31 |

10-1256/1

---

**ඇඹිලිපිටිය නගර සභාව**

2017 වර්ෂයට අදාළව වරිපනම් බදු පැනවීම

නගර සභා ආඥපනතේ 184(අ) වගන්තියට අනුව මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව ඇඹිලිපිටිය නගර සභාවේ ලේකම් අනුලා වඩුගේ වන ම විසින් නගර සභා ආඥපනතේ 184(අ) සමග කියවිය යුතු එම පනතේ 160 වගන්තියේ විධිවිධාන ප්‍රකාරව 2017 වර්ෂයට අදළව වරිපනම් බදු පැනවීම සම්බන්ධයෙන් පහත සඳහන් තීරණය වර්ෂ 2016ක් වූ ඔක්තෝබර් මස 10 වැනි දින තීරණ අංක 488 යටතේ ගන්නට යෙදුන බව මෙයින් නිවේදනය කරමි.

අනුලා වඩුගේ,
ලේකම්,
ඇඹිලිපිටිය නගර සභාව.

2016 ඔක්තෝබර් මස 10 වැනි දින,
ඇඹිලිපිටිය නගර සභා කාර්යාලයේ දී ය.

**යෝජනාව**

ඇඹිලිපිටිය නගර සභාවේ ලේකම් අනුලා වඩුගේ වන මම නගර සභා ආඥපනතේ 184(අ) වගන්තිය සමග කියවිය යුතු එම පනතේ 160(1) වගන්තියෙහි විධිවිධාන ප්‍රකාරව ඇඹිලිපිටිය නගර සභා බල ප්‍රදේශය සඳහා 2017 වර්ෂයට අදළව වරිපනම් බදු නියම කිරීම පහත සඳහන් ආකාරයට විය යුතු බවට මම තීරණය කරමි. එනම්,

නගර සභා ආඥපනතේ 166 වන වගන්තියේ (1) වන උපවගන්තිය යටතේ ඇඹිලිපිටිය නගර සභාව වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව නාගරික ප්‍රදේශය ඇතුළත පිහිටියා වූ නිවාසවල, ගොඩනැගිලිවල, ඉඩම්වල, ගෙපත්වල් වාර්ෂික වටිනාකම සඳහා 2016 වර්ෂය සඳහා වූ තක්සේරුව 2017 වර්ෂය සඳහා තක්සේරුව ලෙස සම්මත කළ යුතු බවටත්, එකී තක්සේරුව මත නගර සභා ආඥපනතේ 160(1) උපවගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර එකී දේපළ ඉහත කී තක්සේරුව සඳහා වාර්ෂික වටිනාකමින් 5%වාර්ෂික වරිපනම් බද්දක් නියම විය යුතු බවටත්,

තව ද, 2017 වර්ෂයෙහි පහත උපලේඛනයෙහි සඳහන් එක් එක් කාර්තුව වෙනුවෙන් ඉදිරියෙන් නිරූපිත දිනයට පෙර එසේ නියම කරන ලද වාර්ෂික වරිපනම් බද්ද නගර සභා අරමුදලට ගෙවිය යුතු බවටත් , එලෙස වාර්ෂික වරිපනම් බද්ද 2017 එම වර්ෂයෙහි ජනවාරි මස 31 වන දින හෝ ඊට ප්‍රථම ගෙවන්නේ නම් වාර්ෂික වරිපනම් බද්දේ ප්‍රමාණයෙන් සියයට 10%ක වට්ටමක් ද එකී උපලේඛනයෙහි එක් එක් කාර්තුව ඉදිරියේ තුන්වන තීරුවේ නිරූපිත දිනට පෙර අදළ වරිපනම් බදු මුදල නගර සභා අරමුදලට ගෙවනු ලබන්නේ නම් එක කාර්තුවකට අදළ මුදලින් 5%ක වට්ටමක් ද නගර සභාවට ලබාදිය යුතු බවටත් තීරණය කරමි.

*උපලේඛනය*

| *කාර්තුව* | *ගෙවිය යුතු දිනය* | *5% වට්ටම සඳහා හිමිකම් ලබන අවසාන දිනය* |
|---|---|---|
| පළමුවන කාර්තුව | 2017.03.31 | 2017.01.31 |
| දෙවන කාර්තුව | 2017.06.30 | 2017.04.30 |
| තුන්වන කාර්තුව | 2017.09.30 | 2017.07.31 |
| හතරවන කාර්තුව | 2017.12.31 | 2017.10.31 |

10-1730/1

---

**ඇඹිලිපිටිය නගර සභාව**

2017 වර්ෂයට අදාළ බලපත්‍ර ගාස්තු පැනවීම

නගර සභා ආඥපනතේ 184(අ) වගන්තියට අනුව මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව ඇඹිලිපිටිය නගර සභාවේ ලේකම් අනුලා වඩුගේ වන ම විසින් නගර සභා ආඥපනතේ 184(අ) සමග කියවිය යුතු එම පනතේ 164(1) වගන්තියේ විධිවිධාන ප්‍රකාරව ඇඹිලිපිටිය නගර සභා බල ප්‍රදේශය සඳහා 2017 වර්ෂයට අදළව බලපත්‍ර ගාස්තු පැනවීම සම්බන්ධයෙන් පහත සඳහන් තීරණය වර්ෂ 2016ක් වූ ඔක්තෝබර් මස 10 වැනි දින තීරණ අංක 489 යටතේ ගන්නට යෙදුන බව මෙයින් නිවේදනය කරමි.

අනුලා වඩුගේ,
ලේකම්,
ඇඹිලිපිටිය නගර සභාව.

2016 ඔක්තෝබර් මස 10 වැනි දින,
ඇඹිලිපිටිය නගර සභා කාර්යාලයේ දී ය.

**යෝජනාව**

නගර සභා ආඥපනතේ 184(අ) වගන්තිය යටතේ මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව ඇඹිලිපිටිය නගර සභා බල ප්‍රදේශය සඳහා 2017 වර්ෂයට අදළව බලපත්‍ර ගාස්තු නියම කිරීම පහත සඳහන් ආකාරයට විය යුතු බවට මම තීරණය කරමි. එනම්,

නගර සභා ආඥපනතේ 184(අ) වගන්තිය යටතේ මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර එකී පනතේ හෝ එකී පනත යටතේ සාදන ලද අතුරු ව්‍යවස්ථාවක විස්තර කර ඇති මෙහි පහත උපලේඛනයෙහි පළවන තීරුවේ නිරූපිත යම් කාර්යයක් සඳහා ඇඹිලිපිටිය නගර සභා ප්‍රදේශය ඇතුළත යම් ස්ථානයක් හෝ පරිශ්‍රයක් පාවිච්චි කිරීමට බලය දෙමින් 2017 වර්ෂයේ නිකුත් කරනු ලබන යම් බලපත්‍රයක් සම්බන්ධයෙන් එම උපලේඛනයේ 11 තීරුවේ අනුරූප සටහනේ නිරූපිත බලපත්‍ර ගාස්තුවක් 2017 වර්ෂය සඳහා නියම විය යුතු බවට ද,

තව ද, එකී ස්ථානය හෝ පරිශ්‍රය 1968 අංක 14 දරන සංචාරක මණ්ඩල පනතේ කාර්ය සඳහා සංචාරක මණ්ඩලයේ අනුමත කර ඇති පිළිගෙන ඇති හෝටලයක්, ආපන ශාලාවක්, නවාතැන්පොළක් වන විටදී ඊට අදාළ බලපත්‍ර ලබාදීමේ දී එම ස්ථානයේ හෝ පරිශ්‍රයේ 2016 වර්ෂයේ ලැබීම්වලින් 1%ක බලපත්‍ර ගාස්තුව ලෙස 2017 වර්ෂය සඳහා නියම විය යුතු බවටත් මම තීරණය කරමි.

*උපලේඛනය*

| *I වැනි තීරුව* *ව්‍යාපාරය* | *II වැනි තීරුව* *පරිශ්‍රයෙහි වාර්ෂික වටිනාකම* | | |
|---|---|---|---|
| | *රු. 750 නොඉක්මවන අවස්ථාවක* | *රු. 750 ඉක්මවන එහෙත් රු.1,500 නොඉක්මවන අවස්ථාවක* | *රු. 1,500 ඉක්මවන අවස්ථාවක* |
| | *රු. ශත* | *රු. ශත* | *රු. ශත* |
| 1. බේකරි | 500 0 | 750 0 | 1,000 0 |
| 2. බත්කඩ | 500 0 | 750 0 | 1,000 0 |
| 3. තේ හෝ කෝපි කඩ | 500 0 | 750 0 | 1,000 0 |
| 4. හෝටල් | 500 0 | 750 0 | 1,000 0 |
| 5. ලැගුම්හල් | 500 0 | 750 0 | 1,000 0 |
| 6. බාබර් සාප්පු | 500 0 | 750 0 | 1,000 0 |
| 7. මාළු විකිණීම | 500 0 | 750 0 | 1,000 0 |
| 8. කිරි පට්ටියක් හෝ කිරි විකිණීම | 500 0 | 750 0 | 1,000 0 |
| 9. මස් විකිණීම | 500 0 | 750 0 | 1,000 0 |
| ***අන්තරායදායක වෙළෙඳාම :*** | | | |
| 11. පිටි හෝ තුනපහ වර්ග කෙටීම | 500 0 | 750 0 | 1,000 0 |
| 12. ලී මෝලක් හෝ දැව ගබඩා කිරීම | 500 0 | 750 0 | 1,000 0 |
| 13. කි. ග්‍රෑ. 250ට වැඩියෙන් තීන්ත වර්ග හෝ වාර්නිෂ් ගබඩා කිරීම | 500 0 | 750 0 | 1,000 0 |
| 14. යාන්ත්‍රික බලය භාවිතා කරන මුද්‍රණාලයක් | 500 0 | 750 0 | 1,000 0 |
| 15. යතුරු පැදි, පාපැදි, ත්‍රීරෝද රථ අලුත්වැඩියා කිරීම | 500 0 | 750 0 | 1,000 0 |
| 16. රූපලාවන්‍යාගාර | 500 0 | 750 0 | 1,000 0 |
| 17. විදුලි උපකරණ අළුත් වැඩියාව | 500 0 | 750 0 | 1,000 0 |
| 18. සිගරට් | 500 0 | 750 0 | 1,000 0 |
| 19. බුලත්/පුවක්/දුම්කොළ | 500 0 | 750 0 | 1,000 0 |
| 20. ඉංග්‍රීසි බෙහෙත් ශාලා | 500 0 | 750 0 | 1,000 0 |
| 21. සිංහල බෙහෙත් ශාලා | 500 0 | 750 0 | 1,000 0 |
| 22. කෘෂි රසායන ද්‍රව්‍ය | 500 0 | 750 0 | 1,000 0 |
| ***අප්‍රසන්න වෙළෙඳාම :*** | | | |
| 23. ටියුබ් හෝ ටයර් වොල්කනයිස් කිරීම | 500 0 | 750 0 | 1,000 0 |
| 24. මිනී පෙට්ටි නිෂ්පාදනය හෝ ගබඩා කිරීම | 500 0 | 750 0 | 1,000 0 |
| 25. දැව භාණ්ඩ නිෂ්පාදනය හෝ ගබඩා කිරීම | 500 0 | 750 0 | 1,000 0 |
| 27. ලොන්ඩ්‍රියක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 29. කුකුළු ගොවිපොළක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 30. කුෂන් වැඩපොල | 500 0 | 750 0 | 1,000 0 |
| ***අන්තරායදායක හා අප්‍රසන්න වෙළෙඳාම :*** | | | |
| 31. වෙල්ඩින් වැඩපොල | 500 0 | 750 0 | 1,000 0 |
| 32. ලියවන පට්ටලයක් | 500 0 | 750 0 | 1,000 0 |

| *I වැනි තීරුව*<br>*ව්‍යාපාරය* | *II වැනි තීරුව*<br>*පරිශ්‍රයෙහි වාර්ෂික වටිනාකම* | | |
|---|---|---|---|
| | *රු. 750 නොඉක්මවන අවස්ථාවක* | *රු. 750 ඉක්මවන එහෙත් රු.1,500 නොඉක්මවන අවස්ථාවක* | *රු. 1,500 0 ඉක්මවන අවස්ථාවක* |
| | *රු. ශත* | *රු. ශත* | *රු. ශත* |
| 33. වාහන සේවා ස්ථාන | 500 0 | 750 0 | 1,000 0 |
| 34. මෝටර් රථ වාහන අලුත්වැඩියා කරන ස්ථාන | 500 0 | 750 0 | 1,000 0 |
| 35. ඉන්ධන ගබඩා කිරීමේ මධ්‍යස්ථාන | 500 0 | 750 0 | 1,000 0 |
| 36. කි. ග්‍රෑ. 50ට වැඩි ඕනෑම වර්ගයක ප්ලාස්ටික් භාණ්ඩ තබා ගැනීමේ ස්ථාන | 500 0 | 750 0 | 1,000 0 |
| 37. ගෑස් සිලින්ඩර් ගබඩා කිරීම | 500 0 | 750 0 | 1,000 0 |

10-1730/2

---

**ඇඹිලිපිටිය නගර සභාව**

2017 වර්ෂයට අදාළව ප්‍රචාරක දැන්වීම්/දෘශ්‍ය පරිසරය පිළිබඳ ගාස්තු පැනවීම

නගර සභා ආඥාපනතේ 184(අ) වගන්තියට අනුව මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව ඇඹිලිපිටිය නගර සභාවේ ලේකම් අනුලා වඩුගේ වන මවිසින් නගර සභා ආඥාපනතේ 184(අ) සමඟ කියවිය යුතු එම පනතේ 162 වගන්තිය හා 1952 අංක 6 දරන පළාත් පාලන ආයතන (සම්මත අතුරු ව්‍යවස්ථා) පනතේ 2 වන වගන්තිය යටතේ පැවරී ඇති බලතල ප්‍රකාර පළාත් පාලන විෂයභාර අමාත්‍යවරයා විසින් සාදන ලද හා ඇඹිලිපිටිය නගර සභාව විසින් වැළඳගෙන ක්‍රියාත්මක කළ යුතු බව සම්මත කළ නගර සභා සම්මත අතුරු ව්‍යවස්ථාවන්වල XXXII වැනි කාණ්ඩය හෙවත් ප්‍රචාරක දැන්වීම් පිළිබඳ අතුරු ව්‍යවස්ථාවේ 3(1) වගන්තියේ විධිවධාන ප්‍රකාරව ඇඹිලිපිටිය නගර සභා බල ප්‍රදේශය තුළ ඇඹිලිපිටිය නගර සභාවේ ලේකම් වශයෙන් 2017 වර්ෂයට අදාළව ප්‍රචාරක දැන්වීම්/දෘශ්‍ය පරිසරය පිළිබඳ ගාස්තු පැනවීම සම්බන්ධයෙන් පහත සඳහන් තීරණය වර්ෂ 2016ක් වූ ඔක්තෝබර් මස 10 දින තීරණ අංක 492 යටතේ ගන්නට යෙදුන බව මෙයින් නිවේදනය කරමි.

අනුලා වඩුගේ,
ලේකම්,
ඇඹිලිපිටිය නගර සභාව.

2016 ඔක්තෝබර් මස 10 වැනි දින,
ඇඹිලිපිටිය නගර සභා කාර්යාලයේ දී ය.

**යෝජනාව**

ඇඹිලිපිටිය නගර සභාවේ ලේකම් අනුලා වඩුගේ වන මම නගර සභා ආඥාපනතේ 184(අ) වගන්තිය සමඟ කියවිය යුතු 162 වගන්තිය හා 1952 අංක 6 දරන පළාත් පාලන ආයතන (සම්මත අතුරු ව්‍යවස්ථා) පනතේ 2 වැනි වගන්තිය යටතේ පැවරී ඇති බලතල ප්‍රකාර පළාත් පාලන විෂයභාර අමාත්‍යවරයා විසින් සාදන ලද හා ඇඹිලිපිටිය නගර සභාව විසින් වැළඳගෙන ක්‍රියාත්මක කළ යුතු බව සම්මත කළ නගර සභා සම්මත අතුරු ව්‍යවස්ථාවන්වල XXXII වැනි කාණ්ඩය හෙවත් ප්‍රචාරක දැන්වීම් පිළිබඳ අතුරු ව්‍යවස්ථාවේ 3(1) වගන්තියේ විධිවිධාන ප්‍රකාරව පහත උපලේඛනයෙහි දක්වෙන ආකාරයට ප්‍රචාරක දැන්වීම්/දෘශ්‍ය පරිසරය පිළිබඳ ගාස්තු පැනවීම ඇඹිලිපිටිය නගර සභා බල ප්‍රදේශය සඳහා 2017 වර්ෂයට අදළව නියම කර අය කිරීමට මම තීරණය කරමි. එනම්,

***උපලේඛනය***

1. ස්ථිර දැන්වීම් පුවරුවක් සඳහා වර්ග අඩියක් රු. 75.00 (වසරකට)
2. බැනර් කටවුට් සඳහා වර්ග අඩියක් රු. 35.00 (මසකට)

10-1730/5

**ඇඹිලිපිටිය නගර සභාව**

2017 වර්ෂයට අදාළව වාහන හා සතුන් පිළිබඳ බදු පැනවීම

නගර සභා ආඥාපනතේ 184(අ) වගන්තියට අනුව මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව ඇඹිලිපිටිය නගර සභාවේ ලේකම් වන අනුලා වඩුගේ වන මවිසින් නගර සභා ආඥාපනතේ 184(අ) සමඟ කියවිය යුතු එම පනතේ 162 හා 163 වගන්තිවල විධිවිධාන ප්‍රකාරව ඇඹිලිපිටිය නගර සභා බල ප්‍රදේශය සඳහා ලේකම් වශයෙන් 2017 වර්ෂයට අදාළව වාහන හා සතුන් පිළිබඳ බදු පැනවීම සම්බන්ධයෙන් පහත සඳහන් තීරණය වර්ෂ 2016ක් වූ ඔක්තෝබර් මස 10 දින තීරණ අංක 493 යටතේ ගන්නට යෙදුන බව මෙයින් නිවේදනය කරමි.

අනුලා වඩුගේ,
ලේකම්,
ඇඹිලිපිටිය නගර සභාව.

2016 ඔක්තෝබර් මස 10 වැනි දින,
ඇඹිලිපිටිය නගර සභා කාර්යාලයේ දී ය.

**යෝජනාව**

ඇඹිලිපිටිය නගර සභාවේ බලතල ක්‍රියාත්මක කරන කාර්ය කර්තව්‍ය ඉටු කරන ඇඹිලිපිටිය නගර සභාවේ ලේකම් අනුලා වඩුගේ වන මම නගර සභා ආඥා පනතේ 184(අ) වගන්තිය සමඟ කියවිය යුතු 162 වන වගන්තිය හා 163 වන වගන්තියෙහි විධිවිධාන ප්‍රකාරව පහත උපලේඛනයෙහි දැක්වෙන ආකාරයට වාහන හා සතුන් පිළිබඳ වාර්ෂික බද්දක් ඇඹිලිපිටිය නගර සභා බල ප්‍රදේශය සඳහා 2017 වර්ෂයට අදාළව නියම කර අය කිරීමට මම තීරණය කරමි. එනම්,

***ඉහත කී උපලේඛනය***

| | රු. ශ. |
|---|---|
| මෝටර් රථයක්, මෝටර් කාරයක්, මෝටර් ලොරියක්, මෝටර් බයිසිකලයක්, කරත්තයක්, ජින් රික්ෂෝවක්, බයිසිකලයක් හෝ ට්‍රයිසිකලයක් හෝ ට්‍රයිසිකලයක් නොවන සෑම වාහනයක් සඳහා කාර්තුව සෑම ට්‍රයිසිකලයක් හෝ බයිසිකලයක් හෝ බයිසිකලයක් හෝ බයිසිකල් කාරයක් හෝ කරත්තයක් සඳහා- | 25 0 |
| (අ) එය වෙළඳ කාර්ය සඳහා යොදවන්නේ නම් | 18 0 |
| (ආ) එය වෙළඳ කාර්ය නොවන කාර්යය සඳහා යොදවන්නේ නම් | 04 0 |
| සෑම කරත්තයක් සඳහා | 20 0 |
| සෑම අත් කරත්තයක් සඳහා | 10 0 |
| සෑම රික්ෂෝවක් සඳහා | 7 0 |
| සෑම අශ්වයකු, පෝනියකු හෝ කොටළුවකු සඳහා | 15 0 |
| සෑම ඇතෙකු සඳහා | 50 0 |

විෂ්කම්භය අගල් 26 නොඉක්මවන රෝද ඇති ළමා වාහන, විල්බැරෝ හුදෙක් පෞද්ගලික ස්ථානවල පමණක් වෙළෙඳ කාර්යය සඳහා යොදවන අත් කරත්ත සහ වෙළඳ කාර්යය සඳහා නොයොදවන අත්කරත්ත මෙකී ගෙවීමෙන් නිදහස් කෙරේ.

10-1730/6

---

**ඇඹිලිපිටිය නගර සභාව**

2017 වර්ෂයට අදාළව ව්‍යාපාර බදු පැනවීම

නගර සභා ආඥාපනතේ 184(අ) වගන්තියට අනුව මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව ඇඹිලිපිටිය නගර සභාවේ ලේකම් අනුලා වඩුගේ වන මවිසින් නගර සභා ආඥාපනතේ 184(අ) සමඟ කියවිය යුතු එම පනතේ 165 ආ (1) වගන්තියේ විධිවිධාන ප්‍රකාරව

ඇඹිලිපිටිය නගර සභා බල ප්‍රදේශය සඳහා 2017 වර්ෂයට අදාලව ව්‍යාපාර බදු පැනවීම සම්බන්ධයෙන් පහත සඳහන් තීරණය වර්ෂ 2016ක් වූ ඔක්තෝබර් මස 10 වැනි දින තීරණ අංක 491 යටතේ ගන්නට යෙදුන බව මෙයින් නිවේදනය කරමි.

අනුලා වඩුගේ,
ලේකම්,
ඇඹිලිපිටිය නගර සභාව.

2016 ඔක්තෝබර් මස 10 වැනි දින,
ඇඹිලිපිටිය නගර සභා කාර්යාලයේ දී ය.

**යෝජනාව**

"ඇඹිලිපිටිය නගර සභාවේ ලේකම් අනුලා වඩුගේ වන මම නගර සභා ආඥා පනතේ 184(අ) වගන්තියෙහි විධිවිධාන ප්‍රකාරව ඇඹිලිපිටිය නගර සභා බල ප්‍රදේශය සඳහා 2017 වර්ෂයට අදාලව ව්‍යාපාර බදු නියම කිරීම පහත සඳහන් ආකාරයට විය යුතු බවට මම තීරණය කරමි. එනම්,

නගර සභා ආඥාපනතේ 165 ආ (1) වැනි උපවගන්තිය යටතේ ඇඹිලිපිටිය නගර සභාව වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව එකී පනතේ හෝ ඒ යටතේ සාදන ලද අතුරු ව්‍යවස්ථාවක විධිවිධාන යටතේ බලපත්‍රයක් ලබා ගැනීම හෝ එම පනත යටතේ යම් බද්දක් ගෙවීම අවශ්‍ය නොවන්නා වූ යම් ව්‍යාපාරයක් ඇඹිලිපිටිය නගර සභා බල ප්‍රදේශය ඇතුළත 2017 වර්ෂයේ දී පවත්වාගෙන යන සෑම තැනැත්තෙකුගෙන්ම එම ව්‍යාපාරයේ 2016 වර්ෂයේ ආදායම මෙහි පහත උපලේඛනයෙහි I වැනි තීරුවේ නිරූපිත යම් විෂයාංක සීමාවන් ඇතුලත පවතින අවස්ථාවක එකී II තීරුවේ අනුරූප සටහනේ නිරූපිත අනු ප්‍රමාණයක ව්‍යාපාර බද්දක් 2017 වර්ෂය සඳහා නියම විය යුතු බවට මම තීරණය කරමි.

***උපලේඛනය***

| *I වැනි තීරුව*<br>*2016 වර්ෂයේ දී ව්‍යාපාරයේ ආදායම* | *II වැනි තීරුව*<br>*ගෙවිය යුතු බද්ද*<br>*රු. ශත* |
|---|---|
| 1. රු. 6,000 නොඉක්මවන විට | නැත |
| 2. රු. 6,000 ඉක්මවන නමුත් රු. 12,000 නොඉක්මවන විට | 90 0 |
| 3. රු. 12,000 ඉක්මවන නමුත් රු. 18,750 නොඉක්මවන විට | 180 0 |
| 4. රු. 18,750 ඉක්මවන නමුත් රු. 75,000 නොඉක්මවන විට | 360 0 |
| 5. රු. 75,000 ඉක්මවන නමුත් රු. 1,50,000 නොඉක්මවන විට | 1,200 0 |
| 6. රු. 1,50,000 ඉක්මවන විට | 3,000 0 |

10-1730/4

---

**පල්ලේපොල ප්‍රාදේශීය සභාව**

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ අංක 152(2) වැනි උපවගන්තිය යටතේ ඇතැම් වෙළඳ ව්‍යාපාර හා වෘත්තීන් සඳහා බදු අය කිරීම.

2017 වර්ෂය

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනත යටතේ සාදන ලද යම් අතුරු ව්‍යවස්ථාවක විධිවිධාන යටතේ යම් බලපත්‍ර ගාස්තුවක් හෝ 150 වැනි වගන්තිය යටතේ යම් බද්දක් ගෙවීමට අවශ්‍ය නොවන්නාවූ ව්‍යාපාර හෝ වෘත්තීන් සම්බන්ධයෙන් එකී ව්‍යාපාරයේ හෝ වෘත්තියේ බද්ද ගෙවිය යුතු වර්ෂයට පෙර වර්ෂයේ ආදායම අනුව නියම කරන පහත දක්වෙන බදු ප්‍රමාණයන් 2017 වර්ෂය සඳහා ගෙවිය

යුතු බවට 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ අංක 9(03) අනුව මා හට පැවරී ඇති බලතල ප්‍රකාරව 2016.08.22 දින තීරණ අංක 91 යටතේ තීරණය කර ඇති බව දනුම් දෙනු ලැබේ.

යූ. එච්. ආර්. කේ. කපුකොටුව,
ලේකම්,
ප්‍රාදේශීය සභාව,
පල්ලේපොල.

**ව්‍යාපාර බද්ද**

*යෝජනාව*

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 152 වන වගන්තියේ -

*(අ)* (1) වන උප වගන්තියෙන් පැවරී ඇති බලතල ප්‍රකාර පල්ලේපොල ප්‍රාදේශීය සභා ප්‍රදේශය තුළ මෙහි පහත උපලේඛනයේ 1 වන කොටසේ නිරූපිත යම් ව්‍යාපාරයක් 2017 වර්ෂයේ දී පවත්වාගෙන යනු ලබන සෑම තැනැත්තෙකු මත එකී ව්‍යාපාරයේ 2017 වර්ෂයේ ආදායම දෙවන කොටසේ (1) වන තීරයේ නිරූපිත යම් සීමාවක් ඇතුළත පවත්නා අවස්ථාවක දෙවන තීරයේ අනුරූප සටහනේ නිරූපිත අනු ප්‍රමාණ අනුව වූ බද්දක් පනවා අයකිරීමට ; සහ

*(ආ)* (2) වන උපලේඛනයෙන් පැවරී ඇති බලතල ප්‍රකාර බද්ද යටතේ සෑම තැනැත්තෙකු විසින් කර්මාන්ත බද්ද 2017 අප්‍රේල් මස පළමුවන දිනට ප්‍රථම ප්‍රාදේශීය සභාවට ගෙවනු ලැබිය යුතු යැයි නියම කිරීමට පල්ලේපොල ප්‍රාදේශීය සභාව යෝජනා කරන්නීය.

***උපලේඛනය***

***පළමුවන කොටස***

**ව්‍යාපාරය**

01. තොග බඩු ගබඩා
02. ගෘහ භාණ්ඩ වෙළඳසැල්
03. ගොඩනැගිලි ද්‍රව්‍ය ගබඩා කිරීම විකිණීම
04. පුද්ගලික සති පොලක්
05. කුකුළු ගොවිපල (සතුන් 50ට වැඩි)
06. බැටළුවන් ඌරන් එළුවයන් ගොවිපල (සතුන් 10ට වැඩි)
07. තලාතු මිනිරන් (මයිකා) ශුද්ධ කිරීමේ ස්ථාන
08. කොහු මෝල්
09. යාන්ත්‍රික වී මෝල්
10. රියදුරු පුහුණු ආයතන
11. ආහාර තොග ගබඩාව
12. පරිගණක පුහුණු ආයතන
13. ව්‍යාපෘති උපදේශක ආයතන
14. උත්සව භාණ්ඩ කුලියට දීමේ ස්ථාන
15. වානේ ගෘහ භාණ්ඩ නිෂ්පාදනය
16. ප්‍රචාරක ආයතන
17. වාහන සේවා ස්ථාන
18. ලැගුම්හල්
19. භාණ්ඩ අපනයන මධ්‍යස්ථාන
20. මිනිස් ශ්‍රමබල සැපයුම් ස්ථාන
21. වාහන අලෙවිකරන ස්ථාන (යතුරු පැදි ඇතුලුව)
22. විදේශ රැකියා නියෝජිත ආයතන
23. දේශීය හා විදේශීය වන්දනා චාරිකා සංවිධාන ආයතන
24. උකස් මධ්‍යස්ථාන
25. බැංකු /මුල්‍ය ආයතන
26. බඩු විකුණන ඒජන්තවරුන්

27. කොමිස් ඒජන්තවරු
28. කොන්ත්‍රාත්කරුවන්
29. කුලී රථ හිමියන්
30. ඉන්ධන පිරවුම් හල්
31. ගණන් පරීක්ෂකවරු ගණකාධිකාරිවරු
32. ගැස් ගබඩා
33. පෞද්ගලික පංති
34. බ්‍රෝකර්වරු
35. රටබීම හල්
36. යන්ත්‍රෝපකරණ බර වාහන කුලියට දෙන ස්ථාන
37. රක්ෂණ ආයතන
38. ලොතරැයි ආයතන
39. වෙන්දේසිකරුවන්
40. කර්මාන්ත ශාලා
41. දුරකථන සන්නිවේදන කුළුණු
42. යාන්ත්‍රික ලී මෝල් සහ ලී ගබඩා
43. සිමෙන්ති වැඩපල

**දෙවන කොටස**

| | 1 වැනි තීරය | 11 වැනි තීරය |
|---|---|---|
| | *2016 වර්ෂයේ දී ව්‍යාපාරයේ ආදායම* | *රු. ශත* |
| 1. | රු. 6,000 නොඉක්මවූ විට | කිසිවක් නැත |
| 2. | රු. 6,000 -රු. 12,000 අතර වන විට | 90 0 |
| 3. | රු. 12,000 -රු. 18,750 අතර වන විට | 180 0 |
| 4. | රු. 18,750 - රු. 75,000 අතර වන විට | 360 0 |
| 5. | රු. 75,000 - රු. 1,50,000 අතර වන විට | 1,200 0 |
| 6. | රු. 1,50,000 ඉක්මවන විට | 3,000 0 |

10-1251/6

---

**පල්ලේපොල ප්‍රාදේශීය සභාව**

2017 වර්ෂය සඳහා වරිපනම් බදු පැනවීම

පල්ලේපොල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ දියුණු ගම් ප්‍රදේශයක් වශයෙන් ප්‍රකාශයට පත් කර ඇති කොටසේ පිහිටි නිශ්චල දේපළ වලින් 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 134(1) වැනි වගන්තිය ප්‍රකාර වාර්ෂික වටිනාකමින් සියයට පහක (5) වරිපනම් බද්දක් 2017 වර්ෂය සඳහා පනවා 2017 මාර්තු 31, ජුනි 30, සැප්තැම්බර් 30 සහ දෙසැම්බර් 31වැනි දිනෙන් අවසන් වන අයුරු කාර්තු හතරකින් අය කර ගැනීමට හා එකී කාර්තුව අවසාන වීමට පෙර අවසාන බදු මුදල් ගෙවිය යුතු බවටත් 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ අංක 9(3) අනුව මා හට පැවරී ඇති බලතල ප්‍රකාරව 2016.08.22 දින තීරණ අංක 91 යටතේ තීරණය කර ඇති බව දැනුම් දෙනු ලැබේ.

තවද එකී පනතේ 134(7) වැනි වගන්තිය ප්‍රකාර වාර්ෂික බදු මුදල් පනතේ සඳහන් වන පරිදි සම්පූර්ණයෙන්ම ගෙවූ විට පහත දැක්වෙන පරිදි වට්ටම් ප්‍රදානය කරන බවට දැනුම් දෙනු ලැබේ.

2017 ජනවාරි මස 31 වැනි දින හෝ ඊට පෙර මුළු වර්ෂයටම ගෙවිය යුතු වරිපනම් බද්ද ගෙව්වහොත් එසේ ගෙවන මුදලින් සියයට දහයක් (10%),

බදු මුදල් කොටස් වශයෙන් ගෙවන විට වරිපනම් බද්ද ගෙවිය යුතු කාර්තුවේ පළමු මාසය තුළ ගෙව්වහොත් එසේ ගෙවන මුදලින් සියයට පහක් (5%),

තවද ඉහත පනවන ලද බද්ද නොගෙවන අවස්ථාවකදී ප්‍රාදේශීය සභා පනතේ 161 වැනි වගන්තිය ප්‍රකාර 10%ක වරෙන්තු ගාස්තුවක් අයකරන බවද නිවේදනය කරමි.

යූ. එච්. ආර්. කේ. කපුකොටුව,
ලේකම්,
ප්‍රාදේශීය සභාව - පල්ලේපොල.

10 - 1251/1

---

**පල්ලේපොල ප්‍රාදේශීය සභාව**

ප්‍රසිද්ධ රඟ දක්වීමේ ආඥපනත

(176 වැනි අධිකාරය) ප්‍රසිද්ධ රඟ දැක්වීමේ ආඥපනතේ 3 වැනි වගන්තිය ප්‍රකාර බලපත්‍ර ගාස්තු රු. 500ක් ද දර්ශන පැවැත්වෙන සෑම දිනයක් සඳහාම රු. 25 බැගින් වූ බලපත්‍ර ගාස්තුවක් 2017.01.01 දින සිට අයකළ යුතු බවට 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ අංක 9 (03) අනුව මා හට පැවරී ඇති බලතල ප්‍රකාරව 2016.08.22 දින තීරණ අංක 91 යටතේ තීරණය කර ඇති බව දැනුම් දෙනු ලැබේ.

10-1251/4

---

**පල්ලේපොල ප්‍රාදේශීය සභාව**

විනෝද බදු ආඥාපනත - 2017 වර්ෂය

විනෝද බදු ආඥා පනතේ 2 වැනි වගන්තිය යටතේ අලෙවි කරනු ලබන ටිකට් පත්වල මුළු වටිනාකමින් සියයට 10ක විනෝද බද්දක් අය කල යුතු බවට 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ අංක 9 (03) අනුව මා හට පැවරී ඇති බලතල ප්‍රකාරව 2016.08.22 දින තීරණ අංක 91 යටතේ තීරණය කර ඇති බව දැනුම් දෙනු ලැබේ.

යූ. එච්. ආර්. කේ. කපුකොටුව,
ලේකම්
ප්‍රාදේශීය සභාව,
පල්ලේපොල.

10-1251/5

---

**පල්ලේපොල ප්‍රාදේශීය සභාව**

බදු අය කිරීම - 2017 වර්ෂය

පල්ලේපොල ප්‍රාදේශීය සභාව පහත සඳහන් සේවාවන් සඳහා ගාස්තු අය කිරීමට 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9 (03) අනුව මා හට පැවරී ඇති බලතල ප්‍රකාරව 2016.08.22 දින තීරණ අංක 91 යටතේ තීරණය කර ඇති බව දැනුම් දෙනු ලැබේ. මෙම ගාස්තුව අයකිරීම 2017.01.01 දින සිට ක්‍රියාත්මක කරනු ලැබේ.

යූ. එච්. ආර්. කේ. කපුකොටුව,
ලේකම්
ප්‍රාදේශීය සභාව,
පල්ලේපොල.

| | | රු. ශ. |
|---|---|---|
| 01. | විරී රේඛා සහ නොපවරා ගැනීමේ සහතික නිකුත් කිරීම | 750 0 |
| 02. | ගොඩනැගිලි සහතික නිකුත් කිරීම (ගම්බද) | 1,000 0 |
| | ගොඩනැගිලි සහතික නිකුත් කිරීම (නගරබද) | 2,000 0 |
| 03. | උධෘත සාරාංශ පෝරම | 25 0 |
| 04. | යකඩ පුටු කුලියට දීම (එක් පුටුවකට දිනකට) | 5 0 |
| 05. | ගොඩනැගිලි සඳහා වර්ග ප්‍රමාණයට අය කිරීම | |
| | ගම්බද ප්‍රදේශය වර්ග අඩි 01 ක් සඳහා | 2 0 |
| | නගරබද වර්ග අඩි 1ක් සඳහා | 5 0 |
| 06. | ජල අයදුම්පත් | 100 0 |
| 07. | ඉහල මාලය කුලියට දීම (එක් දිනකට) | 1,200 0 |
| 08. | බැනර් ප්‍රදර්ශනය සඳහා අයකිරීම | |
| | I. තාවකාලික දැන්වීම් පුවරු වර්ග අඩි 01 ට | 35 0 |
| | II. ස්ථාවර දැන්වීම් පුවරු (වර්ෂයකට ) | |
| | වර්ග අඩි 30 දක්වා (වර්ග අඩි 01ට ) | 75 0 |
| | වර්ග අඩි 30ට වැඩි (වර්ග අඩි 01ට) | 75 0 |
| | ප්‍රදීපන දැන්වීම් පුවරු (වර්ග අඩි 01ට) | 90 0 |
| 09. | ගොඩනැගිලි සහතික කාලය දීර්ඝ කිරීම / | 350 0 |
| 10. | අනුකූලතා සහතික නිකුත් කිරීම | 500 0 |
| 11. | අනුබෙදුම අනුමත කිරීමේ ගාස්තු | 500 0 |
| 12. | තාවකාලික ප්‍රවාහන බලපත්‍ර මසකට | 1,000 0 |
| 13. | ටෙන්ඩර් පෝරම - රු. 5,00,000 දක්වා | 400 0 |
| | රු. 5,00,000 ට වැඩි | 1,500 0 |
| 14. | ඉඩම් කට්ටි කිරීමේ දී පරීක්ෂා කිරීමේ ගාස්තු (කට්ටියකට) | 500 0 |
| 15. | නල ලිං තැන්පත් වර්ෂයකට | 500 0 |
| 16. | ප්ලාස්ටික් ටැංකිය කුලියට දීම | 200 0 |
| 17. | ජලය විකිණීම ලීටර් 1000ක් | 500 0 |
| 18. | පුස්තකාල තැන්පත් | 100 0 |
| | පුස්තකාල සාමාජික අලුත්කිරීම | 25 0 |
| 19. | ප්ලාස්ටික් පුටු 1කට | 10 0 |
| 20. | රථවාහන නැවතුම්පොලේ තාවකාලික වාහන නැවතුම් සඳහා | 50 0 |
| 21. | නගරයේ වාහන නැවතුම් සඳහා | 20 0 |
| 22. | රථ ගාල කුලියට දීම එක් දිනකට | 2,000 0 |
| 23. | බවුසරය කුලියට දීම (ජලය හා ප්‍රවාහනය සමඟ) | |
| | i. පල්ලේපොල නගර සීමාව තුළ | 3,000 0 |
| | ii. පල්ලේපොල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ | 3,500 0 |
| | iii. පල්ලේපොල බල ප්‍රදේශයෙන් පිටත වැඩිවන කි. මී. 1 කට | 200 0 |
| 24. | i. බැකෝ යන්ත්‍රයට මී. පැ. 1 ට | 2,500 0 |
| | ii. මාර්ග තලන යන්ත්‍රය මී. පැ. 1ට | 3,500 0 |
| | iii. (කොන්ක්‍රීට් මිශ්‍රණ යන්ත්‍රය දිනකට (පැය 8) | 3,500 0 |
| | iv. ලොරි රථය ඉන්ධන සමග දිනකට (පැය 8) | 6,750 0 |
| | * වැඩිවන සෑම පැය 1කටම | 800 0 |
| | * නවතා තැබීමට | 50 0 |
| | * පළමු කි. මී. 05 ඇතුළත | 1,500 0 |
| | * අතිරේක කි. මී. 1කට | 200 0 |
| | v. ටිපර් රථය | |
| | * ඉන්ධන සමඟ දිනකට (පැය 8) | 12,000 0 |
| | * අතිරේක පැයකට | 1,500 0 |
| | * නවතා තැබීමට | 50 0 |

| | | |
|---|---|---|
| | | *රු. ශ.* |
| * | පළමු කි. මී. 05 ඇතුළත | 3,000 0 |
| * | අතිරේක කි. මී. 1කට | 400 0 |
| vi. | ට්‍රැක්ටරය | |
| * | ඉන්ධන සමඟ දිනකට (පැය 8) | 6,500 0 |
| * | අතිරේක පැයකට | 800 0 |
| * | නවතා තැබීමට | 50 0 |
| * | පළමු කි. මී. 05 ඇතුළත | 1,000 0 |
| * | අතිරේක කි. මී. 1කට | 200 0 |
| vii. | වතුර පොම්පය | |
| * | ඉන්ධන සමඟ දිනකට (පැය 8) | 2,000 0 |
| * | අතිරේක පැයකට | 250 0 |
| 25. | ක්‍රීඩා පිටිය කුලියට දීම (එක් දිනකට) | 2,000 0 |
| 26. | වයිබ්‍රේටින් ගල්රෝල ඉන්ධන ඇතුලුව කම්පන සහිතව යන්ත්‍ර පැයකට | 4,500 0 |

10-1251/8

---

**පල්ලේපොල ප්‍රාදේශීය සභාව**

අන්තරාදායක හා අප්‍රසන්න වෙළඳ ව්‍යාපාර

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ 1988 අගෝස්තු මස 23 වැනි දින අංක 520/7 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයෙන්* ප්‍රකාශයට පත් කර ඇති අතර පළාත් පාලන සම්මත අතුරු ව්‍යවස්ථා මාලාවේ 21 වැනි කණ්ඩයේ 1 වැනි ඡේදයේ විධිවිධාන ප්‍රකාර පල්ලේපොල ප්‍රාදේශීය සභාව විසින් මෙහි පහත සඳහන් උපලේඛනයේ දැක්වෙන වෙළඳ ව්‍යාපාර අන්තරාදායක හා අප්‍රසන්න වෙළඳ ව්‍යාපාර වශයෙන් ප්‍රකාශයට පත් කිරීමටත්, එකී ව්‍යාපාර වලින් බදු හා බලපත්‍ර ගාස්තු අයකිරීමටත් 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ අංක 09 (03) අනුව මා හට පැවරී ඇති බලතල ප්‍රකාරව 2016.08.22 දින තීරණ අංක 91 යටතේ තීරණය කර ඇති බව දැනුම් දෙනු ලැබේ.

**උපලේඛනය**

*අන්තරාදායක ව්‍යාපාර* :

1. කඹුක්, බොරළු හෝ කළු ගල් තැනීම
2. කඹුක්, බොරළු හෝ කළුගල් ගබඩා කිරීම
3. ග්‍රොස් 1ට වැඩි ප්‍රමාණයක සිසිල් බීම බෝතල් ගබඩා කර තබා ගැනීම
4. කොප්පරා නිෂ්පාදනය කිරීම සකස් කිරීහ හෝ ගබඩා කර තබා ගැනීම
5. ගැලුම් 50ට වැඩි ප්‍රමාණයක පොල්තෙල් ගබඩා කර තබා ගැනීම
6. පොල්තෙල් හැර වෙනත් එළවළු තෙල් වර්ගයක ගැලුම් 12ට වැඩි ප්‍රමාණයක් ගබඩා කර තබා ගැනීම
7. ගඩොල් හෝ උළු ගබඩා කර තබා ගැනීම
8. තේ පෙට්ටි හෝ ලෑලි පෙට්ටි නිෂ්පාදනය කිරීම හෝ ගබඩා කර තබා ගැනීම
9. කොහු හෝ වෙනත් කෙඳි වර්ග නිපදවීම හෝ ගබඩා කර තබා ගැනීම
10. පාවිච්චි කළ ඇඳුම් ගබඩා කර තබා ගැනීම
11. කුළියට දීම සඳහා ලාම්පු ගබඩා කර තබා ගැනීම
12. ධාන්‍ය හෝ මාංශ බෝග හොණ්ඩර 5ට වැඩි ප්‍රමාණයක් ගබඩා කර තබා ගැනීම.
13. ස්වර්ණාභරණ නිෂ්පාදනය කිරීම හෝ අළුත්වැඩියා කිරීම

14. යන්ත්‍රෝපකරණ පාවිච්චි කෙරෙන ලී ඉරුම් මෝලක් පවත්වාගෙන යාම
15. අතින් ලී ඉරණ ඉරුම් මෝලක් පවත්වාගෙන යාම
16. දැව ගබඩාවක් පවත්වාගෙන යාම
17. දර ගබඩාවක් පවත්වාගෙන යාම
18. හිරිගල් හෝ හුණුගල් සඳහා හැරීම
19. යන්ත්‍රෝපකරණ පාවිච්චි කෙරෙන හෝ නොකෙරෙන කම්හලක් පවත්වාගෙන යාම
20. තොග වශයෙන් විකිණීම සඳහා පිටි, ලුණු හෝ සීනි හොන්ඩර කිසියම් ප්‍රමාණයක් ගබඩාකර තබා ගැනීම
21. හිස් බෝතල් හා හිස් ගෝනි ගබඩාකර තබා ගැනීම
22. බයිසිකල් හෝ මෝටර් බයිසිකල් අළුත්වැඩියා කිරීම සඳහා වැඩපලක් පවත්වාගෙන යාම
23. විසිරි පින්තාරු කිරීම (ස්ප්‍රේ පේන්ටින්) සඳහා ආයතනයක් පවත්වාගෙන යාම
24. මැසූ ඇඳුම් නිෂ්පාදනය
25. මුද්‍රණාලයක් පවත්වාගෙන යාම

## *II වැනි කොටස*

*අප්‍රසන්න ව්‍යාපාර :*

26. මිනිරන් ශුද්ධ කිරීම හෝ ගබඩාකර තබා ගැනීම
27. හම් පදම් කරන ස්ථානයක් පවත්වාගෙන යාම
28. හම් ගබඩාකර තබා ගැනීම
29. කුකුළන් 100 ට වැඩි ගණනක් සඳහා කුකුල් ගාලක් හෝ කුකුල් කොටුවක් පවත්වාගෙන යාම
30. බැටළුවන්, එළුවන් හෝ ඌරන් දහයකට වැඩි ගණනක් සඳහා හෝ ගාලක් පවත්වාගෙන යාම
31. පශු වෛද්‍ය ගිලන් හලක් පවත්වාගෙන යාම
32. පුවක් සකස් කිරීම හෝ ගබඩාකර තබා ගැනීම
33. තොග වශයෙන් විකිණීම සඳහා නරක් වන සුළු කෑම වර්ග ගබඩාකර තබා ගැනීම
34. කරවල, ලුණු, මාළු හෝ ජාඩි හොණ්ඩර 3ට වැඩි ප්‍රමාණයක් තබා ගැනීම
35. සිමෙන්ති හොණ්ඩර 25ට වැඩි ප්‍රමාණයක් ගබඩාකර තබා ගැනීම
36. දුම්කොල සකස් කිරීම හෝ ගබඩාකර තබා ගැනීම
37. සත්ත්ව ආහාර ගබඩාවක් පවත්වාගෙන යාම
38. පුන්නක්කු ටොන් 1ට වැඩි ප්‍රමාණයක් ගබඩාකර තබා ගැනීම
39. සබන් නිෂ්පාදනය කිරීම
40. ලෝහමය සුන්බුන් ද්‍රව්‍ය ගබඩාකර තබා ගැනීම
41. ගෘහ භාණ්ඩ නිපදවීම හෝ ගබඩාකර තබා ගැනීම
42. වඩු කර්මාන්ත ශාලාවක් පවත්වාගෙන යාම
43. කොන්ක්‍රීට් හෝ මැටි පයිප්ප ගබඩාකර තබා ගැනීම
44. සිරප් හෝ පළතුරු බීම වර්ග සෑදීම
45. රස කැවිලි වර්ග නිපදවීම
46. පොල් ලෙලි හෝ දැව පල් කිරීම සඳහා කොටුවක් පවත්වාගෙන යාම
47. රා එකතු කරන ස්ථානයක් පවත්වාගෙන යාම
48. හුණු ගල් හෝ හුණු ගබඩාකර තබා ගැනීම
49. පැණි නිපදවීම හෝ ගබඩාකර තබා ගැනීම
50. කොකෝවා හෝ වියලි පැපොල් කිරි ගබඩාකර තබා ගැනීම
51. කෝපි, ධාන්‍ය වර්ග, මාංශ බෝග, කුළු බඩු හෝ පිටි ඇඹරීම
52. යන්ත්‍රානුසාරයෙන් ධාන්‍ය වර්ග මාංශ බෝග කෙටීම
53. ටයර් හෝ ටියුබ් වෝල්කනයිස් කිරීම සඳහා ආයතනයක් පවත්වාගෙන යාම
54. සිමෙන්ති භාණ්ඩ හෝ ඇස්බැස්ටෝස් සිමෙන්ති භාණ්ඩ නිපදවීම
55. ගල් නිපදවීම, ඇඹරීම හෝ ඔප දැමීම
56. සෙල්ලම් බඩු නිපදවීම
57. ශීත කළ මස්, මාළු ගබඩාකර තැබීම
58. ඡායාරූප ශාලාවක් පවත්වාගෙන යාම
59. දියලුණු, සුදු(වයිටිං) හුණු හෝ හිරිගල් නිපදවීම
60. එනසාල් (කරදමුංගු) සකස් කිරීම හෝ වියලීම

***III* වැනි කොටස**

*අන්තරාදායක හා අප්‍රසන්න ව්‍යාපාර :*

61. තලාතු මිනිරන් ශුද්ධ කිරීම
62. ඩ්‍රයි ක්ලීන් කරන හෝ සායම් දමන ස්ථානයක් පවත්වාගෙන යාම
63. රෙදි මුද්‍රණය කරන හෝ සායම් දමන ආයතනයක් පවත්වාගෙන යාම
64. විද්‍යුත් ලෝහාලේපනය කරන ස්ථානයක් පවත්වාගෙන යාම
65. හුණු පිළිස්සීම හෝ සකස් කිරීම, ගබඩා කිරීම හෝ හුණු ගල් කැඩීම
66. ගිණි කෙලි භාණ්ඩ හෝ රතිඤ්ඤා විකිණීම සඳහා ස්ථානයක් පවත්වාගෙන යාම
67. බැටරි චාජ් කිරීම හෝ අළුත්වැඩියා කිරීම
68. වැල්ඩිං සඳහා ස්ථානයක් පවත්වාගෙන යාම
69. මෝටර් වාහන සර්විස් කිරීම හෝ අළුත්වැඩියා කිරීම සඳහා වැඩපලක් පවත්වාගෙන යාම
70. බෙලෙක් වැඩ පලක් පවත්වාගෙන යාම
71. ගල් ස්මාරක නිපදවීම
72. පෙට්‍රල්, ඩීසල් තෙල් හෝ වෙනත් ඛනිජ තෙල් වර්ගයක් ගබඩා කොට ඇති ස්ථානයක් පවත්වාගෙන යාම
73. පෙට්‍රල් නිකුත් කරන ස්ථානයක් පවත්වාගෙන යාම
74. කෘෂි රසායන ද්‍රව්‍ය නිපදවීම හෝ ගබඩා කර තබාගැනීම
75. වීදුරු භාණ්ඩ නිපදවීම
76. වීදුරු කැටපත් නිපදවීම
77. යකඩ, තඹ තහඩු ගැල්වනයිස් කිරීම
78. වායුසමනය කළ යන්ත්‍ර ශීතකරණ හෝ අධිශීතකරණ නිපදවීම සර්විස් කිරීම හෝ අළුත්වැඩියා කිරීම
79. රබර් කැවුණු කෙඳි වර්ග නිපදවීම
80. ඊයම් බැටරි චාජ් කිරීම සඳහා ස්ථානයක් පවත්වාගෙන යාම
81. විදුලි කර්මාන්ත වැඩපලක් හෝ ගුවන් විදුලි යන්ත්‍ර අළුත්වැඩියා කරන වැඩපලක් හෝ ගුවන් විදුලි යන්ත්‍ර නිපදවන වැඩපලක් පවත්වාගෙන යාම
82. පොහොර හෝ රසායනික පොහොර නිෂ්පාදනය කිරීම හෝ ගබඩා කර තැබීම

යූ. එච්. ආර්. කේ. කපුකොටුව,
ලේකම්
ප්‍රාදේශීය සභාව,
පල්ලේපොල.

10-1251/7

---

**පල්ලේපොල ප්‍රාදේශීය සභාව**

බලපත්‍ර ගාස්තු පැනවීම

**යෝජනාව**

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 149 වන වගන්තිය සමග කියවිය යුතු එකී පනතේ 147 වන වගන්තියේ (1) වන උපවගන්තියේ (ආ) ඡේදයෙන් පැවරී ඇති බලතල ප්‍රකාර, පල්ලේපොල ප්‍රාදේශීය සභා ප්‍රදේශය තුළ මෙහි උපලේඛනයේ 1 වන තීරයේ නිරූපිත යම් කර්මාන්තයක් 2017 වර්ෂයේ කරගෙන යාම සඳහා නිකුත් කරනු ලබන යම් බලපත්‍රයක් මත එම කර්මාන්තය කරගෙන යනු ලබන පරිශ්‍රයේ වාර්ෂික වටිනාකම 11 වන තීරයේ නිරූපිත යම් සීමාවක් ඇතුළත් වන අවස්ථාවක අනුරූප සටහනේ සඳහන් අනු ප්‍රමාණ අනුව වූ බලපත්‍ර ගාස්තුවක් පනවා අය කළ යුතු යැයි පල්ලේපොල ප්‍රාදේශීය සභාව යෝජනා කරන්නී ය.

*ව්‍යාපාර පිළිබඳ බදු හා බලපත්‍ර ගාස්තු*

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 147 හා 149 වැනි වගන්තිය යටතේ මෙහි පහත උපලේඛනයේ සඳහන් ව්‍යාපාරයක් සඳහා බද්දක් එම ව්‍යාපාරය කරගෙන යන ස්ථානයේ වාර්ෂික වටිනාකම අනුව 2017.01.01 දින සිට බලපත්‍ර ගාස්තුවක් අය කිරීමට 1987

අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ අංක 09(03) අනුව මාහට පැවරී ඇති බලතල ප්‍රකාරව, 2016.08.22 දින තීරණ අංක 91 යටතේ තීරණය කර ඇති බව දැනුම් දෙනු ලැබේ. උපලේඛනයේ සඳහන් බලපත්‍ර ගාස්තු 2017 මාර්තු 31 දිනට හෝ ඊට පෙර ගෙවිය යුතු බව ද දැනුම් දෙනු ලැබේ.

යූ. එච්. ආර්. කේ. කපුකොටුව,
ලේකම්,
ප්‍රාදේශීය සභාව,
පල්ලේපොල.

*උපලේඛනය*

| *I වැනි තීරය* | | *II වැනි තීරය* | | |
|---|---|---|---|---|
| | *කර්මාන්තය* | *පරිශ්‍රයේ වාර්ෂික වටිනාකම* | | |
| | | *රු. 750 දක්වා* | *රු. 750 සිට රු. 1,500 දක්වා* | *රු. 1,500 ට වැඩි* |
| | | *රු. ශත* | *රු. ශත* | *රු. ශත* |
| 01. | තේ කඩයක් පවත්වාගෙන යාම | 400 0 | 700 0 | 800 0 |
| 02. | හෝටලයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 03. | බේකරියක් සඳහා | 475 0 | 750 0 | 900 0 |
| 04. | ශීත කළ කුකුල් මස්, ඌරු මස්, එළු මස් කඩ | 475 0 | 750 0 | 1,000 0 |
| 05. | බාබර් සාප්පුවක් පවත්වාගෙන යාම | 450 0 | 700 0 | 900 0 |
| 06. | සමාජ ශාලාවක් පවත්වාගෙන යාම | 500 0 | 700 0 | 1,000 0 |
| 07. | ලොන්ඩරියක් පවත්වාගෙන යාම | 400 0 | 600 0 | 800 0 |
| 08. | මස් විකිණීමේ කඩයක් පවත්වාගෙන යාම | | | |
| | (1) ගව මස් කඩයක් | 500 0 | 700 0 | 1,000 0 |
| | (2) එළු මස් කඩයක් | 500 0 | 600 0 | 900 0 |
| | (3) කුකුල් මස් කඩයක් | 500 0 | 700 0 | 1,000 0 |
| 09. | සංචාරක වෙළඳාම සඳහා | 500 0 | 700 0 | 850 0 |
| 10. | මුහුදු මාළු, වැව් මාළු කඩයක් සඳහා | 500 0 | 700 0 | 850 0 |
| 11. | රූපලාවන්‍යාගාර සඳහා | 500 0 | 700 0 | 850 0 |
| 12. | රස කැවිලි නිෂ්පාදන කරන ස්ථාන සඳහා | 450 0 | 700 0 | 800 0 |

***කර්මාන්ත බදු පැනවීම***

*යෝජනාව*

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 150 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තියෙන් පැවරී ඇති බලතල ප්‍රකාර ;

*(අ)* පල්ලේපොල ප්‍රාදේශීය සභා ප්‍රදේශය තුළ 2017 වර්ෂයේ දී පවත්වාගෙන යනු ලබන මෙහි පහත උපලේඛනයේ I වැනි තීරයේ නිරූපිත යම් කර්මාන්තයක් සම්බන්ධයෙන් එම කර්මාන්තය කරගෙන යනු ලබන පරිශ්‍රයේ වාර්ෂික වටිනාකම එම උපලේඛනයේ II වැනි තීරයේ අනුරූප සටහනේ නිරූපිත අනු ප්‍රමාණ අනුව වූ කර්මාන්ත බද්දක් 2017 වර්ෂයේ දී පනවා අයකිරීමට ;

*(ආ)* 2016 වර්ෂයේ දෙසැම්බර් මස 31 වැනි දින පැවති යම් කර්මාන්තයක් සම්බන්ධයෙන් වූ විට යථෝක්ත බද්ද 2017 අප්‍රේල් මස පළමුවන දිනට ප්‍රථම කර්මාන්තය කරගෙන යනු ලබන තැනැත්තා විසින් ප්‍රාදේශීය සභාවට ගෙවනු ලැබිය යුතු යැයි විධාන කිරීමට පල්ලේපොල ප්‍රාදේශීය සභාව යෝජනා කරන්නී ය.

### උපලේඛනය

| *I වැනි තීරය* | | *II වැනි තීරය* | | |
|---|---|---|---|---|
| | *කර්මාන්තය* | *පරිශ්‍රයේ වාර්ෂික වටිනාකම* | | |
| | | *රු. 750 දක්වා රු. ශත* | *රු. 750 සිට රු. 1,500 දක්වා රු.ශත* | *රු. 1,500 ට වැඩි රු.ශත* |
| 01. | සිල්ලර කඩයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 02. | සාප්පු බඩු කඩයක් පවත්වාගෙන යාම | 400 0 | 700 0 | 900 0 |
| 03. | ඡායාරූප ශාලාවක් සඳහා | 450 0 | 700 0 | 850 0 |
| 04. | පළතුරු කඩයක් සඳහා | 400 0 | 600 0 | 800 0 |
| 05. | වඩු මඩුවක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 06. | එළවළු කඩයක් පවත්වාගෙන යාම | 400 0 | 600 0 | 800 0 |
| 07. | යකඩ කම්මලක් පවත්වාගෙන යාම | 450 0 | 600 0 | 850 0 |
| 08. | වී මෝලක් පවත්වාගෙන යාම (එච්. පී. 20 දක්වා) | 450 0 | 600 0 | 850 0 |
| 09. | බැටරි චාජ් කිරීමේ කර්මාන්තයක් පවත්වාගෙන යාම | 450 0 | 700 0 | 1,000 0 |
| 10. | කළුගල් වලක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 11. | මිරිස්, ධාන්‍ය ඇඹරුම් හලක් පවත්වාගෙන යාම | 500 0 | 700 0 | 900 0 |
| 12. | පාපැදි අලුත්වැඩියා කරන ස්ථානයක් සඳහා | 450 0 | 600 0 | 800 0 |
| 13. | බෙලෙක් වැඩපලක් පවත්වාගෙන යාම | 450 0 | 700 0 | 900 0 |
| 14. | හුණු ගබඩාවක් පවත්වාගෙන යාම | 450 0 | 700 0 | 900 0 |
| 15. | මෝටර් රථ අළුත්වැඩියා කිරීමේ ස්ථානයක් සඳහා | 450 0 | 700 0 | 1,000 0 |
| 16. | ලියවන පට්ටලයක් පවත්වාගෙන යාම | 450 0 | 700 0 | 1,000 0 |
| 17. | වෑල්ඩිං වැඩපලක් පවත්වාගෙන යාම | 450 0 | 700 0 | 1,000 0 |
| 18. | රෙදිපිළි සාප්පුවක් පවත්වාගෙන යාම | 450 0 | 600 0 | 800 0 |
| 19. | වෑල්ඩිං වැඩපලක් පවත්වාගෙන යාම | 450 0 | 700 0 | 1,000 0 |
| 20. | රෙදිපිළි සාප්පුවක් පවත්වාගෙන යාම | 450 0 | 600 0 | 880 0 |
| 21. | කෘෂිනාශක, රසායනික පොහොර කඩයක් සඳහා | 450 0 | 700 0 | 800 0 |
| 22. | දුම්කොළ උඳුනක් පවත්වාගෙන යාම | 450 0 | 700 0 | 1,000 0 |
| 23. | දුම්කොළ කුඩු වේලීමේ ස්ථානයක් සඳහා | 400 0 | 700 0 | 1,000 0 |
| 24. | පින්තූර රාමු කරන ස්ථානයක් සඳහා | 400 0 | 600 0 | 800 0 |
| 25. | පාසැල් උපකරණ හා පොත් සාප්පුවක් සඳහා | 400 0 | 700 0 | 900 0 |
| 26. | ඇඳුම් මැසීමේ ස්ථානයක් සඳහා | 450 0 | 750 0 | 1,000 0 |
| 27. | ඔර්ලෝසු අළුත්වැඩියා කිරීමේ ස්ථානයක් සඳහා | 450 0 | 700 0 | 900 0 |
| 28. | බුලත්, පුවක් කඩයක් පවත්වාගෙන යාම | 400 0 | 600 0 | 800 0 |
| 29. | කොප්පරා වේලන ස්ථානයක් සඳහා | 400 0 | 600 0 | 800 0 |
| 30. | සිමෙන්ති හො. 25ට වැඩි ගබඩාවක් සඳහා | 400 0 | 700 0 | 1,000 0 |
| 31. | කොකෝවා, වියළි පැපොල් කිරි ගබඩාවක් සඳහා | 400 0 | 700 0 | 1,000 0 |
| 32. | තැඹිලි, කුරුම්බා කඩයක් පවත්වාගෙන යාම | 400 0 | 600 0 | 800 0 |
| 33. | රූපවාහිනි, ගුවන් විදුලි යන්ත්‍ර අලුත්වැඩියා | 400 0 | 600 0 | 800 0 |
| 34. | සුරුට්ටු, බීඩි නිෂ්පාදනය කිරීම සඳහා | 400 0 | 550 0 | 750 0 |
| 35. | වළං කඩයක් පවත්වාගෙන යාම | 400 0 | 600 0 | 775 0 |
| 36. | ශබ්ද විකාශන යන්ත්‍ර අලුත්වැඩියාව | 450 0 | 600 0 | 800 0 |
| 37. | මහන මැෂින්, විදුලි ගෘහ උපකරණ සාප්පුවක් පවත්වාගෙන යාම | 400 0 | 700 0 | 900 0 |
| 38. | ග්‍රොසරියක් පවත්වාගෙන යාම | 450 0 | 600 0 | 800 0 |
| 39. | සමුපකාර ප්‍රාදේශිකයක් පවත්වාගෙන යාම | 450 0 | 750 0 | 1,000 0 |
| 40. | පොල් ලී මඩුවක් පවත්වාගෙන යාම | 450 0 | 700 0 | 1,000 0 |
| 41. | පාපැදි අමතර කොටස් අලෙවිසැල | 450 0 | 650 0 | 800 0 |
| 42. | යතුරුපැදි ත්‍රීරෝද රථ අමතර කොටස් වෙළඳ සැල සඳහා | 500 0 | 750 0 | 1,000 0 |
| 43. | යතුරුපැදි අළුත්වැඩියා කරන ස්ථානයක් සඳහා | 500 0 | 700 0 | 800 0 |

| | *I වැනි තීරය* | *II වැනි තීරය* | | |
|---|---|---|---|---|
| | *කර්මාන්තය* | *පරිශ්‍රයේ වාර්ෂික වටිනාකම* | | |
| | | *රු. 750 දක්වා රු. ශත* | *රු. 750 සිට රු. 1,500 දක්වා රු.ශත* | *රු. 1,500 ට වැඩි රු.ශත* |
| 44. | කුළු බඩු කඩයක් පවත්වාගෙන යාම | 500 0 | 700 0 | 1,000 0 |
| 45. | බීරළු කැටයම් කපන ස්ථානයක් සඳහා | 500 0 | 700 0 | 1,000 0 |
| 46. | රබර් වේලන උඳුනක් පවත්වාගෙන යාම | 500 0 | 700 0 | 1,000 0 |
| 47. | පොල්තෙල් මෝලක් පවත්වාගෙන යාම | 475 0 | 600 0 | 800 0 |
| 48. | හුණු පෝරණුවක් පවත්වාගෙන යාම | 500 0 | 700 0 | 1,000 0 |
| 49. | අයිස් ක්‍රීම් නිෂ්පාදනය කිරීම සඳහා | 500 0 | 700 0 | 1,000 0 |
| 50. | කුඹල් කර්මාන්තය සඳහා | 500 0 | 600 0 | 800 0 |
| 51. | ආයුර්වේද බෙහෙත් කඩයක් පවත්වාගෙන යාම | 500 0 | 700 0 | 900 0 |
| 52. | මිනී පෙට්ටි සෑදීම/ ගබඩා කිරීම සඳහා | 500 0 | 750 0 | 1,000 0 |
| 53. | අවමංගල මල් ශාලාවක් පවත්වාගෙන යාම සඳහා | 500 0 | 750 0 | 1,000 0 |
| 54. | ටෙලිකොමියුනිකේෂන් ආයතනයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 55. | කැසට් සීඩී වීසීඩී තැටි අලෙවි සැල සඳහා | 500 0 | 700 0 | 850 0 |
| 56. | සිමෙන්ති ආශ්‍රිත භාණ්ඩ නිෂ්පාදනය අලෙවිය සඳහා | 500 0 | 700 0 | 1,000 0 |
| 57. | ටයර් ටියුබ් කඩයක් සඳහා | 500 0 | 700 0 | 850 0 |
| 58. | ටයර් ටියුබ් කඩයක් සඳහා | 500 0 | 700 0 | 850 0 |
| 59. | ගඩොල් පෝරණුවක් පවත්වාගෙන යාම | 500 0 | 700 0 | 1,000 0 |
| 60. | තේ කුඩු පැකට් කර විකිණීම | 500 0 | 700 0 | 1,000 0 |
| 61. | නිවාස සැලසුම් ඇඳීම | 500 0 | 600 0 | 700 0 |
| 62. | කිරි මුදවීම, යෝගට් නිෂ්පාදනය සඳහා | 500 0 | 700 0 | 850 0 |
| 63. | කඩල, මුරුක්කු පැකට් කර විකිණීම | 500 0 | 700 0 | 800 0 |
| 64. | ඉදල් කොසු බුරුසු නිෂ්පාදනය | 500 0 | 700 0 | 850 0 |
| 65. | බිම්මල් වගාව සඳහා | 500 0 | 600 0 | 750 0 |
| 66. | ජොතිෂ්‍ය කටයුතු කරන ස්ථානයක් | 500 0 | 750 0 | 900 0 |
| 67. | සුරතල් මත්ස්‍යයින්/මාළු ටැංකි වෙළඳාම | 500 0 | 700 0 | 850 0 |
| 68. | මිරිදිය මත්ස්‍ය වගාව | 500 0 | 700 0 | 1,000 0 |
| 69. | ශිතකළ භාණ්ඩ වෙළඳාම | 500 0 | 700 0 | 1,000 0 |
| 70. | මුද්‍රණාලයක් පවත්වාගෙන යාම | 500 0 | 700 0 | 1,000 0 |
| 71. | දියලුණු පැකට් කරන ස්ථානයක් | 500 0 | 700 0 | 800 0 |
| 72. | හඳුන්කූරු නිෂ්පාදනය කිරීම | 500 0 | 700 0 | 1,000 0 |
| 73. | කෘෂි කාර්මික උපකරණ අලෙවිය | 500 0 | 700 0 | 1,000 0 |
| 74. | ජංගම දුරකථන කාඩ්පත් අලෙවිය | 500 0 | 750 0 | 1,000 0 |
| 75. | වීදුරු කඩයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 76. | පොල්, පුවක් කඩයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 77. | වාහන ශීට් කුෂන් වැඩපල | 500 0 | 750 0 | 1,000 0 |
| 78. | ශල්‍ය ගෝස් නිෂ්පාදනය | 500 0 | 750 0 | 1,000 0 |
| 79. | පෞද්ගලික ඉංග්‍රීසි වෛද්‍ය මධ්‍යස්ථාන | 500 0 | 750 0 | 1,000 0 |
| 80. | අයිස්ක්‍රීම යෝගට් වෙළඳාම | 500 0 | 600 0 | 800 0 |
| 81. | පාවහන් කඩය | 500 0 | 700 0 | 900 0 |
| 82. | ඡායා පිටපත් කඩය | 400 0 | 550 0 | 750 0 |
| 83. | කෘෂි පැල තවාන් | 500 0 | 750 0 | 1,000 0 |
| 84. | වාහන ස්ටිකර් ගැසීම | 500 0 | 600 0 | 800 0 |
| 85. | මහන මැෂින් අළුත්වැඩියාව | 500 0 | 700 0 | 1,000 0 |
| 86. | මිරිස් තුනපහ කුඩු පැකට් කර විකිණීම | 500 0 | 700 0 | 850 0 |
| 87. | පරණ යකඩ ගබඩාව | 500 0 | 650 0 | 900 0 |

| I වැනි තීරය | II වැනි තීරය | | |
|---|---|---|---|
| කර්මාන්තය | පරිශ්‍රයේ වාර්ෂික වටිනාකම | | |
| | රු. 750 දක්වා රු. ශත | රු. 750 සිට රු. 1,500 දක්වා රු.ශත | රු. 1,500 ට වැඩි රු.ශත |
| 88. කරවල කඩයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 89. වාහන පින්තාරු කිරීම | 500 0 | 750 0 | 1,000 0 |
| 90. කලායතනයක් පවත්වාගෙන යාම | 500 0 | 700 0 | 1,000 0 |
| 91. උඩරට මුල් ඇඳුම් සැපයීම | 500 0 | 700 0 | 1,000 0 |
| 92. මල්පැල තවාන් | 500 0 | 700 0 | 1,000 0 |

10-1251/10

---

**පල්ලේපොල ප්‍රාදේශීය සභාව**

2017 වර්ෂය සඳහා අක්කර බදු පැනවීම

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 134 (3) වැනි වගන්තිය ප්‍රකාර පල්ලේපොල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ වරිපනම් බදු අය කරනු නොලබන ප්‍රදේශවල පිහිටියා වූ ස්ථිර හෝ නිතිපතා ගොවිතැන් යටතේ වූ ද, හෙක්ටයාර් 05 සහ ඊට වැඩි ඉඩම්වලින් හෙක්ටයාර් 01ට රු. 10 බැගින් බද්දක් 2017 මාර්තු 31, ජුනි 30, සැප්තැම්බර් 30 සහ දෙසැම්බර් 31 වැනිදායින් අවසන් වන කාර්තු හතරකින් (4) අය කර ගැනීමට ද එකී කාර්තු අවසන් වීමට පෙර අදාළ බදු මුදල් ගෙවිය යුතු බවට ද, 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ අංක 9(03) අනුව මා හට පැවරී ඇති බලතල ප්‍රකාරව 2016.08.22 දින තීරණ අංක 91 යටතේ තීරණය කර ඇති බව දැනුම් දෙනු ලැබේ.

තව ද එකී පනතේ 124 (7) වැනි වගන්තිය ප්‍රකාර පහත සඳහන් පරිදි ගෙවූ විට එහි දැක්වෙන වට්ටම් මුදල් ප්‍රදානය කරනු ලබන බව ද දැනුම් දෙනු ලැබේ.

2017 ජනවාරි මස 31 වැනි දින හෝ ඊට පෙර මුළු වර්ෂයට ම ගෙවිය යුතු බද්ද ගෙව්වහොත් එසේ ගෙවන මුදලින් සියයට දහයක් (10%).

බදු මුදල් කාර්තු වශයෙන් ගෙවන විට බද්ද ගෙවිය යුතු කාර්තුවේ පළමුවන මාසය තුළ දී ගෙවනු ලැබුවහොත් එසේ ගෙවනු ලබන මුදලින් සියයට පහක් (5%),

තව ද ඉහත පනවන ලද බද්ද නොගෙවන අවස්ථාවක දී ප්‍රාදේශීය සභා පනතේ 161 වැනි වගන්තිය ප්‍රකාර 10% ක වරෙන්තු ගාස්තුවක් අයකරන බව ද නිවේදනය කරමි.

යූ. එච්. ආර්. කේ. කපුකොටුව,
ලේකම්,
ප්‍රාදේශීය සභාව,
පල්ලේපොල.

10-1251/2

---

**පල්ලේපොල ප්‍රාදේශීය සභාව**

ඉඩම් විකිණීම මත බදු අයකිරීම

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ අංක 154(1) වැනි වගන්තිය යටතේ පල්ලේපොල ප්‍රාදේශීය සභා බල සීමාව තුළ යම් ඉඩමක් වෙන්දේසිකරුවෙකු හෝ තැරැව්කරුවෙකු හෝ නියෝජිතයෙකු විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ හෝ අන්‍යාකාරයෙන් විකුණනු ලබන

අවස්ථාවක ඒ ඉඩම විකිණීමෙන් ලත් මුදලින් සියයට එකක් (1%) හෝ සමාන බද්දක් විකුණුම්කරු හෝ ඔහුගේ සේවකයා හෝ අනුප්‍රාප්තිකයා විසින් එම ඉඩම විකණීමෙන් ලත් මුදලින් පල්ලේපොල ප්‍රාදේශීය සභාවට 2017.01.01 වැනි දින සිට ගෙවිය යුතු බවට 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 09(03) අනුව මා හට පැවරී ඇති බලතල ප්‍රකාරව 2016.08.22 දින තීරණ අංක 91 යටතේ තීරණය කර ඇති බව දනුම් දෙනු ලැබේ.

යූ. එච්. ආර්. කේ. කපුකොටුව,
ලේකම්,
ප්‍රාදේශීය සභාව,
පල්ලේපොල.

10-1251/3

---

**පල්ලේපොල ප්‍රාදේශීය සභාව**

රථ වාහන හා සතුන් පිළිබඳ බද්ද - 2017 වර්ෂය

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ අංක 148 වැනි වගන්තිය යටතේ රථ වාහන හා සතුන් පිළිබඳ බද්දක් පනවා අය කිරීමට එකී පනතේ 147 වැනි වගන්තිය ප්‍රකාර මෙයින් දැනුම් දෙන අතර, මෙම බදු මුදල 2017 මාර්තු මස 31 වැනි දින හෝ ඊට පෙර එකී පනතේ 148ඃ 3 වැනි වගන්තිය යටතේ ගෙවිය යුතු බවට 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ අංක 9ඃ03 අනුව මා හට පැවරී ඇති බලතල ප්‍රකාරව 2016.08.22 දින තීරණ අංක 91 යටතේ තීරණය කර ඇති බව දනුම් දෙනු ලැබේ.

| | | |
|---|---|---|
| | | *රු. ශ.* |
| | මෝටර් රථයක්, මෝටර් ට්‍රයි කාරයක්, මෝටර් ලොරියක් මෝටර් බයිසිකලයක්, කරත්තයක් හෝ ජින් රික්ෂෝවක් නොවන සෑම වාහනයක් සඳහා | 30 0 |
| | සෑම බයිසිකලයක් හෝ ට්‍රයිසිකලයක් හෝ බයිසිකල් කාරයක් හෝ කරත්තයක් සඳහා - | |
| | *(අ)* වෙළඳ කාර්යයක් සඳහා යොදවන්නේ නම් සේවා ගාස්තු | 18 0 |
| | *(ආ)* වෙළඳ කාර්යය නොවන කාර්යය සඳහා යොදවන්නේ නම් සේවා ගාස්තු | 4 0 |
| 2. | සෑම කරත්තයක් සඳහා සේවා ගාස්තුව | 20 0 |
| 3. | සෑම අත් කරත්තයක් සඳහා සේවා ගාස්තු | 10 0 |
| 4. | සෑම රික්ෂෝවක් සඳහා | 15 0 |
| 5. | සෑම අශ්වයෙකු, පෝනියෙකු, කොටළුවකු සඳහා | 10 0 |
| 6. | සෑම ඇතෙකු සඳහා | 50 0 |

යූ. එච්. ආර්. කේ. කපුකොටුව,
ලේකම්,
ප්‍රාදේශීය සභාව,
පල්ලේපොල.

10-1251/9

## මොරටුව මහ නගර සභාව

## 2017 වර්ෂයට බදු හා බලපත්‍ර ගාස්තු පැනවීම

1979 අංක 42 දරන සංශෝධිත පනතින් සංශෝධනය කරන ලද 1947 අංක 29 දරන මහ නගර සභා ආඥාපනතින් මොරටුව මහ නගර සභාවට පැවරී ඇති බලතල ප්‍රකාර, 2016.10.04 දින පැවති විශේෂ කළමනාකරණ කමිටුවේ නිර්දේශය ද සලකා බලා බලයලත් නිලධාරි බලතල, කාර්යය හා කර්තව්‍ය, ක්‍රියාත්මක කිරීමේ නිලධරයා වශයෙන් නාගරික කොමසාරිස්වරයා විසින් පහත සඳහන් යෝජනා සම්මත කර ඇති බව නිවේදනය කරනු ලැබේ. 2017 වර්ෂය සඳහා බදු/බලපත්‍ර ගාස්තු 2017 මාර්තු 31 වැනි දිනට හෝ ඊට පෙර ගෙවිය යුතු බවද වැඩිදුරටත් දැනුම් දෙමි.

එම්. එම්. සී. කේ. කේ. මාන්නප්පෙරුම,
නාගරික කොමසාරිස්,
බලතල, කාර්යය, කර්තව්‍ය, ක්‍රියාත්මක කිරීමේ නිලධාරි
මොරටුව මහ නගර සභාව.

2016 ඔක්තෝබර් මස 10 වැනි දින,
මොරටුව මහ නගර සභා කාර්යාලයේ දී ය.

**යෝජනාව**

1979 අංක 42 දරන සංශෝධිත පනතින් සංශෝධනය කරන ලද 1979 අංක 29 දරන මහ නගර සභා ආඥාපනතේ (252 වැනි අධිකාරය) 247 "අ", "ආ", "ඇ", "ඉ" ප්‍රකාරව මොරටුව මහ නගර සභා බල ප්‍රදේශය ඇතුළත යම් පරිශ්‍රයක පවත්වාගෙන යනු ලබන සෑම කර්මාන්තයක් සම්බන්ධයෙන්ම උපලේඛන අංක I, II, III, IV, V සඳහන් බලපත්‍ර ගාස්තුවක්/බද්දක් පනවා අයකළ යුතු යැයි යෝජනා කරන්නී ය.

*මොරටුව මහ නගර සභාව*

*2017 වර්ෂයට බලපත්‍ර ගාස්තු පැනවීම*

**උපලේඛන - අංක I**

බලපත්‍ර ගාස්තු අය කිරීම - 247 (අ) වගන්තිය

| *බලපත්‍ර ගාස්තු චක්‍රය ස්ථානයේ වාර්ෂික තක්සේරු වටිනාකම* | *බලපත්‍ර ගාස්තු රු. ශත* |
|---|---|
| රු. 100 - රු. 6,500 | 700 00 |
| රු. 6,501 - රු. 10,000 | 1,500.00 |
| රු. 10,001 - රු. 25,000 | 3,000.00 |
| රු. 25,000ට වැඩි | 5,000.00 |

ඉහත ගාස්තුවලට අමතරව රජය විසින් පනවන ලද බදු අයකරනු ලැබේ.

1968 අංක 14 දරන සංචාරක සංවර්ධන පනතේ කාර්යයන් සඳහා ලංකා සංචාරක මණ්ඩලයේ ලියාපදිංචි කර ඇත්තාවූ හෝ ඒ මණ්ඩලය විසින් අනුමත කරනු ලැබූ හෝ පිළිගනු ලැබ ඇත්තාවූ හෝටලයක ආපන ශාලාවක හෝ නවාතැන් පොළක පෙර වර්ෂයන් ලැබීම් මත සියයට 01%ක ගාස්තුවක් අයකරනු ලැබේ. අදළ විකුණුම් වර්ෂයේ ජූනි 30ට පෙර බලපත්‍රය ලබාගත යුතු ය.

| *අනු. අංකය* | *වෙළඳ ව්‍යාපාරයේ ස්වභාවය* |
|---|---|
| 1 | හෝටලයක් පවත්වාගෙන යාම. |
| 2 | උෟරන් හෝ එළුවන් දහයක් හෝ ඊට වැඩි ගණනක් සඳහා ගාලක් හෝ මඩුවක් පවත්වාගෙන යාම. |
| 3 | උළු, කොන්ක්‍රීට්, පයිප්ප හෝ වෙනත් කොන්ක්‍රීට් භාණ්ඩ නිෂ්පාදනය කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම. |
| 4 | විෂබීජ නාශක නිෂ්පාදනය කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම. |
| 5 | ටයර් නැවත පිරවීමේ හෝ කට්ට කැපීමේ ස්ථානයක් පවත්වාගෙන යාම. |
| 6 | කොන්ක්‍රීට් හෝ මැටි පයිප්ප ගබඩා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම. |
| 7 | වේවැල් භාණ්ඩ නිෂ්පාදනය හෝ ගබඩා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම. |
| 8 | යන්ත්‍රානුසාරයෙන් ක්‍රියා කරන රෙදි මෝලක් පවත්වාගෙන යාම. |
| 9 | රබර් භාණ්ඩ නිෂ්පාදනය හා ගබඩා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම. |
| 10 | පොලිතින් සැලෝලයිට් හෝ පර්ස්පෙක්ට් නිෂ්පාදනය හෝ වර්ග කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම. |
| 11 | පොල්තෙල් ගබඩා කිරීමේ හා වෙළඳාම් කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම. |
| 12 | රෙදි නිෂ්පාදනය හා ගබඩා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම. |
| 13 | රසකැවිලි නිෂ්පාදනය කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම. |
| 14 | ලී පෙට්ටි නිෂ්පාදනය හෝ ගබඩා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම. |
| 15 | සබන් නිෂ්පාදනය කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම. |
| 16 | ගැල්වනයිස් තහඩු නිෂ්පාදනය කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම. |
| 17 | රූපලාවන්‍ය හෝ මනාලියන් හැඩගැන්වීමේ ස්ථානයක් පවත්වාගෙන යාම. |
| 18 | කේටරින් සර්විස් කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම. |
| 19 | ආගන්තුක නිවාසයක් පවත්වාගෙන යාම. |
| 20 | සත්ව ගොවිපලක් පවත්වාගෙන යාම. |
| 21 | තීන්ත හෝ වාර්නිෂ් ගබඩා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම. |
| 22 | විසිරි පින්තාරු කරන ස්ථානයක් පවත්වාගෙන යාම. |
| 23 | යන්ත්‍රානුසාරයෙන් ඇඳුම් මසන ස්ථානයක් පවත්වාගෙන යාම. (ඇඟළුම් කර්මාන්තශාලාව) |
| 24 | තේ කඩයක් පවත්වාගෙන යාම. |

25 බතික් රෙදි නිෂ්පාදනය කිරීමේ හෝ වෙළඳාම් කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම.
26 රෙදි මුද්‍රණය කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම.
27 වීදුරු භාණ්ඩ නිෂ්පාදනය හෝ ගබඩා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම.
28 තේ ගබඩා කිරීම හා වෙළඳාම් කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම.
29 ගබඩාවක් පවත්වාගෙන යාම.
30 සුවඳ විලවුන් නිෂ්පාදනය කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම.
31 විනාකිරි නිෂ්පාදනය හෝ ගබඩා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම.
32 වෛද්‍ය පරීක්ෂණාගාරයක් පවත්වාගෙන යාම.
33 ෆයිබර් ග්ලාස් බෝට්ටු හා භාණ්ඩ නිෂ්පාදනය කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම.
34 ගෙබිම පොලිෂ් නිෂ්පාදනය කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම.
35 පොලිෆෝම් කුෂන් නිෂ්පාදනය/ගබඩා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම.
36 ප්ලාස්ටර් ඔෆ් පැරිස් නිෂ්පදානය කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම.
37 රෙදි ඩයි කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම.
38 සයිලන්සර් සෑදීමේ ස්ථානයක් පවත්වාගෙන යාම.
39 සමාජ ශාලාවක් පවත්වාගෙන යාම.
40 රසායනික ද්‍රව්‍ය ගබඩා කිරීම හා වෙළඳාම් කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම.
41 ශීතකල කුකුල් මස් වෙළඳාම් කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම.
42 ඇඹරුම්හලක් පවත්වාගෙන යාම.
43 ලේත් මැෂින් වැඩපල.
44 සුපිරි වෙළඳ සංකීර්ණය තුළ ෆාමසියක් පවත්වාගෙන යාම.
65 සිනමාශාලාවක් පවත්වාගෙන යාම.
66 විදුලි භාණ්ඩ නිෂ්පාදනය කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම.
67 බීම පැකට් නිෂ්පාදනය කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම.
68 විදුලි නාම පුවරු නිෂ්පාදනය කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම.
69 නූල් නිපදවීම හා වර්ණ ගැන්වීමේ ස්ථානයක් පවත්වාගෙන යාම.
70 ඉලාස්ටික් නිෂ්පාදනය කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම.
71 රේස් බයි රේස් ස්ථානයක් පවත්වාගෙන යාම.
72 බෝල මේසයක් පවත්වාගෙන යාම. (බිලියට්)
73 ඇස් කණ්නාඩි නිෂ්පාදනය හා වෙළඳාම් කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම.
74 සම් භාණ්ඩ නිෂ්පාදනය කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම.
75 එසෙන්ස් වර්ග නිෂ්පාදනය හා වෙළඳාම් කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම.
76 කිරිහලක් සඳහා ස්ථානයක් පවත්වාගෙන යාම.
77 දන්ත සායනයක් පවත්වාගෙන යාම.
78 සත්ත්ව සායනයක් පවත්වාගෙන යාම
79 ආයුර්වේද බෙහෙත් ශාලාවත් පවත්වාගෙන යාම.
80 බටහිර බෙහෙත් ශාලාවක් පවත්වාගෙන යාම.
81 පොලිතින් පටල නිෂ්පාදනය කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම.
82 ගරාජයක් හැර යන්ත්‍රානුසාරයෙන් විද්‍යුත් ලෝහාලේපනය කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම.
83 නේවාසිකාගාරයක් පවත්වාගෙන යාම.
84 බේකරියක් පවත්වාගෙන යාම.
85 බාබර් සාප්පුවක් පවත්වාගෙන යාම.
86 ජලය පිරිසිදු කර බෝතල් කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම.
87 වාෂ්ප බලයෙන්, ජල බලයෙන්, ලී පදම් කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම.
88 මහාපරිමාණයේ වඩු කර්මාන්තශාලාවක් පවත්වාගෙන යාම.
89 අත් බංකු රෝද කියත්.
90 බැන්සෝ එකක් සඳහා (හැඩ කපන).
91 ගෘහ භාණ්ඩ පොලිෂ් කරන ස්ථානයක් පවත්වාගෙන යාම.
92 රාමු කියත් (වෙහෙරාන්).
93 අතින් කරකවන මහ පරිමාණයේ රෝද කියත්
94 පැන්ට්‍රි කබඩ් නිෂ්පාදනය කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම.
95 ඉරු දැව සහිත ලී වෙළඳසැලක් පවත්වාගෙන යාම.
96 දැව කොටස් වෙළඳාම් කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම.
97 ලී ගෘහ භාණ්ඩ නිෂ්පාදනය කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම.

මෙයට සමගාමීව වඩුමඩු සඳහා බලපත්‍ර ගාස්තු පහත සඳහන් පරිදි 2017 වර්ෂය සඳහා අය කරනු ලැබේ.

| | ගාස්තුව රු. ශත |
|---|---|
| වඩු මඩුව මෝටර් රහිත | 250 0 |
| වඩුමඩුව මෝටර් 01 | 275 0 |
| වඩුමඩුව මෝටර් 02 | 300 0 |
| වඩුමඩුව මෝටර් 03 | 325 0 |
| වඩුමඩුව මෝටර් 03ට වැඩි | 700 0 |
| වඩු මඩුවක් බැන්ෂෝ එකක් සමග පවත්වාගෙන යාම | 1,000 0 |

මෙහි පහත දක්වෙන කර්මාන්ත හෝ ව්‍යාපාර, (252 වැනි අධිකාරිය වන) මහ නගර සභා ආඥාපනතේ 147 වැනි වගන්තියේ කාර්ය සඳහා පීඩාකාරී කර්මාන්ත හෝ ව්‍යාපාර ලෙස මෙයින් ප්‍රකාශයට පත් කරනු ලැබේ.

1 මිනිරන් වර්ග කිරීම හා සකස් කිරීම
2 මිනිරන් ගබඩා කර තැබීම
3 පොහොර නිෂ්පාදනය
4 පොහොර ගබඩා කර තැබීම
5 හම් ගබඩාකර තැබීම
6 උම්බලකඩ හොණ්ඩර 5කට වැඩි ප්‍රමාණයක් ගබඩා කිරීම
7 කුකුළු වෙළඳපොලක් පවත්වාගෙන යාම
8 කලුගල් කැඩීම සහ කබොක් කැපීම
9 බොරලු හැරීම

10 අශ්වයන් හෝ ගවයන් සඳහා ඉස්තාලයක්, වෙළඳපලක්, ගාලක් හෝ ලැයිමක් තබා ගැනීම
11 පශු ගිලන් හලක් පවත්වාගෙන යාම
12 රබර් සකස් කිරීම
13 පොහොර, හුණු හෝ මිනිරන් දමා තිබුණ ගෝනි ගබඩා කිරීම ශුද්ධ කිරීම, අලුත්වැඩියා කිරීම හෝ ඒවායේ දූලි ඉවත් කිරීම.
14 පුවක් සකස් කිරීම
15 තලාතු මිනිරන් සකස් කිරීම
16 බැටළුවන් හෝ එළුවන් හෝ ඒ දෙවර්ගයම හෝ 10 දෙනෙකුට වඩා ගාල් කොට තැබීම සඳහා වූ මඩුවක් හෝ ගාලක් තබා ගැනීම.
17 උළු, කොන්ක්‍රීට් පයිප්ප හෝ වෙනත් කොන්ක්‍රීට් ද්‍රව්‍ය නිෂ්පාදනය කිරීම.
18 හුණු ගබඩා කොට තැබීම
19 බොම්බයි ලූනු හොණ්ඩර 5කට වඩා ගබඩා කොට තැබීම
20 අර්තාපල් හොණ්ඩර 5කට වඩා ගබඩා කොට තැබීම
21 පොල්කටු අඟුරු හොණ්ඩරයකට වඩා ගබඩා කොට තැබීම
22 කුරුඳු, කරදමුංගු හෝ කෙඳි, ගෙන්දගම් දුම් ගස්සා සකස් කිරීම
23 පරණ ලෝහ ගබඩා කර තැබීම
24 සිමෙන්ති හොණ්ඩර 25කට වඩා ගබඩා කොට තැබීම
25 කරවල හොණ්ඩර 10කට වඩා ගබඩා කොට තැබීම
26 ලුණු දැමූ මාළු හොණ්ඩර 10කට වඩා ගබඩා කොට තැබීම
27 රබර් ඔට්ටපාලු සුන්බුන් ඇඹරීම හෝ වේලීම
28 ට්‍රංක් පෙට්ටි නිෂ්පාදනය
29 මරා සකස් කළ කුකුළු ආදි සතුන් විකිණීම සඳහා කඩයක් පවත්වාගෙන යාම
30 ගම් වර්ග නිෂ්පාදනය
31 විෂබීජ නාශක ද්‍රව්‍ය නිෂ්පාදනය කිරීම.
32 බැටරි පුරවනු ලබන්නාවූ හෝ බැටරි ගබඩා කොට තබනු ලබන්නාවූ ආයතනයක් පවත්වාගෙන යාම.
33 ටයර් ප්‍රතිසංස්කරණය කරනු ලබන්නාවූ හෝ කට්ට කැපීම කරනු ලබන්නාවූ ආයතනයක් පවත්වාගෙන යාම.
34 ටයර් හෝ ටියුබ් වොල්කනයිස් කරන ආයතනයක් පවත්වාගෙන යාම
35 හිස් බෝතල 100කට වැඩි ප්‍රමාණයක් ගබඩා කොට තැබීම.
36 කුරුඳු පොතු හොණ්ඩරයකට වඩා ගබඩා කොට තැබීම.
37 කොකෝවා හොණ්ඩර 10කට වඩා ගබඩා කොට තැබීම.
38 මිනී පෙට්ටි සෑදීම හෝ ගබඩා කොට තැබීම.
39 ගෘහ භාණ්ඩ සෑදීම හෝ ගබඩා කොට තැබීම.
40 මැණික් වෙළෙන්දන් විසින් මැණික් කැපීම හා ඔපදැමීම.
41 බලපත්‍ර ලත් වෙළෙන්දන් විසින් රබර් ගබඩා කොට තැබීම.
42 වේවැල් බඩු සෑදීම හෝ ගබඩා කොට තැබීම.
43 කොන්ක්‍රීට් හෝ මැටි භාණ්ඩ පයිප්ප කොට තැබීම.
44 යාන්ත්‍රික බලය යොදාගෙන රෙදි වියන කර්මාන්ත ශාලාවක් පවත්වාගෙන යාම.
45 පිටි හෝ කුළුබඩු ඇඹරීම.
46 පුන්නක්කු හැර, සත්ව ආහාර හොණ්ඩර 20කට වඩා ගබඩා කොට තැබීම.
47 සත්ව ආහාර සඳහා හැර වෙනත් කාර්යයන් සඳහා ධාන්‍ය ටොන් එකකට වැඩි ප්‍රමාණයක් ගබඩා කොට තැබීම, එහෙත් සමුපකාර සමිති විසින් ගබඩා කොට තබා ගන්නා එවැනි ධාන්‍ය මෙම නියමයට යටත් නොවේ.
48 රබර් භාණ්ඩ නිෂ්පාදනය.
49 මෝර වරල් සකස් කිරීම හා ගබඩා කොට තැබීම.
50 යන්ත්‍රානුසාරයෙන් ඇටකටු ඇඹරීම.
51 පුන්නක්කු ටොන් එකකට වැඩි ප්‍රමාණයක් ගබඩා කොට තැබීම.
52 පොලිතින්, සෙල්‍යුලොයිඩ් හෝ පර්ස්පෙක්ස් නිෂ්පාදන නිපදවීම සහ ගබඩා කර තැබීම.
53 ඇසිඩ් ගැලුම් 5කට වැඩි ප්‍රමාණයක් ගබඩා කර තැබීම.
54 කපුරු නිෂ්පාදනය
55 බූට් සපත්තු සහ හෝ පාවහන් නිෂ්පාදනය.
56 ඉටිපන්දම් නිෂ්පාදනය.

මෙහි පහත සඳහන් කර්මාන්ත හෝ ව්‍යාපාර, (252 වැනි අධිකාරය වන) මහ නගර සභා ආඥාපනතේ 147 වන වගන්තියේ කාර්ය සඳහා අන්තරාදායක කර්මාන්ත හෝ ව්‍යාපාර ලෙස මෙයින් ප්‍රකාශයට පත් කරනු ලැබේ.

1 වාෂ්ප, ජලය හෝ වෙනත් යාන්ත්‍රික බලයක් යොදාගෙන දැව හෝ ලී ඉරීම.
2 සිසිල් බීම නිෂ්පාදනය
3 කොප්පරා ගබඩාවක් පවත්වාගෙන යාම.
4 යන්ත්‍රානුසාරයෙන් පොල්තෙල් නිෂ්පාදනය.
5 යන්ත්‍රානුසාරයෙන් තලතෙල් නිෂ්පාදනය.
6 තෙල් හිඳීම සඳහා සෙක්කුවක් හෝ අත් මෝලක් තබා ගැනීම.
7 කෙඳි නිෂ්පාදනය හෝ ගබඩාකොට තැබීම.
8 ගිනි පෙට්ටි නිෂ්පාදනය.
9 ඉඹුල් පුළුන් ගබඩා කොට තැබීම.
10 පොල්තෙල් ගැලුම් 50කට වැඩි ප්‍රමාණයක් ගබඩා කොට තැබීම.
11 මැතිලේටඩ් ස්ප්‍රීතු ගබඩා කොට තැබීම.
12 ඇසිටිලින් නිෂ්පාදනය.
13 උළු 500 කට වැඩි ප්‍රමාණයක් ගබඩා කොට තැබීම සඳහා අංගනයක් හෝ ගබඩාවක් පවත්වාගෙන යාම.
14 ගඩොල් 250කට වැඩි ප්‍රමාණයක් ගබඩා කොට තැබීම සඳහා අංගනයක් හෝ ගබඩාවක් පවත්වාගෙන යාම.
15 කබොක් ගල් 250කට වැඩි ප්‍රමාණයක් ගබඩා කොට තැබීම සඳහා අංගනයක් හෝ ගබඩාවක් පවත්වාගෙන යාම.
16 සිගරට් නිෂ්පාදනය.
17 බීඩි නිෂ්පාදනය.
18 තීන්ත හෝ වාර්නිෂ් හොණ්ඩර 5කට වැඩි ප්‍රමාණයක් ගබඩා කොට තැබීම.
19 ලී පෙට්ටි හොණ්ඩර 05කට වැඩි ප්‍රමාණයක් ගබඩා කොට තැබීම.
20 කොහු නිෂ්පාදනය.
21 පොහොර, හුණු හෝ මිනිරන් දමා තිබුණු ගෝනි හැර වෙනත් ගෝනි 100කට වැඩි ප්‍රමාණයක් ගබඩා කොට තැබීම.
22 පාවිච්චිකළ රබර් ටයර් හෝ ටියුබ් 150කට වැඩි ප්‍රමාණයක් ගබඩා කොට තැබීම.
23 රසකැවිලි නිෂ්පාදනය.
24 පොල්කටු අඟුරු හැර වෙනත් අඟුරු හොණ්ඩරයකට වැඩි ප්‍රමාණයක් ගබඩා කොට තැබීම.
25 බෝට්ටු හෝ බත්තල් සෑදීම.

26 ලී පෙට්ටි සෑදීම.
27 ඔක්සිජන් සහ වැල්ඩින් වැඩ කරනු ලබන්නාවූද, මෝටර් වාහන අලුත්වැඩියා කරන්නාවූ ද, ගරාජයක් නොවන්නාවූ ද, වෙනත් ආයතනයක් පවත්වාගෙන යාම.
28 මෝටර් වාහන අලුත්වැඩියා කරන්නාවූ ද, යකඩ සහ ලෝහ වැඩ කරනු ලබන්නාවූ ද, ගරාජයක් නොවන්නාවූ ද වෙනත් ආයතනයක් පවත්වාගෙන යාම.
29 මෝටර් වාහන අලුත්වැඩියා කරන ආයතනයක් පවත්වාගෙන යාම.
30 මෝටර් වාහන සර්විස් කරන ආයතනයක් පවත්වාගෙන යාම.
31 යාන්ත්‍රික බලය යොදා ගනු ලබන්නාවූ මුද්‍රණාලයක් පවත්වාගෙන යාම.
32 අතින් හෝ පා පොලුවලින් ක්‍රියා කරවන යන්ත්‍රයක් පාවිච්චි කෙරෙන මුද්‍රණාලයක් පවත්වාගෙන යාම.
33 පාවිච්චි කළ ඇඳුම් ගබඩා කර තැබීම.
34 පොල්තෙල් හැර වෙනත් කවර හෝ වර්ගයක තෙල් ලීටර් 54.5කට වැඩි ප්‍රමාණයක් ගබඩා කර තැබීම සඳහා අංගනයක් හෝ ගබඩාවක් පවත්වාගෙන යාම.
35 ගෙන්දගම් සහ / හෝ ගෙන්දගම් කුඩු කිලෝ ග්‍රෑම් 50කට වැඩි ප්‍රමාණයක් ගබඩා කොට තැබීම.
36 තීන්ත හෝ වාර්නිෂ් නිෂ්පාදනය.
37 100කට අධික ප්‍රමාණයක් පතුරොම් ගබඩා කොට තැබීම.
38 කොහු හෝ පුළුන් මෙට්ට හෝ කොට්ට හෝ කුෂන් නිෂ්පාදනය සහ/හෝ ගබඩා කොට තැබීම.
39 අලුත් ටයර් හෝ ටියුබ් 150කට අධික ප්‍රමාණයක් ගබඩා කොට තැබීම.
40 පාවිච්චි කළ කඩදාසි කිලෝග්‍රෑම් 250කට අධික ප්‍රමාණයක් ගබඩා කොට තැබීම.
41 ස්ප්‍රේ පේන්ටිං වැඩ කරන ස්ථානයක් පවත්වාගෙන යාම.
42 යාන්ත්‍රික ශීතකරණය සඳහා ආයතනයක් පවත්වාගෙන යාම.
43 යාන්ත්‍රික බලය පාවිච්චි කරනු ලබන්නාවූ ද ඇඳුම් මැසීම කරනු ලබන්නාවූ ද ආයතනයක් පවත්වාගෙන යාම.
44 කමිස කොලර් සහ කමිස අත් රැළි දමන ආයතනයක් පවත්වාගෙන යාම.

මෙහි පහත සඳහන් කර්මාන්ත හෝ ව්‍යාපාර, (252 වැනි අධිකාරය වන) මහ නගර සභා ආඥාපනතේ 147 වන වගන්තියේ කාර්ය සඳහා අන්තරාදායක සහ පීඩාකාරී කර්මාන්ත හෝ ව්‍යාපාර ලෙස මෙයින් ප්‍රකාශයට පත් කරනු ලැබේ.

1 ඩ්‍රයික්ලීන් වැඩ කරන ආයතනයක් පවත්වාගෙන යාම.
2 යාන්ත්‍රික බලය පාවිච්චි නොකරන්නාවූ ද, ඉලෙක්ට්‍රෝ ප්ලේටිං වැඩ, ක්රෝමියම් ආලේප කිරීම, රන් ආලේප කිරීම, රිදී ආලේප කිරීම හෝ තඹ ආලේප කිරීම කරනු ලබන ආයතනයක් පවත්වාගෙන යාම.
3 යාන්ත්‍රික බලය පාවිච්චි කරන්නාවූ ද, ඉලෙක්ට්‍රෝ ප්ලේටිං වැඩකරනු ලබන්නාවූ ද, ගරාජයක් නොවන්නාවූ ආයතනයක් පවත්වාගෙන යාම.
4 ගල් අඟුරු ගෑස් නිෂ්පාදනය සහ ගබඩා කිරීම.
5 කාබන්ඩයොක්සයිඩ් නිෂ්පාදනය.
6 අශුද්ධ ලෝහ උණු කිරීම.
7 ගිණිකෙළි භාණ්ඩ ගබඩා කිරීම.
8 කිලෝග්‍රෑම් දෙකකට අධික ප්‍රමාණයකින් වෙඩි බෙහෙත් සහ පුපුරණ ද්‍රව්‍ය ගබඩා කිරීම.
9 ගම්, ඉටි හෝ දුම්මල (රෙසින්) ගබඩා කිරීම.
10 බිම ඔප දමන පොලිෂ් නිෂ්පාදනය.
11 තාර පෙරීම සඳහා ආයතනයක් පවත්වාගෙන යාම.
12 ශීතරකණ අලුත්වැඩියා කිරීම, රීකන්ඩිෂන් කිරීම හෝ පරීක්ෂා කිරීම සඳහා ආයතනයක් පවත්වාගෙන යාම.
13 මෝටර් කාර් එකලස් කිරීම සඳහා ආයතනයක් පවත්වාගෙන යාම.
14 ස්කූටර් හෝ මෝටර් සයිකල් එකලස් කිරීම සඳහා ආයතනයක් පවත්වාගෙන යාම.
15 පුපුරණ ද්‍රව්‍ය, රසායන ද්‍රව්‍ය සහ පොහොර විකිණීම සඳහා ආයතනයක් පවත්වාගෙන යාම.

බලපත්‍රය නිකුත් කර ඇත්තේ යම් ව්‍යාපාරයක් සඳහා ද ඒ ව්‍යාපාරය හැර වෙනත් කිසිම ව්‍යාපාරයක්, බලපත්‍රලත් ස්ථානයේහි පවත්වාගෙන යාමට කිසිම බලපත්‍රලාභියකු විසින් ඉඩ නොදිය යුතුය.

### අප්‍රසන්න හා අන්තරායදායක වෙළඳාම් හෝ ව්‍යාපාර

1 රබර් නිවාරණය කිරීම.
2 පෝර, හුණු හෝ මිනිරන් බහා තැබූ ගෝනි මළු ගබඩා කිරීම, කුඩු පිස දැමීම, ශුද්ධ කිරීම හෝ අලුත්වැඩියා කිරීම.
3 තලාතු මිනිරන් නිවාරණය කිරීම.
4 හුණු ගබඩා කිරීම.
5 කිලෝග්‍රෑම් 50ට වැඩියෙන් පොල්කටු අඟුරු ගබඩා කිරීම.
6 ගෙන්දගම් දුම් භාවිතා කරමින් කුරුඳු, කරදමුංගු හෝ කෙඳි නිවාරණය කිරීම.
7 ඔට්ටුපාල ඇඹරීම හෝ වේලීම.
8 බැටරි චාර්ජ් කරනු ලබන හෝ ගබඩා කරනු ලබන, යාන්ත්‍රික බලය භාවිතයට ගන්නා ගරාජයක් හැර වෙනත් ආයතනයක් පවත්වාගෙන යාම.
9 ටියුබ් හෝ ටයර් වොල්කනයිස් කරන, යාන්ත්‍රික බලය යොදා නොගන්නා ගරාජයක් හැර වෙනත් ආයතනයක් පවත්වාගෙන යාම.
10 කිලෝග්‍රෑම් 50ට වැඩියෙන් කුරුඳු ගබඩා කිරීම.
11 කිලෝග්‍රෑම් 500ට වැඩියෙන් කොකෝවා ගබඩා කිරීම.
12 මිනී පෙට්ටි නිෂ්පාදනය හෝ ගබඩා කිරීම.
13 දැව භාණ්ඩ නිෂ්පාදනය හෝ ගබඩා කිරීම.
14 බලපත්‍රයලත් වෙළෙන්දන් විසින් රබර් ගබඩා කිරීම.
15 වේවැල් භාණ්ඩ නිෂ්පාදනය හෝ ගබඩා කිරීම.
16 යාන්ත්‍රික බලය භාවිතා කරන්නාවූ රෙදි වියන කම්හලක් පවත්වාගෙන යාම.
17 පිටි හෝ තුනපහ වර්ග කෙටීම.
18 රබර් බඩු නිෂ්පාදනය කිරීම.
19 දුම්, ජලය හෝ වෙනත් යාන්ත්‍රික බලයක් යොදාගෙන දැව හෝ ලී ඉරීම.
20 කොප්පරා ගබඩාවක් පවත්වාගෙන යාම.
21 යන්ත්‍රානුසාරයෙන් පොල්තෙල් නිෂ්පාදනය.
22 යන්ත්‍රානුසාරයෙන් තලතෙල් නිෂ්පාදනය.

23 තෙල් සිඳීම සඳහා සෙක්කුවක් හෝ අතින් ක්‍රියාකරවන මෝලක් පවත්වාගෙන යාම.
24 කෙඳි නිෂ්පාදනය හෝ ගබඩා කිරීම.
25 ගිනිපෙට්ටි නිෂ්පාදනය.
26 පුළුන් ගබඩා කිරීම.
27 ලීටර් 227 1/2ට වැඩියෙන් පොල්තෙල් ගබඩා කිරීම.
28 මැතිලේටඩ් ස්ප්‍රීතු ගබඩා කිරීම.
29 ඇසිටලින් නිෂ්පාදනය.
30 සිගරැට් නිෂ්පාදනය.
31 බීඩි නිෂ්පාදනය.
32 කිලෝ ග්‍රෑම් 250 ට වැඩියෙන් තීන්ත වර්ග හෝ වාර්නිෂ් ගබඩා කිරීම.
33 කිලෝ ග්‍රෑම් 250 ට වැඩියෙන් ලී පෙට්ටි ගබඩා කිරීම.
34 කොහු නිෂ්පාදනය.
35 රසකැවිලි නිෂ්පාදනය.
36 පෝර, හුණු හෝ මිනිරන් දමා තිබූ ගෝනි මළු හැර, කිලෝ ග්‍රෑම් 100ට වැඩියෙන් වෙනත් ගෝනි මළු ගබඩා කිරීම.
37 පාවිච්චි කළ රබර් ටයර් හෝ ටියුබ් 150 ට වැඩියන් ගබඩා කිරීම.
38 පොල්කටු අඟුරු හැර වෙනත් අඟුරු කිලෝ ග්‍රෑම් 50 ට වැඩියෙන් ගබඩා කිරීම.
39 ලී පෙට්ටි නිෂ්පාදනය.
40 යාන්ත්‍රික බලය පාවිච්චි කරන, ඔක්සිජන් සහ වෙල්ඩින් වැඩ කරන ගරාජයක් හැර වෙනත් ආයතනයක් පවත්වාගෙන යාම.
41 යාන්ත්‍රික බලය පාවිච්චි කරන, යකඩ හෝ ලෝහ වැඩ කරන ගරාජයක් හැර වෙනත් ආයතනයක් පවත්වාගෙන යාම.
42 යාන්ත්‍රික බලය පාවිච්චි කරමින් මෝටර් වාහන අළුත්වැඩියා කරන හෝ සර්විස් කරන ගරාජයක් හැර වෙනත් ආයතනයක් පවත්වාගෙන යාම.
43 යාන්ත්‍රික බලය පාවිච්චි කරමින් මෝටර් වාහන සර්විස් කරන හෝ අළුත්වැඩියා කරන ගරාජයක් හැර වෙනත් ස්ථානයක් පවත්වාගෙන යාම.
44 යාන්ත්‍රික බලය පාවිච්චි කරන මුද්‍රණාලයක් පවත්වාගෙන යාම.
45 අත් යන්ත්‍ර හෝ පාගන යන්ත්‍ර පාවිච්චි කරන මුද්‍රණාලයක් පවත්වාගෙන යාම.
46 පරණ ඇඳුම් ගබඩා කිරීම.
47 ලීටර් 54ට වැඩියෙන් පොල්තෙල් හැර වෙනත් කවර හෝ වර්ගයක තෙල් ගබඩා කිරීම පිණිස අංගනයක් හෝ ගබඩාවක් පවත්වාගෙන යාම.
48 ඇඳුම් ඩ්‍රයික්ලීන් කරන ආයතනයක් පවත්වාගෙන යාම.
49 යාන්ත්‍රික බලය පාවිච්චියට නොගෙන, විද්‍යුත් ලෝහාලේපය කිරීම, ක්‍රොමියන් ආලේපනය කිරීම, රන් ආලේපනය කිරීම, රිදී ආලේපනය.
50 යාන්ත්‍රික බලය පාවිච්චි කරමින් විද්‍යුත් ලෝහාලෝපනය කිරීම, ක්‍රෝමියම් ආලේපනය කිරීම.
51 මෝටර් වාහන අළුත්වැඩියා කරන ගරාජ සහ ආර්ක් වෙල්ඩිං වැඩ කිරීම.
52 කවර හෝ වර්ගයක උපකරණයක් ක්‍රියා කරවීම සඳහා විදුලි බලය හෝ යාන්ත්‍රික බලය භාවිත කෙරෙන යම් ස්ථානයක් පවත්වාගෙන යාම.
53 කිලෝ ග්‍රෑම් 50 ට වැඩියෙන් ඕනෑම වර්ගයක ප්ලාස්ටික් බඩු තබා ගැනීම.
54 සියළු වර්ගයේ ප්ලාස්ටික් බඩු නිෂ්පාදනය කිරීම.
55 කිලෝ ග්‍රෑම් 50 ට වැඩියෙන් කවර හෝ වර්ගයක පොලිතින් බඩු තබා ගැනීම.
56 සියළු වර්ගවල පොලිතින් බඩු නිෂ්පාදනය කිරීම.
57 කොහු නිෂ්පාදනය හා තබා ගැනීම.
58 කිලෝ ග්‍රෑම් 1000 ට වැඩියෙන් තේ කොළ තබා ගැනීම.
59 කිලෝ ග්‍රෑම් 250 ට වැඩියෙන් කඩදාසි සහ/හෝ කවර වර්ගයක හෝ කඩදාසි බඩු ගබඩා කිරීම.
60 ඇඟළුම් නිෂ්පාදනය.
61 බත් කඩ.
62 රසායන ද්‍රව්‍ය.
63 කිලෝ ග්‍රෑම් 50 ට වැඩි සියළු වර්ගවල ගිණිකෙලි භාණ්ඩ තබා ගැනීම.
64 කිලෝ ග්‍රෑම් 150 ට වැඩියෙන් එල්.පී.ජී. (L.P.G.) සිලින්ඩර් ගබඩා කිරීම.
65 හිස් වැසුම් සහ තොප්පි නිෂ්පාදනය.
66 කිලෝ ග්‍රෑම් 100 ට වැඩියෙන් රබර් බඩු (සියළු වර්ගවල) ගබඩා කිරීම.
67 කිලෝ ග්‍රෑම් 250 ට වැඩියෙන් කපාපු පොල් ගබඩා කිරීම.
68 කිලෝ ග්‍රෑම් 250 ට වැඩියෙන් රබර් ඇට ගබඩා කිරීම.
69 ලීටර් 91 ට වැඩියෙන් ඇසිඩ් ගබඩා කිරීම.
70 එකවරකට සේවානියුක්තිකයින් 25ට වැඩියෙන් සේවයෙහි නියුක්ත කරනු ලබන යම් කර්මාන්ත ශාලාවක් පවත්වාගෙන යාම.
71 ද්‍රව ඛනිජ තෙල් ගෑස් ඇතුළුව ඛණිජතෙල් නිෂ්පාදන ගබඩා කිරීම.
72 පතරොම් සහ වෙඩි බෙහෙත්.

උපලේඛනය - අංක II

කර්මාන්ත විෂයෙහි බදු අය කිරීම - 247 (ආ) වගන්තිය

බදු ගාස්තු චක්‍රය

| *ස්ථානයේ වාර්ෂික තක්සේරු වටිනාකම* | *අයකළ යුතු මුදල බදු මුදල රු. ශත* |
|---|---|
| රු. 100 - රු. 6,500 | 700 0 |
| රු. 6,501 - රු. 10,000 | 1,500 0 |
| රු. 10,001 - රු. 25,000 | 3,000 0 |
| රු. 25,000ට වැඩි | 5,000 0 |

| *අනු. අංකය* | *වෙළඳ ව්‍යාපාරයේ ස්වභාවය* |
|---|---|
| 1 | සිල්ලර වෙළඳසැලක් පවත්වාගෙන යාම. |
| 2 | රෙදිපිළි වෙළඳාම් කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම. |
| 3 | විදුලි උපකරණ අළුත්වැඩියා කරන ස්ථානයක් පවත්වාගෙන යාම. |
| 4 | විදුලි උපකරණ වෙළඳාම් කරන ස්ථානයක් පවත්වාගෙන යාම. |

5 මෝටර් රථ අමතර කොටස් වෙළඳාම් කරන ස්ථානයක් පවත්වාගෙන යාම.
6 ශීතකරණ විකිණීම හෝ ආනයනය කර ගබඩා කර තැබීමේ ස්ථානයක් පවත්වාගෙන යාම.
7 රූපවාහිනී විකිණීම හෝ ආනයනය කර ගබඩා කර තැබීමේ ස්ථානයක් පවත්වාගෙන යාම.
8 වීදුරු භාණ්ඩ විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම.
9 කමිස, කරපටි හා කමිස අත් සකස් කරන ස්ථානයක් පවත්වාගෙන යාම.
10 බටහිර ඖෂධ වර්ග වෙළඳාම් කරන ස්ථානයක් පවත්වාගෙන යාම.
11 ධාන්‍ය වෙළඳාම් කරන ස්ථානයක් පවත්වාගෙන යාම.
12 පරිගණක එම්බ්‍රොයිඩර් කර්මාන්තයක් පවත්වාගෙන යාම.
13 සපත්තු ලේස්, කෝඩ් නිෂ්පාදනය කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම.
14 පාපැදි විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම.
15 මෝටර් සයිකල් හෝ ස්කූටර් වෙළඳාම් කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම.
16 චීන චට්ටි භාණ්ඩ වෙළඳාම් කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම.
17 පාවහන් වෙළඳාම් කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම.
18 පාවහන් අළුත්වැඩියා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම.
19 සම්භාණ්ඩ වෙළඳාම් කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම.
20 ඉලෙක්ට්‍රොනික් භාණ්ඩ අළුත්වැඩියා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම.
21 ආහාර පිසීම සඳහා ගෑස් වෙළඳාම් කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම.
22 වාහන ගෑස් වෙළඳාම් කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම.
23 දිවා සුරැකුම් මධ්‍යස්ථානයක් පවත්වාගෙන යාම.
24 බීඩි, සුරුට්ටු, සිගරට් වෙළඳාම් කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම.
25 පාවිච්චි කරන ලද ඇඳුම් ගබඩා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම. (ස්වයං රැකියා)
26 මැණික් කැපීමේ හා පුහුණු කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම.
27 ඉවතලන නූල් හා ජුට් වෙළඳාම් කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම.
28 අපනයන හෝ ආයනය කිරීමේ වැඩ කටයුතු සඳහා ස්ථානයක් පවත්වාගෙන යාම.
29 දර මඩුවක් පවත්වාගෙන යාම.
30 නූල් නිෂ්පාදනය කිරීම හෝ වෙළඳාම් කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම.
31 ග්‍රොසරියක් පවත්වාගෙන යාම.
32 මහන මැෂින් ගෙන්වීමේ හා විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම.
33 පරිගණක යන්ත්‍ර ගෙන්වීමේ හා විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම.
34 පුටු විවීම සඳහා ස්ථානයක් පවත්වාගෙන යාම.
35 ප්ලාස්ටික් භාණ්ඩ විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම.
36 යකඩ බඩු විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම.
37 තොග වශයෙවන් සීනි ගබඩා කිරීමේ හෝ විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම.
38 ශබ්ද විකාශන යන්ත්‍ර අළුත්වැඩියා කරන ස්ථානයක් පවත්වාගෙන යාම.
39 අලුත් ටයර්, ටියුබ් විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම.
40 පරණ ටයර්, ටියුබ් හා පුරවන ලද ටයර් විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම.
41 ප්‍රචාරක සේවා ආයතනයක් පවත්වාගෙන යාම.
42 සිගරට් වෙළඳාම් කිරීමේ ඒජන්සියක් පවත්වාගෙන යාම.
43 මසා නිමකල ඇඳුම් වෙළඳාම් කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම.
44 වානිජමය කාර්යයන් සඳහා කාර්යාලයක් පවත්වාගෙන යාම.
45 ඔරලෝසු වෙළඳාම් කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම.
46 විදේශ රැකියා ඒජන්සියන් පවත්වාගෙන යාම.
47 ගෘහ උපකරණ අළුත්වැඩියා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම.
48 සුරතලය සඳහා ඇතිකරන මසුන් වෙළඳාම් කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම.
49 සුපිරි වෙළඳ සංකීර්ණය තුළ මූල්‍ය ආයතනයක් පවත්වාගෙන යාම.
50 විශේෂඥ වෛද්‍ය සේවා සපයන ස්ථානයක් පවත්වාගෙන යාම.
51 නියෝජිත (ඒජන්සි) තැපැල්හලක් පවත්වාගෙන යාම.
52 වානේ හෝ යකඩ කම්බිවලින් තැනූ විවිධ උපරකණ වෙළඳාම් කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම.
53 ආයුර්වේද ඖෂධ වෙළඳාම් කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම.
54 පොත්පත් හා ලිපිද්‍රව්‍ය වෙළඳාම් කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම.
55 අකුරු කෙටීමේ ව්‍යාපාරයක් පවත්වාගෙන යාම.
56 බෙලෙක් වැඩපලක් පවත්වාගෙන යාම.
57 බුමුතුරුණු හා ෆෝම්කා ෂීට් විකිණීම හෝ ගබඩා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම.
58 කේක් සෑදීම සඳහා අවශ්‍ය ද්‍රව්‍ය වෙළඳාම් කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම.
59 ලාම්පු ආවරණ නිෂ්පාදනය හෝ විකිණීම හෝ අළුත්වැඩියා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම.
60 තොග වශයෙන් පිටි ගබඩා කිරීමේ හෝ විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම.
61 විෂබීජනාශක ද්‍රව්‍ය වෙළඳාම් කිරීමේ හා ගබඩා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම.
62 බීජ වර්ග හා පැල වර්ග වෙළඳාම් කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම.
63 සංචාරක සේවා ආයතනයක් පවත්වාගෙන යාම.
64 ඡායා පිටපත් කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම.
65 බේකරිවලට අවශ්‍ය ද්‍රව්‍ය වෙළඳාම් කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම.
66 ඉන්ජෙක්ටර් පොම්ප සර්විස් කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම.
67 උත්සව සඳහා භාණ්ඩ කුලියට දීමේ ස්ථානයක් පවත්වාගෙන යාම.
68 දුරකථන සේවා ස්ථානයක් පවත්වාගෙන යාම.
69 ගුවන් විදුලි අමතර කොටස් වෙළඳාම හෝ ගබඩා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම.

70 පිඟන් බඩු වෙළඳාම හෝ ගබඩා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම.
71 තෑගි භාණ්ඩ වෙළඳාම් කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම.
72 දැන්වීම් පුවරු සකස් කරන ස්ථානයක් පවත්වාගෙන යාම.
73 උත්සවශාලාවක් පවත්වාගෙන යාම.
74 විසිතුරු භාණ්ඩ නිෂ්පාදනය කිරීම හෝ වෙළඳාම් කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම.
75 ඇලුමිනියම් භාණ්ඩ නිෂ්පාදනය කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම.
76 ස්නැප් කඩදාසි හෝ පරණ කඩදාසි, බෝතල්, ගෝනි, පරණ යකඩ ගබඩා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම.
77 කුෂන් මෙට්ට හා කුෂන් භාණ්ඩ වෙළඳාම් කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම.
78 ගොඩනැගිලි ද්‍රව්‍ය නිෂ්පාදනය කිරීම හෝ වෙළඳාම් කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම.
79 කඩදාසි බෑග් නිෂ්පාදනය කිරීම හෝ වෙළඳාම් කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම.
80 කෞතුක භාණ්ඩ වෙළඳාම හෝ ගබඩා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම.
81 තොග වශයෙන් වෙළඳාම් සඳහා දිය ලුණු ගබඩා කිරීම හෝ ලුණු කුඩු පැකට් කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම.
82 මල් ශාලාවක් පවත්වාගෙන යාම. (ස්වභාවික)
83 කෘතිම මල් විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම.
84 අවමංගල්‍ය භාණ්ඩ වෙළඳාම හා කුලියට දීමේ ස්ථානයක් පවත්වාගෙන යාම.
85 අත්යන්ත්‍ර මගින් නිෂ්පාදිත රෙදි විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම.
86 වීඩියෝ කැසට් පට හෝ වීසීඩී තැටි වෙළඳාම හෝ කුලියට දීමේ, පටිගතකිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම.
87 පොත් බැඳීමේ ස්ථානයක් පවත්වාගෙන යාම.
88 හඳුන්කූරු නිෂ්පාදනය හෝ වෙළඳාම් කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම.
89 සංගීත භාණ්ඩ වෙළඳාම හා කුලියට දීමේ ස්ථානයක් පවත්වාගෙන යාම.
90 පුවත්පත් වෙළඳාම් කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම.
91 හිස් බැරල් ගබඩා කිරීම හෝ විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම.
92 බැංකුවක් මගින් පහත සඳහන් එක් කාර්යයක් වෙනුවෙන් රු. 5,000 ක ගාස්තුවක් අය කිරීම.

(i) ස්ථාවර හෝ ඉතිරිකිරීමේ ගිණුම් පැවැත්වීම ;
(ii) ජංගම ගිණුම් පැවැත්වීම ;
(iii) ක්ෂණිකව මුදල් ලබා ගැනීමේ කවුළුවක් පැවැත්වීම;
(iv) රන් භාණ්ඩ උකස් ගැනීම ;
(v) වෙන්දේසි කටයුතු කිරීම ;
(vi) විදේශ මුදල් මාරු කිරීම.

93 රක්ෂණ ආයතනයක් මගින් පහත සඳහන් එක් කාර්යයක් වෙනුවෙන් රු. 5,000 ක ගාස්තුවක් අය කිරීම් පවත්වාගෙන යාම.
(i) ජීවිත රක්ෂණය ;
(ii) දේපළ රක්ෂණය ;
(iii) රථවාහන රක්ෂණය.

94 ෆිනෑන්ස් ආයතනයක් මගින් පහත සඳහන් එක් කාර්යයක් වෙනුවෙන් රු. 5,000 ක ගාස්තුවක් අය කිරීම.
(i) දේපළ මිලට ගැනීම ;
(ii) දේපළ විකිණීම ;
(iii) පාරිභෝගික තැන්පත් ගිණුම් පැවැත්වීම ;
(vi) බදු ඔප්පු යටතේ ණය නිකුත් කිරීම ;
(v) රන් භාණ්ඩ උකස් ගැනීම.

95 බිත්තර වෙළඳාම් කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම.
96 සිහිවටන නිෂ්පාදනය කිරීමේ හා විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම.
97 පින්තූර රාමු කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම.
98 පැණි ගබඩා කිරීමේ හෝ විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම.
99 ප්‍රචාරක දැන්වීම් අතින් සකස් කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම.
100 විදුලි කාර්මික ආයතනයක් පවත්වාගෙන යාම.
101 පොල් විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම.
102 ආයුර්වේද ඖෂධ වෙළඳාම් කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම. (සිල්ලරට ස්වයං රැකියා හැර)
103 ටේලර් සාප්පුවක් පවත්වාගෙන යාම.
104 කුලියට ඇඳුම් මැසීමේ ව්‍යාපාරයක් පවත්වාගෙන යාම.
105 බයිසිකල් අළුත්වැඩියා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම.
106 හැලි වළං හෝ කොහු භාණ්ඩ වෙළඳාම් කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම.
107 පළතුරු වෙළඳාම් කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම.
108 ඔරලෝසු අළුත්වැඩියා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම.
109 කඩල වෙළඳාම් කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම.
110 එළවළු වෙළඳාම් කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම.
111 රබර් සීල් හෝ බ්ලොක් නිෂ්පාදනය කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම.
112 කුඩ අළුත්වැඩියා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම.
113 මල් පෝච්චි හෝ විවිධ මල්පැල වෙළඳාම් කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම.
114 පිත්තල භාණ්ඩ වෙළඳාම් කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම.
115 කම්හල් වැඩපලක් පවත්වාගෙන යාම.
116 පරිගණක යන්ත්‍ර පිළිබඳ පුහුණු කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම.
117 ගෘහ නිර්මාණ ශිල්පය හෝ සැලසුම් ආයතනයක් පවත්වාගෙන යාම.
118 රිය පැදවීම පුහුණු කිරීමේ ආයතනයක් පවත්වාගෙන යාම.
119 හාල් වෙළඳාම් කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම.
120 ස්වර්ණාභරණ වෙළඳාම් කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම.
121 යන්ත්‍රෝපකරණ වෙළඳාම් කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම.
122 කාය වර්ධන මධ්‍යස්ථානයක් පවත්වාගෙන යාම.
123 බුලත්, ලුනු, පැදුරු, වළං, සුළු සාප්පු බඩු වෙළඳාම් කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම.
124 පුවත්පත් ඒජන්සියක් පවත්වාගෙන යාම.
125 නළ ළිං ඉදිකිරීමේ ආයතනයක් පවත්වාගෙන යාම.

126 කරවල වෙළඳාම් කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම.
127 ඇලුමිනියම්, ප්ලාස්ටික්, ලෝහ භාණ්ඩ විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම.
128 යතුරු පැදි හා ත්‍රීරෝද රථ අළුත්වැඩියා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම.
129 පරණ ගෘහ භාණ්ඩ හා ගෘහ උපකරණ වෙළඳාම් කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම.
130 සුපිරි වෙළඳසැලක් පවත්වාගෙන යාම.
131 ආරක්ෂක සේවා සපයන ස්ථානයක් පවත්වාගෙන යාම.
132 රථ අංගනයක් පවත්වාගෙන යාම.
133 කර්මාන්තශාලා විද්‍යුත් විදුලි උපකරණ වෙළඳාම් කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම.
134 මහන මැෂින් වෙළඳාම් කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම.
135 මහන මැෂින් අමතර කොටස් වෙළඳාම් කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම.
136 රෙදිපිළි ප්‍රදර්ශනාගාරයක් පවත්වාගෙන යාම.
137 යකඩ හා වානේ වැඩපලක් පවත්වාගෙන යාම.
138 විදුලිබල මධ්‍යස්ථානයක් පවත්වාගෙන යාම.
139 කැබ් සර්විස් ව්‍යාපාරයක් පවත්වාගෙන යාම.
140 රථ වාහන වෙළඳාම් කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම.
141 පෝලිෆෝම් කුෂන් වෙළඳාම් කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම.
142 මෝටර් සයිකල් හෝ ස්කූටර් එකලස් කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම.
143 බීඩිං, මෝල්ඩිං පටි නිෂ්පාදනය/වෙළඳාම් කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම.
144 ෆෝමිකා වෙළඳාම් කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම.
145 තුනී ලෑලි (MDF) කර්මාන්තය, වෙළඳාම් කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම.
146 රේස්බුකි (රේස් ඔට්ටුපල) ස්ථානයක් පවත්වාගෙන යාම.
147 බ්ලොක් ගල් නිෂ්පාදනය කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම.
148 ජාත්‍යන්තර පාසලක් පවත්වාගෙන යාම.
149 පෙර පාසලක් පවත්වාගෙන යාම.
150 ක්‍රීඩා පුහුණු ඒකකයක් පවත්වාගෙන යාම.
151 ජෝතිෂ්‍ය කාර්යාලයක් පවත්වාගෙන යාම.
152 අත් යන්ත්‍ර ක්‍රමයකින් හැර වෙනත් ක්‍රමයකින් රෙදි විවීම.
153 පුද්ගලික රෝහලක් හෝ සාත්තු නිවාසයක් පවත්වාගෙන යාම.
154 යතුරුපැදි අමතර කොටස් වෙළඳාම් කරන ස්ථානයක් පවත්වාගෙන යාම.
155 වතුර බව්සර් කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම.
156 වාහන විදුලි කර්මාන්ත කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම.
157 කාඩ්බෝඩ් ඇසුරුම් හා විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම.
158 ඡායාරූප උපකරණ වෙළඳාම හා අළුත්වැඩියා කරන ස්ථානයක් පවත්වාගෙන යාම.
159 ඡායාරූප ශාලාවක් පවත්වාගෙන යාම.
160 ඡායාරූප මුද්‍රණය කිරීමේ ස්ථානයක් (කලර් ලැබ්) පවත්වාගෙන යාම.
161 වේවැල් භාණ්ඩ වෙළඳාම් කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම.
162 සෙලියුලර් දුරකථන වෙළඳාම් කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම හා අළුත්වැඩියා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම.
163 පා පැදි අමතර කොටස් වෙළඳාම් කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම.
164 දුරකථන එකලස් කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම.
165 මැණික් අලෙවිය සඳහා ස්ථානයක් පවත්වාගෙන යාම.
166 බඩු උකස් ගන්නා ස්ථානයක් පවත්වාගෙන යාම.
167 පෞද්ගලික උපකාරක පන්ති පවත්වාගෙන යාමේ ස්ථානයක් පවත්වාගෙන යාම.
168 බලයලත් මත්පැන් විකිණීම හා නිෂ්පාදනය කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම.
169 බීර, වෙළඳාම් කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම.
170 දුරකථන සංඥා කුළුනක් පවත්වාගෙන යාම.

## උපලේඛන - අංක III

*වෙළඳ ව්‍යාපාර සම්බන්ධයෙන් බද්ද - 247 (ඇ) වගන්තිය*
*(අ) බදු චක්‍රය*

වෙළඳ ව්‍යාපාරයේ බද්ද ගෙවිය යුතු වර්ෂයට පෙර වර්ෂයේ ලැබීම්වලට අනුව පහත සඳහන් පරිදි ගාස්තු අය කෙරේ:

| *වෙළඳ ව්‍යාපාරයේ ලැබීම්* | | *ගාස්තුව* |
|---|---|---|
| *රු.* | *රු.* | *රු.* |
| 6,000 දක්වා | - | නැත |
| 6,001 | 12,000 | 100 |
| 12,001 | 18,750 | 180 |
| 18,751 | 75,000 | 360 |
| 75,001 | 1,50,000 | 1,200 |
| 1,50,000ට වැඩි | - | 3,000 |

*(අ)* ව්‍යාපාර ලැයිස්තුව :

*(ඒ)* වෘත්තීය රැකියා පුහුණුව හෝ කැඳවීම :

කොමිස් ඒජන්තවරු
ගොඩනැගිලි කොන්ත්‍රාත්කරුවෝ
මුදල් ණයට දෙන්නෝ
බ්‍රෝකර්වරුන්
වෙන්දේසිකරුවන්
මුදල් ආයෝජකයන්
පෞද්ගලික අධ්‍යාපන ආයතන පවත්වන්නන්
ගෘහ නිර්මාණ ශිල්පීන්
ප්‍රචාරක දැන්වීම් උපදේශක
ජීවිත සහතික පිළිබඳ ගණන් තැබීමේ හා සකස් කිරීමේ විශේෂඥයා
පාරිසරික උපදේශක ආයතන
පෞද්ගලික ආරෝග්‍යශාලාවක් පවත්වාගෙන යාම
ආයෝජන උපදේශක
ශරීරාවයන් හි ක්‍රියාකිරීම පිළිබඳ චිකිත්සක

මිනින්දෝරු/බිම සමතලාකරු.
අයබදු උපදේශක.
සත්ව සායන ආයතනයක් පවත්වාගෙන යාම.
ඉහත සඳහන් කර නොමැති වෘත්තීය රැකියා පුහුණුවක් හෝ රැකියාවට කැඳවීම

*(බී)* ව්‍යාපාරය -

ප්‍රචාරක දැන්වීම් නියෝජිත ධුරය.
නියෝජිත ධුර ආයතනය.
නැව් බඩු බැහැර කිරීමේ සේවාව.
ගුවන් ප්‍රවේශපත්‍ර නියෝජිත ආයතනය.
මුදල් ආයෝජන ආයතනයක් පවත්වාගෙන යාම.
පරිගණක පුහුණු ආයතන.
පරිගණක පුහුණු සේවාව.
ප්‍රවාහන සේවා ආයතනයක් පවත්වාගෙන යාම.
ජාත්‍යන්තර පාසලක් පවත්වාගෙන යාම.
විදේශ සේවා රැකියා ආයතනයක් පවත්වාගෙන යාම.
චැනල් කිරීමේ ව්‍යාපාරික සේවාව.
ඇඳුම් සැකසීමේ පාසල.
නැටුම් පාසල.
රියැදුරු පාසල.
රැකියා නියෝජිත ධුරය.
ගාස්තු අයකරන පාසල.
ඇතුළත අලංකාර කරන්නන්.
ජලය විකුණන ස්ථානයක් පවත්වාගෙන යාම.
රසායනාගාර සේවාවක් පවත්වාගෙන යාම.
බඩු/මිටි/ලියකියවිලි එහා මෙහා ගෙන යන්නන්.
මෝටර් රථ කුලියට දීම හා බදු දීම.
කන්ටේනර් අංගනයක් පවත්වාගෙන යාම.
ප්‍රවාහන අංගනයක් පවත්වාගෙන යාම.

## උපලේඛන අංක IV

*247 (ඉ) යටතේ ඇතැම් ඉඩම් විකිණීම විෂයෙහි බදු නියම කිරීම*

මොරටුව මහ නගර සභා පාලන සීමාව තුළ පිහිටි යම් ඉඩමක් වෙන්දේසිකරුවකු විසින් හෝ බ්‍රෝකර් කෙනෙකු විසින් හෝ ඔහුගේ සේවකයකු නැතහොත් වෙනත් ආකාරයකින් විකුණනු ලැබුවහොත් ඒ විකිණීමෙන් ලැබෙන මුදලින් 1%ට (සියයට එකකට) සමාන බද්දක් විකුණුම්කරු හෝ වෙන්දේසිකරු හෝ බ්‍රෝකර් හෝ ඔහුගේ සේවකයන් හෝ අනු නියෝජිතයා විසින් ගෙවිය යුතු ය.

තක්සේරු නොවූ දේපළ සඳහා මහ නගර සභාවේ ආදායම් පරීක්ෂකගේ තාවකාලික තක්සේරුව මත බලපත්‍ර ගාස්තු ගෙවිය යුතු ය. කර්මාන්ත විෂයෙහි බදු ගෙවිය යුතු ය.

**වාහන ගාස්තු අය කිරීම**

* මොරටුව මහ නගර සභා බල ප්‍රදේශය තුළ හඳුනාගෙන ඇති ත්‍රිරෝද රථ ගාල් සඳහා ගාල් ගාස්තු වශයෙන් වාර්ෂිකව රු.500.00 ක් ගෙවිය යුතු ය. ඉහත ගාස්තු සඳහා අදාළ බදු මුදල් ද ගෙවිය යුතු ය.

* පාපැදි බලපත්‍ර ගාස්තු රු. 5.00ක් ද, දෙපාර්තමේන්තු ගාස්තු වශයෙන් රු. 35.00ක් ද අයකරනු ලැබේ,

* වෙළඳ කරත්ත/වෙළඳ පා පැදි බලපත්‍ර ගාස්තු රු. 15.00ක් ද දෙපාර්තමේන්තු ගාස්තු වශයෙන් රු. 35.00ක් ද අයකරනු ලැබේ.

*ආකාශ කොඩි (බැනර්) සහ කටවුට්*

| | *ගාස්තුව (වර්ග අඩියකට) රු. ශත* |
|---|---|
| මුදල් ඉපයීමේ කාර්යයක් නොවන විට | 15.00 |
| මුදල් ඉපයීමේ කාර්යයක් වන විට | 25.00 |
| ආධාරකයක එල්ලා තබනු ලබන කටවුට් සඳහා | 30.00 |
| ඉඩම් විකිණීමේ/වෙන්දේසි කිරීමේ කාර්යයන් සඳහා | 75.00 |

මෙම ගාස්තු සති දෙකක කාලයක් සඳහා වන අතර, අතිරේක සතියකට හෝ ඉන් කොටසකට 25%ක අතිරේක ගාස්තුවක් අය කරනු ලැබේ. සති තුනක ප්‍රදර්ශනයකින් පසු නැවත ප්‍රදර්ශනය කිරීම අවශ්‍ය නම්, නැවත මුල් ගාස්තුව අය කරනු ලැබේ.

ඉහත ගාස්තුවලට අතිරේකව එකතු කළ අගය මත රජයෙන් පනවන බදු අයකරනු ලැබේ.

*වර්ෂ 2017 ක්වූ ජනවාරි මස 01 වැනි දින සිට ක්‍රියාත්මක වන පරිදි මොරටුව මහ නගර සභා සීමාව තුළ ප්‍රචාරය කරනු ලබන*
*ප්‍රචාරක දැන්වීම් ප්‍රදර්ශනය සඳහා ගාස්තු අය කිරීම*

*උපලේඛනය - V*

| අනු. අංකය | ප්‍රචාරක දැන්වීම් විස්තරය | දැන්වීම් පුවරු ගාස්තු මාසයක් හෝ ඉන් කොටසකට රු. ශත | මසකට වැඩි අවුරුද්දක් හෝ ඉන් කොටසක් සඳහා රු. ශත |
|---|---|---|---|
| 01. | වේදිකා නාට්‍යයක් හෝ නාට්‍යයක්, සිනමා ලේඛිත ප්‍රසංගයක් නොවන වෙනත් ප්‍රසංගයක් පිළිබඳව බිත්තියක හෝ පුවරුවක ප්‍රදර්ශනය කරන ප්‍රචාරක දැන්වීමක් සඳහා වර්ග මීටර් 0.09ට හෝ ඉන් කොටසකට. | 20.00 | 200.00 |
| 02. | සිනමා ලේඛිත ප්‍රසංගයක් පිළිබඳව, බිත්තියක හෝ පුවරුවක ප්‍රදර්ශනය කරන ප්‍රචාරක දැන්වීමක් සඳහා වර්ග මීටර් 0.09ට හෝ ඉන් කොටසකට. | 30.00 | 300.00 |
| 03. | සිනමා ලේඛිත ප්‍රසංගයක් පිළිබඳව, බිත්තියක හෝ පුවරුවක ප්‍රදර්ශනය කරන ප්‍රදීප්ත ප්‍රචාරක දැන්වීමක් සඳහා වර්ග මීටර් 0.09ට හෝ ඉන් කොටසකට. | 50.00 | 500.00 |
| 04. | සිනමා ලේඛිත ප්‍රසංගයක් හෝ වෙනත් යම් ප්‍රසංගයක් සම්බන්ධ ප්‍රචාරක දැන්වීමක් නොවන්නාවූ ද, බිත්තියක හෝ පුවරුවක ප්‍රදර්ශනය කර ඇත්තා වූ ද, ප්‍රචාරක දැන්වීමක් සඳහා එක් වර්ග මීටර් 0.09 හෝ ඉන් කොටසකට. | 15.00 | 150.00 |
| 05. | සිනමා ලේඛිත ප්‍රසංගයක් සම්බන්ධ ප්‍රචාරක දැන්වීමක් නොවන ප්‍රදීප්ත ප්‍රචාරක දැන්වීමක් සඳහා එක් වර්ග මීටර් 0.09 හෝ ඉන් කොටසකට. | 25.00 | 250 0 |

06. දැන්වීම් පුවරුවක හෝ ආධාරකයක ප්‍රදර්ශනය කෙරෙන්නා වූ ද, යම් තැනැත්තෙකු විසින් ගෙන යනු ලබන්නා වූ, නැතහොත් ධාවනය වන වාහනයක සවිකර ඇත්තා වූ ප්‍රචාරක දැන්වීමක් සඳහා :

| | වර්ග අඩි 1 සඳහා | ගාස්තු රු. ශත |
|---|---|---|
| 1. | විදුලි ආලෝකය රහිත දැන්වීම් පුවරු (වර්ග අඩි 50ට අඩු) | 100 0 |
| 2. | විදුලි ආලෝකය රහිත දැන්වීම් පුවරු (වර්ග අඩි 50ට වැඩි) - | 150 0 |
| 3. | විදුලි ආලෝකය සහිත දැන්වීම් පුවරු | 200 0 |
| 4. | පුළුල් තිරයේ LED දැන්වීම් පුවරුවක් ප්‍රදර්ශනය වර්ග අඩියකට | 2,500 0 |
| | පුළුල් තිරයේ LED දැන්වීම් පුවරුවක් ප්‍රදර්ශනය දිනක් සඳහා | 500 0 |
| 5. | වාර්ෂිකව ගෙවිය යුතු දැන්වීම් පුවරු ගාස්තු අදල දිනයේ දී නොගෙවන්නේ නම් එම අනවසර දැන්වීම් පුවරු ඉවත් කිරීමේ දී සිදුවන (ස්ථාවර ගාස්තුවක් ලෙස) අය කරනු ලබන ගාස්තුව<br>ඉහත ගාස්තුවලට අමතරව රජය විසින් ගෙවන ලද බදු අය කරනු ලැබේ. | 5,000 0 |
| 07. | නගර සභාවට අයත් භූමියක දැන්වීම් පුවරුවක් ප්‍රදර්ශනය කරන්නේ නම් ගාස්තුවලට අමතරව බිම් කුලිය ලෙස එක් වර්ෂයකට ගෙවිය යුතු මුදල (අවම වර්ගඵලය වර්ග අඩි 200 ක් සඳහා) | 25,000 0 |
| | වැඩි වන සෑම වර්ග අඩියක් සඳහා ගෙවිය යුතු බිම් කුලිය | 25 0 |

ඉහත ගාස්තුවලට අමතරව රජය විසින් පනවන ලද බදු අයකරනු ලැබේ.

*අර්ථ නිරූපනය :-*

"ප්‍රචාරක දැන්වීම්'' යන්නට ඉඩමක්, ගොඩනැගිල්ලක් හෝ නිර්මිතයක් හෝ ඉහලින් හෝ ඒ මත සම්පූර්ණයෙන්ම හෝ අර්ධ වශයෙන් හෝ ප්‍රචාරක දැන්වීම් කාර්ය සඳහා යොදා ගනු ලබන හෝ ඒ ස්වභාවයෙන් වූ යම් වචනයක්, අක්ෂරයක්, අංකයක්, සළකුණක්, පුවරුවක්, දැන්වීමක්, උපක්‍රමයක්, අනුරුවක් හෝ නිරූපණයක් ඇතුළත් වේ.

"දැන්වීම් පුවරුව" යන්නෙන් යම් නිර්මිතයක්, ආධාරකයක්, කණුවක්, පුවරුවක්, බිත්ති ප්‍රදර්ශන පුවරුවක් හෝ ප්‍රචාරක දැන්වීමක්, ප්‍රදර්ශනය කිරීමේ කාර්ය සඳහා උපයෝගී කර ගන්නා වෙනත් කවර හෝ උපක්‍රමයක් අදහස් වේ. තව ද,

"ගුවන් පුවරුව" යන්නෙන් යම් ඉඩමකට, ගොඩනැගිල්ලකට හෝ වෙනත් නිර්මිතයකට ඉහලින් හෝ ඒ මත කණුවකට, රිටකට, ස්ථම්භයකට, රාමු තට්ටුවකට හෝ වෙනත් ආධාරකයක් සවිකර ඇති හෝ ඒ මත රඳවා ඇත්තා වූ ද, යම් වීදියක, පාරක, ඇළක හෝ වැවක යම් ලක්ෂයක සිට අහස පසුතලය වශයෙන් ඇතිව සම්පූර්ණයෙන්ම හෝ අර්ධ වශයෙන් දෘෂ්‍යමානව ඇත්තා වූ ද, ප්‍රචාරක කාර්යය සඳහා උපයෝගි කර ගන්නා යම් වචනයක්, අක්ෂරයක්, අනුරුවක්, සළකුණක්, උපක්‍රමයක් හෝ නිරූපණයක් අදහස් වේ.

10-1636/1

---

## මොරටුව මහ නගර සභාව

### 2017 වර්ෂයට විනෝද බදු ගාස්තු පැනවීම

#### යෝජනාව

(267 වන අධිකාරය වූ) විනෝද බදු ආඥාපනතේ 2 වන වගන්තියේ (I) වන උපවගන්තියෙන් පැවරී ඇති බලතල ප්‍රකාර මොරටුව මහ නගර සභාව, සභාවේ පරිපාලන සීමා ඇතුළත වූ ප්‍රදේශයෙහි වූ පවත්වනු ලබන, එකී ආඥාපනතේ විස්තර කර ඇති යම් විනෝද කටයුත්තකට ඇතුළුවීම පිණිස කරනු ලබන ගෙවීමකින් (විනෝද බදු හැර) සියයට 25%කට සමාන බද්දක් පනවා අයකළ යුතු ය යි ද, මෙම යෝජනා සම්මතය *ගැසට් පත්‍රයේ* පළ කරන ලද මාසයට ඉක්බිතිව එළඹෙන මාසයේ පළමුවන දින සිට ක්‍රියාත්මක විය යුතු යැයි ද යෝජනා කරන්නී ය.

එසේ වුවද මෙම යෝජනා සම්මතය ක්‍රියාක්මත වන පළමු දෙවසර ඇතුළත චිත්‍රපටියක් නැරඹීමට ගෙවනු ලබන ගාස්තුවක් මත අයකළ යුතු බදු මුදල එසේ ගෙවන ලද ගාස්තුවෙන් සියයට හතයි දශම පහක් විය යුතු ය.

විනෝද බදු ආඥාපනතේ බදු අයකිරීම පිණිස සෑම චිත්‍රපටි දර්ශනයක්, මැජික් දර්ශනයක්, සර්කස් දර්ශනයක් හා සෑම සංගීත සංදර්ශනයක් හෝ වෙනත් සංදර්ශනයක් සඳහා අලෙවි කරනු ලබන ප්‍රවේශ පත්‍රවල වටිනාකමින් 25%ක විනෝද බද්දක් පනවා අය කිරීමට තීරණය කර ඇත.

එම්. එම්. සී. කේ. කේ. මාන්නප්පෙරුම,
නාගරික කොමසාරිස්,
බලතල, කාර්ය, කර්තව්‍ය, ක්‍රියාත්මක කිරීමේ නිලධාරි,
මොරටුව මහ නගර සභාව.

2016 ඔක්තෝබර් මස 10 වැනි දින,
මොරටුව මහ නගර සභා කාර්යාලයේ දී ය.

10- 1636/2

---

## කොටපොල ප්‍රාදේශීය සභාව

### කසල ශෝධන ගාස්තු අය කිරීම

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 122 වගන්තිය සහ 126 ix(ආ) වගන්තිය ප්‍රකාරව ලැබී ඇති බලතල මත කොටපොල ප්‍රාදේශීය සභාව විසින් 2007.11.30 වැනි දින සම්මත කරගත් 1988.08.23 වැනි දින 520/7 පොදු අතුරු ව්‍යවස්ථාවේ (04) අනුව කසළ ශෝධන සේවා මගින් සේවය සපයනු ලබන යම් ස්ථානයක පදිංචිකරුවකු/ව්‍යාපාරිකයකු වෙනුවෙන් පහත සඳහන් පරිදි කසල ශෝධන සේවා ගාස්තුවක් 2017 ජනවාරි මාසයේ සිට මාස්පතා අය කිරීමට 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9(3) වගන්තිය යටතේ කොටපොල ප්‍රාදේශීය සභාවේ ලේකම්, මුදලිගේ ජිනදාස වන මා විසින් තීරණ අංක 323 ( x ) යටතේ තීරණය කරන ලද බව මෙයින් දන්වා සිටිමි.

| | | රු. ශත |
|---|---|---|
| 01. | සර්විස් සෙන්ටර්/ගරාජ් | 500 0 |
| 02. | හෝටලයක්/ආපන ශාලාවක් සඳහා බාබර් සාප්පු | 300 0 |
| 03. | පළතුරු/එළවළු කඩයක් සඳහා | 400 0 |
| 04. | වෙනත් ව්‍යාපාර | 200 0 |
| 05. | ගෘහස්ථ | 100 0 |

මුදලිගේ ජිනදාස,
ලේකම්,
කොටපොල ප්‍රාදේශීය සභාව,
දෙනියාය.

2016 අගෝස්තු මස 25 වැනි දින,
දෙනියාය,
කොටපොල ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

10-1657/10

---

## කොටපොල ප්‍රාදේශීය සභාව

### අක්කර බදු - 2017 වර්ෂය

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ,

*(අ)* 146 වැනි වගන්තියේ (3) වැනි උපවගන්තියෙන් පැවරී ඇති බලතල ප්‍රකාර කොටපොල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ පිහිටි අක්කර බද්දට අයත් සෑම ඉඩමක 2016 වර්ෂයේ බලාත්මක වූ සතොයක්ෂණය 2017 වර්ෂයේ සතොයක්ෂණය ලෙස පිළිගැනීමට,

*(ආ)* 134 වැනි වගන්තියේ (3) වැනි උපවගන්තියෙන් පැවරී ඇති බලතල ප්‍රකාර එකී උපවගන්තියේ පළමු අතුරු විධානය යටතේ 1989.03.10 දිනැති *ගැසට් පත්‍රයේ* පළ කරන ලද නියමයකින් අක්කර බද්ද නියම කිරීමේ සහ අය කිරීමේ කාර්යය සඳහා පළාත් පාලන අමාත්‍යවරයා විසින් විශේෂ ප්‍රදේශයක් ලෙස ප්‍රකාශයට පත් කරන ලද ප්‍රදේශයේ පිහිටි හෙක්ටයාර් 1 ට නොඅඩු එහෙත් හෙක්ටයාර් 5 ට අඩු සෑම ඉඩමක් මත රුපියල් පනහක (50.00) අනුප්‍රමාණය අනුව වූ අක්කර බද්දක් සහ හෙක්ටයාර් 5 ක් හෝ ඊට වැඩි සෑම ඉඩමක සෑම හෙක්ටයාරයක් මත රුපියල් දහය (10.00) බැගින් වූ අක්කර බද්දක් 2017 වර්ෂයට පනවා අය කිරීමට; සහ

*(ඇ)* 134 වැනි වගන්තියේ (06) වැනි උපවගන්තියෙන් පැවරී ඇති බලතල ප්‍රකාරව යථෝක්ත බද්ද 2017 මාර්තු මස 31, ජුනි මස 30 සැප්තැම්බර් මස 30 හා දෙසැම්බර් මස 31 යන දිනයන්වලින් අවසන් වන කාර්තු 04 තුළ දී සමාන වාරික 04 කින් ප්‍රාදේශීය සභාවට ගෙවනු ලැබිය යුතු යැයි 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9(3) වගන්තිය යටතේ විධානය කිරීමට කොටපොල ප්‍රාදේශීය සභාවේ ගරු ලේකම් මුදලිගේ ජිනදාස වන මා විසින් තීරණ අංක 323 (viii) යටතේ තීරණය කරන ලද බව මෙයින් දන්වා සිටිමි.

මුදලිගේ ජිනදාස,
ලේකම්,
කොටපොල ප්‍රාදේශීය සභාව.
දෙනියාය.

2016 අගෝස්තු මස 25 වැනි දින,
දෙනියාය,
කොටපොල ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

10-1657/8

## කොටපොල ප්‍රාදේශීය සභාව

### වරිපනම් බද්ද - 2017 වර්ෂය

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ -

*(අ)* 146 වැනි වගන්තියේ (I) වැනි උපවගන්තියෙන් පැවරී ඇති බලතල ප්‍රකාරව කොටපොල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ දියුණු කළ ප්‍රදේශයක් ලෙස ප්‍රකාශයට පත් කරන ලද ප්‍රදේශයේ පිහිටි සෑම නිශ්චල දේපළක 2016 වර්ෂයේ දී බලපැවැත් වූ වාර්ෂික වටිනාකම 2017 වර්ෂයේ වාර්ෂික වටිනාකම ලෙස පිළිගැනීමට ;

*(ආ)* 134 වැනි වගන්තියේ (I) වැනි උපවගන්තියෙන් පැවරී ඇති බලතල ප්‍රකාරව කොටපොල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ දියුණු කළ ප්‍රදේශයක් ලෙස ප්‍රකාශයට පත් කරන ලද ප්‍රදේශය තුළ පිහිටි සෑම නිශ්චල දේපළක වාර්ෂික වටිනාකමින් 6%ක වරිපනම් බද්දක් 2017 වර්ෂයේ දී පනවා අය කිරීමට ; සහ

*(ඇ)* 134 වැනි වගන්තියේ (06) වැනි උපවගන්තියෙන් පැවරී ඇති බලතල ප්‍රකාරව යථොක්ත වාර්ෂික වරිපනම් බද්ද 2017 මාර්තු 31, ජුනි, 30 සැප්තැම්බර් 30 හා දෙසැම්බර් 31 යන දිනයන්වලින් අවසන් වන කාර්තු 04 තුළදී සමාන වාරික 04කින් ප්‍රාදේශීය සභාවට ගෙවනු ලැබිය යුතු යැයි 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9(2) වගන්තිය යටතේ විධාන කිරීමට කොටපොල ප්‍රාදේශීය සභාවේ ගරු ලේකම් මුදලිගේ ජිනදාස වන මා විසින් තීරණ අංක 323(1) යටතේ තීරණය කරන ලද බව මෙයින් දන්වා සිටිමි.

මුදලිගේ ජිනදාස,
ලේකම්,
කොටපොල ප්‍රාදේශීය සභාව,
කොටපොල.

2016 අගෝස්තු මස 25 වැනි දින,
දෙනියාය,
කොටපොල ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

10-1657/1

---

## කොටපොල ප්‍රාදේශීය සභාව

### 2017 වර්ෂය සඳහා ව්‍යාපාර බද්ද පැනවීම

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 152 වැනි වගන්තියේ I වැනි උපවගන්තියෙන් ප්‍රාදේශීය සභාවට ලැබී ඇති බලතල ප්‍රකාරව එකී පනතේ හෝ ඒ යටතේ සාදන ලද යම් අතුරු ව්‍යවස්ථාවක විධිවිධාන යටතේ බලපත්‍රයක් ලබා ගැනීම හෝ එකී පනතේ 150 වැනි වගන්තිය යටතේ යම් කර්මාන්ත බද්දක් ගෙවීම අවශ්‍ය නොවන්නා වූ හා කිසියම් ව්‍යාපාරයක් කොටපොල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය ඇතුළත 2017 වර්ෂයේ දී කරගෙන යනු ලබන සෑම තැනැත්තෙකුගේ ම එකී ව්‍යාපාරයේ ඊට පෙර වර්ෂයේ ලැබීම් මෙහි පහත උපලේඛන I වැනි තීරුවේ නිරූපිත යම් විෂයාංකයක සීමාවක් ඇතුළත පවත්නා අවස්ථාවක එහි II වැනි තීරුවේ අනුරූපිත අනුප්‍රමාණය අනුව වූ ව්‍යාපාර බද්දක් 2017 වර්ෂය සඳහා පනවා අයකිරීමටත්, බද්දට යටත් යම් තැනැත්තෙකු 2017 වර්ෂයේ අප්‍රේල් මස 30 වැනි දිනට පෙර ගෙවිය යුතු බවට 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9(3) වගන්තිය යටතේ කොටපොල ප්‍රාදේශීය සභාවේ ගරු ලේකම් මුදලිගේ ජිනදාස වන මා විසින් තීරණ අංක 323(IV) යටතේ තීරණය කරන ලද බව මෙයින් දන්වා සිටිමි.

මුදලිගේ ජිනදාස,
ලේකම්,
කොටපොල ප්‍රාදේශීය සභාව,

2016 අගෝස්තු මස 25 වැනි දින,
දෙනියාය,
කොටපොල ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

| *ව්‍යාපාරයේ ආදායම* | *ගෙවිය යුතු බද්ද රු. ශත* |
|---|---|
| 1. රු. 6,000 සිට රු. 12,000 දක්වා | 90 0 |
| 2. රු. 12,000 සිට රු. 18,750 දක්වා | 180 0 |
| 3. රු. 18,750 සිට රු. 75,000 දක්වා | 360 0 |
| 4. රු. 75,000 සිට රු. 1,50,000 දක්වා | 1,200 0 |
| 5. රු. 1,50,000ට වැඩි | 3,000 0 |

### උපලේඛනය

1. රෙදි පිළි, නිමි ඇඳුම් අලෙවිසැලක් පැවැත්වීම
2. සාප්පු බඩු අලෙවි සැලක් පැවැත්වීම
3. පාවහන් අලෙවි සැලක් පැවැත්වීම
4. සන්නිවේදන මධ්‍යස්ථානයක් පැවැත්වීම
5. ඡායාරූප ශාලාවක් පැවැත්වීම
6. වර්ණ රසායනාගාරයක් පැවැත්වීම
7. අපනයනය සඳහා තේ සැකසුම් මධ්‍යස්ථානයක් පැවැත්වීම
8. අමු තේ දළු එකතු කිරීමේ මධ්‍යස්ථානයක් පැවැත්වීම
9. තේ කර්මාන්ත ශාලාවක් පැවැත්වීම
10. ගොඩනැගිලි ද්‍රව්‍ය විකිණීමේ ව්‍යාපාරයක් පවත්වාගෙන යාම
11. තීන්ත අලෙවි කිරීමේ ව්‍යාපාරයක් පවත්වාගෙන යාම
12. යකඩ බඩු (හාඩ්වෙයාර්) විකිණීමේ ව්‍යාපාරයක් පවත්වාගෙන යාම
13. පෞද්ගලික අධ්‍යාපන ආයතනයක් පවත්වාගෙන යාම
14. පෙර පාසල්, දිවා සුරැකුම් මධ්‍යස්ථානයක් පවත්වාගෙන යාම
15. පරිගණක මෘදුකාංග සංවර්ධන මධ්‍යස්ථානයක් පවත්වාගෙන යාම
16. පරිගණක පුහුණු පාඨමාලාවක් පවත්වාගෙන යාම
17. ජ්‍යොතිෂ සේවා සපයන ආයතනයක් පවත්වාගෙන යාම
18. රියැදුරු පුහුණුව සපයන ආයතනයක් පවත්වාගෙන යාම
19. පැල තවානක් (නර්සරි) පවත්වාගෙන යාම
20. ආයුර්වේද බෙහෙත් බඩු වෙළෙඳාම් කරන ස්ථානයක් පවත්වාගෙන යාම
21. ඉංග්‍රීසි බෙහෙත් වෙළෙඳාම් කරන ස්ථානයක් (ෆාමසි) පවත්වාගෙන යාම
22. දුරකථන සේවා සපයන සමාගම් පවත්වාගෙන යාම
23. බටහිර වෛද්‍ය මධ්‍යස්ථානයක් පවත්වාගෙන යාම
24. වෛද්‍ය රසායනාගාරයක් පවත්වාගෙන යාම
25. සත්ත්ව සායනයක් පවත්වාගෙන යාම
26. නීතිඥ නොතාරිස් සේවාව සපයන ආයතන
27. විගණන හෝ ගණකාධිකාරි හෝ සේවා සපයන ආයතන
28. බැංකුවක් පවත්වාගෙන යාම
29. රක්ෂණ සේවා සපයන ස්ථානයක් පවත්වාගෙන යාම
30. ලීසිං සේවා සපයන ආයතනයක් පවත්වාගෙන යාම
31. මිනින්දෝරු සේවා සපයන ආයතන පවත්වාගෙන යාම
32. ගෘහ නිර්මාණ සේවා සපයන ආයතන පවත්වාගෙන යාම
33. වාස්තු විද්‍යා සේවා සපයන ස්ථාන පවත්වාගෙන යාම
34. ඉංජිනේරු සේවා සපයන ස්ථාන පවත්වාගෙන යාම
35. විශේෂඥ සේවා සපයන ආයතන පවත්වාගෙන යාම
36. පෞද්ගලික රෝහලක් පවත්වාගෙන යාම
37. ඇඟලුම් කම්හල් පවත්වාගෙන යාම
38. ස්වර්ණාභරණ විකිණීමේ ස්ථාන
39. පරිගණක හා උපාංග විකිණීමේ ස්ථාන
40. ලී බඩු විකිණීමේ ස්ථාන පවත්වාගෙන යාම
41. ප්‍රචාරක කටයුතු කිරීමේ ආයතන පවත්වාගෙන යාම
42. උත්සව භාණ්ඩ කුළියට දීමේ ආයතන පවත්වාගෙන යාම
43. ඇස් කණ්ණාඩි සාප්පුවක් පවත්වාගෙන යාම
44. ලොතරැයි නියෝජිත ආයතනයක් පවත්වාගෙන යාම
45. පිඟන් මැටි ආශ්‍රිත නිෂ්පාදන අලෙවිකිරීම
46. රේස් බුකියක් පවත්වාගෙන යාම
47. නියෝජිත තැපැල් කාර්යාලයක් පැවැත්වීම
48. පින්තූර රාමු කිරීම හා වීදුරු කැපීමේ ස්ථාන
49. රබර් කුරුඳු මිලට ගන්නා ස්ථානයක්
50. දුරකථන සේවා සපයන ආයතනයක්
51. ජංගම දුරකථන අලෙවි කරන ස්ථාන
52. රැකියා නියෝජිත ස්ථානයක් පවත්වාගෙන යාම
53. උකස් බඩු ගන්නා ස්ථානයක් පවත්වාගෙන යාම
54. වීඩියෝ පට සංයුක්ත පටි විකිණීම හෝ කුළියට දීම
55. ලිපි ද්‍රව්‍ය හෝ පොත් සාප්පුවක් පවත්වාගෙන යාම
56. ලී වෙළෙඳ සැලක් පවත්වාගෙන යාම
57. සිල්ලර වෙළෙඳ සැලක් පවත්වාගෙන යාම
58. සංගීත භාණ්ඩ හෝ ක්‍රීඩා භාණ්ඩ විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
59. ගබඩාවක් ලෙස කුළියට දෙන ස්ථාන
60. තොග වශයෙන් භාණ්ඩ විකිණීමේ ස්ථාන
61. විදුලි උපකරණ අලෙවි කිරීමේ ස්ථාන
62. ප්‍රසිද්ධ සමාගම්වල භාණ්ඩ බෙදා හැරීමේ නියෝජිත ආයතන
63. ප්‍රසිද්ධ සමාගම්වල භාණ්ඩ ප්‍රදර්ශනය කිරීමේ හා විකිණීමේ ස්ථාන
64. වාහන අලෙවි කිරීමේ ස්ථාන
65. යතුරු පැදි, ත්‍රිරෝද රථ අලෙවි කිරීමේ ස්ථාන
66. පා පැදි අලෙවි කිරීමේ ස්ථාන
67. වාහන අමතර කොටස් අලෙවි කිරීමේ ස්ථාන
68. යතුරු පැදි, ත්‍රිරෝද රථ අමතර කොටස් අලෙවිය
69. ඉන්ධන පිරවුම්හලක් පවත්වාගෙන යාම
70. අරක්කු, බියර් විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
71. සිනමා ශාලාවක් පවත්වාගෙන යාම
72. රූපලාවන්‍යාගාරයක් පවත්වාගෙන යාම
73. රියදුරු පුහුණු ආයතන
74. මැණික් මිලදී ගන්නා ස්ථාන හා මැණික් කැපීම
75. විදේශ රැකියා නියෝජිත ආයතන
76. ෆුඩ් සිටියක් පැවැත්වීම
77. දුරකථන පෙර ගෙවුම් කාඩ් අලෙවි කරන ස්ථාන
78. බුලත් හා ටොෆි විකුණන ස්ථාන
79. සත්ත්ව ආහාර විකිණීම
80. සුරුට්ටු හා දුංකොළ අලෙවි කිරීමේ ස්ථානයක්
81. විසිතුරු මසුන් අලෙවි කිරීම
82. ගොඩනැගිලි ද්‍රව්‍ය අලුත්වැඩියා කිරීම
83. කාය වර්ධන මධ්‍යස්ථානයක් පවත්වාගෙන යාම

10-1657/4

## කොටපොල ප්‍රාදේශීය සභාව

### 2017 වර්ෂය සඳහා කර්මාන්ත බදු පැනවීම

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 150 වගන්තියේ (1) වැනි උපවගන්තියේ ප්‍රාදේශීය සභාවට ලැබී ඇති බලතල ප්‍රකාර කොටපොල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය ඇතුළත කරගෙන යනු ලබන පහත උපලේඛනයේ I තීරුවේ සඳහන් එක් එක් කර්මාන්ත වෙනුවෙන් එම උපලේඛනයේ II වැනි තීරුවේ එක් එක් කර්මාන්ත පවත්වාගෙන යනු ලබන ස්ථානයේ වාර්ෂික වටිනාකම අනුරූප තීරුවේ නිරූපිත ප්‍රමාණයක කර්මාන්ත බද්දක් 2017 වර්ෂය සඳහා පනවා අය කළ යුතු බවත්, එකී කර්මාන්ත බද්දට යටත් තැනැත්තෙකු 2017 වර්ෂයේ අප්‍රේල් මස 30 වැනි දිනට පෙර කොටපොල ප්‍රාදේශීය සභාවට ගෙවිය යුතු බව 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9 (3) වගන්තිය යටතේ කොටපොල ප්‍රාදේශීය සභාවේ ගරු ලේකම් මුදලිගේ ජිනදස වන මා විසින් තීරණ අංක 323 iii යටතේ තීරණය කරන ලද බව මෙයින් දන්වා සිටිමි.

මුදලිගේ ජිනදස,
ලේකම්,
කොටපොල ප්‍රාදේශීය සභාව,
දෙනියාය.

"2016 අගෝස්තු මස 25 වැනි දින,
කොටපොල ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

**උපලේඛනය**

*1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 150 වැනි වගන්තිය යටතේ කර්මාන්ත බදු.*

| *I වැනි තීරුව* | *II වැනි තීරුව* | | |
|---|---|---|---|
| *වෙළඳාමේ ස්වභාවය* | *වාර්ෂික වටිනාකම රු. 750 නොඉක්මවන විට* | *වාර්ෂික වටිනාකම රු. 750 සිට 1,500 දක්වා* | *වාර්ෂික වටිනාකම රු. 1,500 ට වැඩි නොවන විට* |
| | *රු. ශත* | *රු. ශත* | *රු. ශත* |
| 1. ඇඳුම් මැසීම | 500 0 | 750 0 | 1,000 0 |
| 2. පා පැදි අළුත්වැඩියා කිරීම | 500 0 | 750 0 | 1,000 0 |
| 3. වී මෝල් | 500 0 | 750 0 | 1,000 0 |
| 4. යතුරු පැදි, ත්‍රීවීල් අළුත්වැඩියා කිරීම | 500 0 | 750 0 | 1,000 0 |
| 5. සිමෙන්ති ගඩොල් නිෂ්පාදනය | 500 0 | 750 0 | 1,000 0 |
| 6. ටයර්, ටියුබ් අළුත්වැඩියා කිරීම | 500 0 | 750 0 | 1,000 0 |
| 7. විදුලි උපකරණ අළුත්වැඩියා කිරීම | 500 0 | 750 0 | 1,000 0 |
| 8. පොල්තෙල් මෝලක් පැවැත්වීම | 500 0 | 750 0 | 1,000 0 |
| 9. ගුවන් විදුලි හා රූපවාහිනී යන්ත්‍ර අළුත්වැඩියා කිරීම | 500 0 | 750 0 | 1,000 0 |
| 10. ලියවන පට්ටලයක් පැවැත්වීම | 500 0 | 750 0 | 1,000 0 |
| 11. ඩිජිටල් තාක්ෂණයෙන් මුද්‍රණාලයක් පැවැත්වීම | 500 0 | 750 0 | 1,000 0 |
| 12. වඩු මඩුවක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 13. කුෂන් වැඩපලක් පැවැත්වීම | 500 0 | 750 0 | 1,000 0 |
| 14. ඔරලෝසු අළුත්වැඩියා කිරීම | 500 0 | 750 0 | 1,000 0 |
| 15. බීරළු, ලී කැටයම් වැඩ පලවල් | 500 0 | 750 0 | 1,000 0 |
| 16. ඉඳල්, පාපිසි, කොහු ආශ්‍රිත නිෂ්පාදන නිපදවීම හා විකිණීම | 500 0 | 750 0 | 1,000 0 |
| 17. හුණු පිළිස්සීම හෝ ගබඩා කිරීම | 500 0 | 750 0 | 1,000 0 |
| 18. කොප්පරා නිෂ්පාදනය | 500 0 | 750 0 | 1,000 0 |
| 19. රබර් නිෂ්පාදනය | 500 0 | 750 0 | 1,000 0 |
| 20. ගල් වලක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 21. කම්හලක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 22. වෙල්ඩින් වැඩපලක් | 500 0 | 750 0 | 1,000 0 |
| 23. මුද්‍රණාලයක් පැවැත්වීම | 500 0 | 750 0 | 1,000 0 |
| 24. වායුසමීකරණ, ශීතකරණ අළුත්වැඩියා කිරීම | 500 0 | 750 0 | 1,000 0 |

| *I වැනි තීරුව* *වෙළඳාමේ ස්වභාවය* | *II වැනි තීරුව* *වාර්ෂික වටිනාකම රු. 750 නොඉක්මවන විට* | *වාර්ෂික වටිනාකම රු. 750 සිට 1,500 දක්වා* | *වාර්ෂික වටිනාකම රු. 1,500 ට වැඩි නොවන විට* |
|---|---|---|---|
| | *රු. ශත* | *රු. ශත* | *රු. ශත* |
| 25. මැණික් කැපීම හා ඔප දැමීම | 500 0 | 750 0 | 1,000 0 |
| 26. ප්ලාස්ටික්, ෆයිබර් ග්ලාස් නිපදවන කර්මාන්ත | 500 0 | 750 0 | 1,000 0 |
| 27. මෝටර් රථ අළුත්වැඩියා කිරීම | 500 0 | 750 0 | 1,000 0 |
| 28. ලී මෝල් | 500 0 | 750 0 | 1,000 0 |
| 29. රන්, රිදී, ලෝහ ආලේප කිරීම | 500 0 | 750 0 | 1,000 0 |

10-1657/3

---

## කොටපොල ප්‍රාදේශීය සභාව

### වෙනත් ගාස්තු

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතින් කොටපොල ප්‍රාදේශීය සභාව වෙත පැවරී ඇති බලතල ප්‍රකාර පහත උපලේඛනයේ සඳහන් වෙනත් ගාස්තු 2017 ජනවාරි මස 01 වැනි දින සිට අයකිරීම සුදුසු බවට 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9 (3) වැනි වගන්තිය යටතේ කොටපොල ප්‍රාදේශීය සභාවේ ලේකම්, මුදලිගේ ජිනදස වන මා විසින් තීරණ අංක 323 (ix) යටතේ තීරණය කරන ලද බව මෙයින් දන්වා සිටිමි.

| | *රු. ශත* |
|---|---|
| 01. ඒ. ටී. පෝරම (ඔප්පු සාරාංශ පෝරම) | 150 0 |
| 02. ගොඩනැගිලි අයදුම්පත්‍ර ගාස්තු | 500 0 |
| 03. අනතුරුදායක ගස් කැපීමේ අයදුම් පත්‍ර ගාස්තු | |
| * කොස් ගසක් සඳහා | 1,000 0 |
| * වෙනත් ගසක් සඳහා | 250 0 |
| 04. ගොඩනැගිලි අයදුම්පතක් මත අනුකූලතා සහතිකයක් සඳහා | |
| * ව්‍යාපාරික ස්ථානයක් සඳහා | 1,000 0 |
| * පදිංචි ස්ථානයකට | 500 0 |
| 05. ගොඩනැගිලි අයදුම්පතක් කාලය දීර්ඝ කර ගැනීම සඳහා | |
| * එක් වර්ෂයකට | 1,000 0 |
| 06. වරිපනම් සහතික ගාස්තු | 150 0 |
| 07. ජල සහතික ගාස්තු | 100 0 |
| 08. වීථි රේඛා සහ නොපවරා ගැනීමේ සහතික ගාස්තු | 500 0 |
| 09. අයාලේ යන ගවයන් සඳහා (එක් ගවයෙකුට) | 500 0 |
| 10. කැබලි සැලසුම් අනුමත කිරීමේ පෝරම ගාස්තු | 300 0 |
| 11. කැබලි සැලසුම් අනුමත කිරීමේ ගාස්තු - එක් කැබැල්ලකට | 500 0 |
| 12. ඉඩම් අනු කොටස්වලට බෙදීමේදී කැබලි සැලසුම් අනුමත කිරීමේ ගාස්තු | |
| ව. මී. 150-300 දක්වා | 500 0 |
| ව. මී. 301-600 දක්වා | 400 0 |
| ව. මී. 601-900 දක්වා | 300 0 |
| ව. මී. 900ට වැඩි | 200 0 |

මුදලිගේ ජිනදස,
ලේකම්,
කොටපොල ප්‍රාදේශීය සභාව,
දෙනියාය.

2016 අගෝස්තු මස 25 වැනි දින,
කොටපොල ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

10-1657/9

## කොටපොල ප්‍රාදේශීය සභාව

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනත

### ප්‍රචාරක දැන්වීම් - දෘෂ්‍ය පරිසරය

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 221 *(ආ)* හා 122-126 වැනි වගන්තිවලින් පැවරී ඇති බලතල අනුව 1988.08.23 වැනි දින අංක 520/7 දරන පළාත් පාලන අති විශේෂ *ගැසට් පත්‍රයේ* IV *(අ)* කොටසේ ගරු ඇමතිතුමා විසින් ප්‍රකාශයට පත් කරන ලදුව 2008.11.30 වැනි දින අංක 1532 *ගැසට් පත්‍රයේ* නිවේදනයක් මගින් කොටපොල ප්‍රාදේශීය සභාව විසින් පිළිගෙන ඇති අතර, අතුරු ව්‍යවස්ථාවල 39 වැනි ඡේදය යටතේ කොටපොල ප්‍රාදේශීය සභා සීමාව තුළ ප්‍රචාරක දැන්වීම් (බැනර් ඇතුළුව) ඉදි කිරීම් හා ප්‍රදර්ශනය කිරීම වෙනුවෙන් පහත උපලේඛනයේ දැක්වෙන ගාස්තු 2017.01.01 වැනි දින සිට පනවා අය කරනු ලබන බවට 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9(3) වැනි වගන්තිය යටතේ කොටපොල ප්‍රාදේශීය සභාවේ ලේකම් මුදලිගේ ජිනදස වන මා විසින් තීරණ අංක 323VII යටතේ තීරණය කරන ලද බව මෙයින් දන්වා සිටිමි.

මුදලිගේ ජිනදස,
ලේකම්,
කොටපොල ප්‍රාදේශීය සභාව,
දෙනියාය.

2016 අගෝස්තු මස 25 වැනි දින,
දෙනියාය,
කොටපොල ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

*උපලේඛනය*

*ප්‍රචාරක දැන්වීම් විස්තරය :*

01. පෞද්ගලික පරිශ්‍රයේ ඉදිකරනු ලබන හෝ ප්‍රදර්ශනය කරන දැන්වීම් පුවරු සඳහා වර්ෂයකට
(ව. අඩි. 1 ක මිල රු. 30)
බැනර්/කටවුට් සඳහා (ව. අඩි 1ක මිල රු. 20)

02. මහා මාර්ගයට පෙනෙන පරිදි අවකාශී ඉඩකඩ භාවිතා කරමින් මහා මාර්ගයට යාබද ඉදිකරනු ලබන හෝ ප්‍රදර්ශනය කරනු ලබන පුවරු සඳහා වර්ෂයකට
(ව. අඩි. 1 ක මිල රු. 40)
බැනර්/කටවුට් සඳහා (ව. අඩි 1ක මිල රු. 20)

03. පළාත් පාලන ආයතන පරිශ්‍රයන් ප්‍රයෝජනයට ගනිමින් ඉදිකරනු ලබන හෝ ප්‍රදර්ශනය කරනු ලබන දැන්වීම් පුවරු සඳහා වර්ෂයකට
(ව. අඩි. 1 ක මිල රු. 100)
බැනර්/කටවුට් සඳහා (ව. අඩි 1ක මිල රු. 40)

04. පළාත් පාලන ආයතන විසින් ඉදි කරන ලද විශාල දැන්වීම් පුවරු භාවිතා කරමින් ප්‍රදර්ශනය කරනු ලබන දැන්වීම් සඳහා වර්ෂයකට
(ව. අඩි. 1 ක මිල රු. 75)
බැනර්/කටවුට් සඳහා (ව. අඩි 1ක මිල රු. 30)

10-1657/7

---

## කොටපොල ප්‍රාදේශීය සභාව

### 2017 වර්ෂයට බලපත්‍ර ලබාදීමේ දී ගාස්තු පැනවීම

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 149 වැනි වගන්තිය සමග කියවිය යුතු එකී පනතේ 147 වගන්තියේ (1) වැනි උපවගන්තියේ *(ආ)* ඡේදයේ පැවරී ඇති බලතල ප්‍රකාර ප්‍රාදේශීය සභා පනතේ හෝ ඒ යටතේ සාදන ලද 1988.08.23 දින අංක 520/7 සහ අති විශේෂ *ගැසට් පත්‍රය* මගින් ප්‍රකාශිත සම්මත අතුරු ව්‍යවස්ථා 2007.11.30 දින සභාව විසින් පිළිගෙන ඇති අතර, ඒ අනුව බලපත්‍රයක් ලබා ගත යුතු පහත I වැනි තීරුවේ පළවන පරිශ්‍රයක්, ස්ථානයක් සම්බන්ධයෙන් II වැනි තීරුවේ සඳහන් අනු ප්‍රමාණයෙන් යුත් බලපත්‍ර ගාස්තුවක් 2017 වර්ෂයට පනවා අයකිරීමටත්, 1968 අංක 14 දරන සංචාරක සංවර්ධන පනත අනුව සංචාරක මණ්ඩලයේ අනුමත

හෝටලයක්, ආපන ශාලාවක්, නවාතැන් පොළක් සඳහා බලපත්‍ර ලබාදීමේ දී අදාළ වර්ෂයට පෙර වර්ෂයේ ලැබීම්වලින් 1%ක බලපත්‍ර ගාස්තුවක් 2017 වර්ෂයට පනවා අයකිරීමටත් ඉහත සඳහන් සියලුම බලපත්‍ර 2017.03.31 දිනට පෙර අදාළ ස්ථානය විසින් ලබා ගත යුතු බව 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9(3) වගන්තිය යටතේ කොටපොල ප්‍රාදේශීය සභාවේ ගරු ලේකම් මුදලිගේ ජිනදස වන මා විසින් තීරණ අංක 323 II යටතේ තීරණය කරන ලද බව මෙයින් දන්වා සිටිමි.

මුදලිගේ ජිනදස,
ලේකම්,
කොටපොල ප්‍රාදේශීය සභාව,
දෙනියාය.

2016 අගෝස්තු මස 25 වැනි දින,
කොටපොල ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

**උපලේඛන අංක - 01**

***1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 149 වැනි වගන්තිය යටතේ වෙළෙඳ බලපත්‍ර ගාස්තු***

| *වෙළෙඳාමේ ස්වභාවය* | *වාර්ෂික වටිනාකම රු. 750 ඉක්මවන විට* | *වාර්ෂික වටිනාකම රු. 751-1,500 දක්වා* | *වාර්ෂික වටිනාකම රු. 1,501 ට වැඩි* |
|---|---|---|---|
| | *රු. ශත* | *රු. ශත* | *රු. ශත* |
| 01. බේකරියක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 02. බත් කඩයක් හෝ භෝජනාගාරයක් පැවැත්වීම | 500 0 | 750 0 | 1,000 0 |
| 03. තේ, කෝපි කඩයක් පැවැත්වීම | 500 0 | 750 0 | 1,000 0 |
| 04. ලැගුම්හලක් පැවැත්වීම | 500 0 | 750 0 | 1,000 0 |
| 05. බාබර් සාප්පුවක් පැවැත්වීම | 500 0 | 750 0 | 1,000 0 |
| 06. මස් වෙළෙඳ සැල් | 500 0 | 750 0 | 1,000 0 |
| 07. මාළු වෙළෙඳ සැල් | 500 0 | 750 0 | 1,000 0 |
| 08. ලොන්ඩරි | 500 0 | 750 0 | 1,000 0 |
| 09. සංචාරක වෙළෙඳාම | 500 0 | 750 0 | 1,000 0 |
| 10. සිසිල් බීම කර්මාන්ත ශාලා | 500 0 | 750 0 | 1,000 0 |
| 11. කිරි වෙළෙඳාම | 500 0 | 750 0 | 1,000 0 |
| 12. ගව ගාල් | 500 0 | 750 0 | 1,000 0 |
| 13. හෝටල් | 500 0 | 750 0 | 1,000 0 |
| 14. සාතක මඩු | 500 0 | 750 0 | 1,000 0 |
| 15. යෝගට් නිෂ්පාදනය | 500 0 | 750 0 | 1,000 0 |
| 16. අයිස්ක්‍රීම් - රසකැවිලි | 500 0 | 750 0 | 1,000 0 |

10-1657/2

---

**කොටපොල ප්‍රාදේශීය සභාව**

විනෝද බදු ආඥාපනත

විනෝද බදු ආඥාපනතේ 2 වැනි වගන්තියේ (1) උපවගන්තිය යටතේ අලෙවි කරනු ලබන මුළු ටිකට් පත්වල මුළු වටිනාකමින් 7.5% ක විනෝද බදු මුදලක් අයකිරීමට 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9 (3) වගන්තිය යටතේ කොටපොල ප්‍රාදේශීය සභාවේ ලේකම් මුදලිගේ ජිනදස වන මා විසින් තීරණ අංක 323(vi) යටතේ තීරණය කරන ලද බව මෙයින් දන්වා සිටිමි.

**ප්‍රසිද්ධ රඟ දැක්වීමේ ආඥාපනත**

*(176 )වැනි අධිකාරය ප්‍රසිද්ධ රඟ දැක්වීමේ ආඥාපනතේ 3 වැනි වගන්තිය ප්‍රකාර පැනවෙන බලපත්‍ර ගාස්තු :*

| | රු. ශත |
|---|---|
| 01. දින 01 කට | 500 0 |
| 02. ලිත් මාස 01 ක කාලයක් සඳහා | 10,000 0 |

මුදලිගේ ජිනදස,
ලේකම්,
කොටපොල ප්‍රාදේශීය සභාව,
දෙනියාය.

2016 අගෝස්තු මස 25 වැනි දින,
දෙනියාය,
කොටපොල ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

10-1657/6

---

## කොටපොල ප්‍රාදේශීය සභාව

2017 වර්ෂය සඳහා ඉඩම් විකිණීම මත බදු අය කිරීම

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 154(1) වැනි වගන්තිය ප්‍රකාර පරිදි කොටපොල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ පිහිටියා වූ යම් ඉඩමක් වෙන්දේසිකරුවෙකු හෝ තැරැව්කරුවෙකු හෝ ඔහුගේ සේවකයා හෝ අනු නියෝජිතයා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ හෝ අන්‍ය ආකාරයකින් විකුණනු ලබන අවස්ථාවක, ඒ ඉඩම විකිණීමෙන් ලත් මුදලින් 1%කට සමාන බද්දක්, විකුණුම්කරු හෝ වෙන්දේසිකරු හෝ ඔහුගේ සේවකයා හෝ අනු නියෝජිතයා විසින් කොටපොල ප්‍රාදේශීය සභාවට ගෙවිය යුතු බව 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9(3) වගන්තිය යටතේ කොටපොල ප්‍රාදේශීය සභාවේ ලේකම් මුදලිගේ ජිනදස වන මා විසින් තීරණ අංක 323(V) යටතේ තීරණය කරන ලද බව මෙයින් දන්වා සිටිමි.

එකී බද්ද 2017.01.01 වැනි දින සිට ඉදිරියට ක්‍රියාත්මක වන බව ද නිවේදනය කරමි.

මුදලිගේ ජිනදස,
ලේකම්,
කොටපොල ප්‍රාදේශීය සභාව,
දෙනියාය.

2016 අගෝස්තු මස 25 වැනි දින,
දෙනියාය,
කොටපොල ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

10-1657/5

---

## බලන්ගොඩ නගර සභාව

කර්මාන්ත බද්ද පැනවීම

බලන්ගොඩ නගර සභාවේ බලතල ක්‍රියාත්මක කරන, කාර්යය කර්තව්‍ය ඉටු කරන බලන්ගොඩ නගර සභාවේ ලේකම් සමරවීර හෙන්ද්‍රිලාගේ අමිතා කරුණාරත්න වන මම, 1939 අංක 61 දරන නගර සභා ආඥාපනත හෙවත් 255 වන අධිකාරයේ 184(අ) වන වගන්තිය සමඟ කියවිය යුතු එම පනතේ 165(අ) වන වගන්තිය යටතේ මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව බලන්ගොඩ නගර සභාවේ බලතල, කාර්යය හා කර්තව්‍ය ඉටු කරන හා ක්‍රියාත්මක කරන නිලධාරි වශයෙන් 2017 වර්ෂයට අදාළව කර්මාන්ත බද්ද නියම කිරීම සම්බන්ධයෙන් වර්ෂ 2016 ක් වූ සැප්තැම්බර් මස 30 වැනි දින තීරණ අංක බනස/16/9/30/9 යටතේ යෙදුණ බව නිවේදනය කරමි.

එස්. එච්. ඒ. කරුණාරත්න,
ලේකම්,
බලන්ගොඩ නගර සභාව.

2016ක්වූ ඔක්තෝබර් මස 04 වැනි දින,
බලන්ගොඩ නගර සභා කාර්යාලයේ දී ය.

1939 අංක 61 දරන නගර සභා ආඥාපනත හෙවත් 255 වන අධිකාරයේ 184(අ) වන වගන්තිය සමඟ කියවිය යුතු එම පනතේ 165(අ) වන වගන්තිය යටතේ මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව එකී පනතේ හෝ එකී පනත යටතේ සාදන ලද අතුරු ව්‍යවස්ථාවක විස්තර කර ඇති මෙහි පහත උපලේඛනයෙහි I වන තීරුවේ නිරූපිත යම් කාර්යයන් සඳහා බලන්ගොඩ නගර සභා බල ප්‍රදේශය ඇතුළත යම් ස්ථානයන් හෝ පරිශ්‍රයන් පාවිච්චි කිරීමට බලය දෙමි. එම උපලේඛනයෙහි II තීරුවේ අනුරූප සටහනේ නිරූපිත කර්මාන්ත බද්ද 2017 වර්ෂය සඳහා නියම විය යුතු බවට මම තීරණය කරමි.

*උපලේඛනය*

| අනු. අංකය | *I වැනි තීරුව* *කර්මාන්තයේ ස්වභාවය* | *II වැනි තීරුව* *පරිශ්‍රයේ වාර්ෂික වටිනාකම* | | |
|---|---|---|---|---|
| | | *රු. 750 නොඉක්මවන අවස්ථාවක* | *රු. 750 ඉක්මවන එහෙත් 1,500 නොඉක්මවන අවස්ථාවක* | *රු. 1,500 ඉක්මවන අවස්ථාවක* |
| | | *රු. ශ.* | *රු. ශ.* | *රු. ශ.* |
| 01. | කුෂන් වැඩ පලක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 02. | ගීත පටිගත කිරීම හෝ තැටිගත කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 03. | දැව ඉරුම් පට්ටලයක් (ලී මෝලක්) පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 04. | පොල්තෙල් නිෂ්පාදනය කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 05. | ස්වර්ණාභරණ නිපදවීමේ හෝ අලුත්වැඩිය කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 06. | මුද්‍රණාලයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 07. | පින්තූර රාමු කිරීමේ වැඩපලක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 08. | ටයර් ටියුබ් වෝල්කනයිස් කිරීමේ හෝ අලුත්වැඩියා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 09. | යකඩ කම්මලක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 10. | මැටි භාණ්ඩ නිපදවීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 11. | යන්ත්‍රානුසාරයෙන් දියලුණු පැකට් කර විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 12. | යන්ත්‍රානුසාරයෙන් පපඩම් නිෂ්පාදනය කිරීමේ ස්ථානයක් පවත්වාගන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 13. | යන්ත්‍රානුසාරයෙන් බිම්මල් නිෂ්පාදනය කිරීමේ ස්ථානයක් පව්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 14. | යන්ත්‍රානුසාරයෙන් අයිස්ක්‍රීම් නිෂ්පාදනය කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 15. | යන්ත්‍රානුසාරයෙන් යෝගට් නිෂ්පාදනය කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 16. | යන්ත්‍රානුසාරයෙන් රසකැවිලි නිෂ්පාදනය කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 17. | සිමෙන්ති ගඩොල් නිපදවීමේ වැඩපලක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 18. | කොන්ක්‍රීට් නිෂ්පාදන වැඩපලක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 19. | තේ කර්මාන්ත ශාලාවක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 20. | වඩු කර්මාන්ත ශාලාවක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 21. | මිනී පෙට්ටි නිපදවීමේ වැඩපලක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 22. | වාහන බ්‍රේක් ලයිනර් නිපදවීමේ වැඩපලක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 23. | වෑල්ඩින් වැඩපලක් පවතවාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 24. | ලියවන පට්ටලයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 25. | ඇලුමිනියම් භාණ්ඩ නිපදවන වැඩපලක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 26. | මැණික් කැපීම හෝ ඔප දැමීමේ වැඩපලක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 27. | ගමන් මලු හෝ පාවහන් නිපදවීමේ හෝ අලුත්වැඩියා කිරීමේ වැඩපලක් පවත්වාගනෙ යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 28. | ජංගම දුරකථන අලුත්වැඩියා කිරීමේ වැඩපලක් පවත්වාගනෙ යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 29. | ඇඟලුම් කර්මාන්ත ශාලාවක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 30. | බෙලෙක් වැඩපලක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 31. | ඉහත සඳහන් නොවූ නමුත් නගර සභා ආඥාපනත හෝ කිසියම් අතුරු ව්‍යවස්ථාවක් මගින් කර්මාන්ත බද්දක් ගෙවිය යුතු බවට නම් කර ඇති ව්‍යාපාරික ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |

10-1430/4

## බළන්ගොඩ නගර සභාව

### බලපත්‍ර ගාස්තු පැනවීම

බළන්ගොඩ නගර සභාවේ බලතල ක්‍රියාත්මක කරන, කාර්යය, කර්තව්‍ය ඉටු කරන බළන්ගොඩ නගර සභාවේ ලේකම් සමරවීර හෙන්ඩ්‍රිලාගේ අමිතා කරුණාරත්න වන මම 1939 අංක 61 දරන නගර සභා ආඥාපනත හෙවත් 255 වැනි අධිකාරයේ 184(අ) වැනි වගන්තිය සමඟ කියවිය යුතු එම පනතේ 162 වැනි වගන්තිය යටතේ මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව බළන්ගොඩ නගර සභාවේ බලතල, කාර්යය හා කර්තව්‍ය ඉටු කරන හා ක්‍රියාත්මක කරන නිලධාරි වශයෙන් 2017 වර්ෂයට අදාළව බලපත්‍ර ගාස්තු නියම කිරීම සම්බන්ධයෙන් වර්ෂ 2016 ක් වූ සැප්තැම්බර් මස 30 වැනි දින තීරණ අංක බනස/16/9/30/9 යටතේ යෙදුණු බව නිවේදනය කරමි.

එස්. එච්. ඒ. කරුණාරත්න,
ලේකම්,
බළන්ගොඩ නගර සභාව.

2016ක්වූ ඔක්තෝබර් මස 04 වැනි දින,
බළන්ගොඩ නගර සභා කාර්යාලයේ දී ය.

#### යෝජනාව

1939 අංක 61 දරන නගර සභා ආඥාපනත හෙවත් 255 වැනි අධිකාරයේ 184(අ) වැනි වගන්තිය සමඟ කියවිය යුතු එම පනතේ 162 වැනි වගන්තිය යටතේ මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව එකී පනතේ හෝ එකී පනත යටතේ සාදන ලද අතුරු ව්‍යවස්ථාවක විස්තර කර ඇති මෙහි පහත උපලේඛනයෙහි I වැනි තීරුවේ නිරූපිත යම් කාර්යයක් සඳහා බළන්ගොඩ නගර සභා බල ප්‍රදේශය ඇතුළත යම් ස්ථානයක් හෝ පරිශ්‍රයක් පාවිච්චි කිරීමට බලය දෙමින් එම උපලේඛනයෙහි II වැනි තීරුවේ අනුරූප සටහනේ නිරූපිත බලපත්‍ර ගාස්තුවක් 2017 වර්ෂය සඳහා නියමවිය යුතු බවට ද,

තව ද, එකී ස්ථානය හෝ පරිශ්‍රය 1968 අංක 14 දරන සංචාරක මණ්ඩල පනතේ කාර්යය සඳහා සංචාරක මණ්ඩලයේ අනුමත කර ඇති, හෝටලයක්, ආපන ශාලාවක්, නවාතැන්පලක් වන විටක දී, ඊට අදාල බලපත්‍ර ලබාදීමේ දී එම ස්ථානයේ හෝ පරිශ්‍රයේ 2016 වර්ෂයේ ලැබීම්වලින් සියයට එකක් (1%) බලපත්‍ර ගාස්තු ලෙස 2017 වර්ෂය සඳහා නියමවිය යුතු බවටත් මම තීරණය කරමි."

#### *උපලේඛනය*

| *I වැනි තීරුව* | | *II වැනි තීරුව* | | |
|---|---|---|---|---|
| *අනු. අංකය* | *බලය දෙනු ලබන කාර්යයන් හෝ ව්‍යාපාරයේ ස්වභාවය* | *පරිශ්‍රයේ වාර්ෂික වටිනාකම* | | |
| | | *රු. 750 නොඉක්මවන අවස්ථාවක රු. ශ.* | *රු.750 ට වැඩි එහෙත් රු.1,500 නොඉක්මවන අවස්ථාවක රු. ශ.* | *රු. 1,500 ඉක්මවන අවස්ථාවක රු. ශ.* |
| 01. | නවාතැන්පලක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 02. | ලැගුම්හලක් (රෙස්ටුරන්ට්) පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 03. | භෝජනාගාරයක් (ෆුඩ් කැබින්) පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 04. | හෝටලයක් පවත්වානෙ යාම | | | |
| 05. | බේකරියක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 06. | තේ කෝපි/බීම අලෙවිහලක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 07. | කරුණවැම් මැදිරියක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 08. | ගෝ ඝාතකාගාරයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 09. | මස්/මාලු/බිත්තර අලෙවි ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 10. | ලොන්ඩරියක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 11. | දියලුණු පැකට් කර විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 12. | පපඩම් නිෂ්පාදනය කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 13. | බිම්මල් නිෂ්පාදනය කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 14. | අයිස්ක්‍රීම් නිෂ්පාදනය කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 15. | යෝගට් නිෂ්පාදනය කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |

| *I වැනි තීරුව* | | *II වැනි තීරුව* | | |
|---|---|---|---|---|
| *අනු. අංකය* | *බලය දෙනු ලබන කාර්යයන් හෝ ව්‍යාපාරයේ ස්වභාවය* | *පරිශ්‍රයේ වාර්ෂික වටිනාකම* | | |
| | | *රු. 750 නොඉක්මවන අවස්ථාවක රු. ශ.* | *රු.750 ට වැඩි එහෙත් රු.1,500 නොඉක්මවන අවස්ථාවක රු. ශ.* | *රු. 1,500 ඉක්මවන අවස්ථාවක රු. ශ.* |
| 16. | රස කැවිලි නිෂ්පාදනය කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 17. | සත්ව ගොවිපලවල් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 18. | සත්ව ආහාර අලෙවි කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 19. | කෘෂි රසායන පොහොර අලෙවි කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 20. | ගෑස් අලෙවි කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 21. | ඇඹරුම්හලක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 22. | මුද්‍රණාලයක්/ඩිජිටල් ප්‍රින්ටින්/ඡායාපිටපත් ගැනීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 23. | වැල්ඩින් වැඩපලක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 24. | ලියවන පට්ටලයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 25. | ගරාජයක් පවත්වාගන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 26. | බෝතල්/පත්තර/ගෝනි/පරණ යකඩ අලෙවි කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 27. | ලී මඩුවක් පවත්වාගනෙ යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 28. | වඩු මඩුවක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 29. | මෝටර් රථ සේවා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 30. | සුරතල්සතුන් අලෙවි කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 31. | මනාලියන් හැඩ ගැන්වීමේ හෝ රූපලාවන්‍යාගාරයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 32. | පාපැදි අලුත්වැඩි යා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 33. | ආහාර ද්‍රව්‍ය තොග වශයෙන් අලෙවි කිරීමේ ස්ථානයක් | 500 0 | 750 0 | 1,000 0 |
| 34. | ඉහත සඳහන් නොවූ නමුත් නගර සභා ආඥාපනත හෝ කිසියම් අතුරු ව්‍යවස්ථාවක් මගින් බලපත්‍රයක් ලබාගත යුතු බවට නම් කර ඇති ව්‍යාපාරික ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |

10-1430/3

---

## බළන්ගොඩ නගර සභාව

### ව්‍යාපාරික බද්ද පැනවීම

බළන්ගොඩ නගර සභාවේ බලතල ක්‍රියාත්මක කරන, කාර්යය කර්තව්‍ය ඉටු කරන බළන්ගොඩ නගර සභාවේ ලේකම් සමරවීර හෙන්ද්‍රිලාගේ අමිතා කරුණාරත්න වන මම 1939 අංක 61 දරන නගර සභා ආඥාපනත හෙවත් 255 වන අධිකාරයේ 184(අ) වන වගන්තිය සමඟ කියවිය යුතු එම පනතේ 165(ආ) වන වගන්තිය යටතේ මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව බළන්ගොඩ නගර සභාවේ බලතල, කාර්යය හා කර්තව්‍ය ඉටු කරන හා ක්‍රියාත්මක කරන නිලධාරී වශයෙන් 2017 වර්ෂයට අදාළව ව්‍යාපාර බද්ද නියම කිරීම සම්බන්ධයෙන් වර්ෂ 2016ක් වූ සැප්තැම්බර් මස 30 වන දින තීරණ අංක බනස/16/09/30/9 යටතේ යෙදුණු බව නිවේදනය කරමි.

එස්. එච්. ඒ. කරුණාරත්න,
ලේකම්,
බළන්ගොඩ නගර සභාව.

2016 ක්වූ ඔක්තෝබර් මස 04 වැනි දින,
බළන්ගොඩ නගර සභා කාර්යාලයේ දී ය.

1939 අංක 61 දරන නගර සභා ආඥා පනත හෙවත් 255 වන අධිකාරයේ 184(අ) වන වගන්තිය සමඟ කියවිය යුතු එම පනතේ 165 වන වගන්තිය යටතේ මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව එකී පනතේ හෝ එකී පනත යටතේ සාදන ලද අතුරු ව්‍යවස්ථාවක විධිවිධාන යටතේ බලපත්‍රයක් ලබා ගැනීම හෝ එම පනතේ 165(ආ) වන වගන්තිය යටතේ කර්මාන්ත බද්දක් ගෙවීමට අවශ්‍ය නොවන්නාවූ යම් ව්‍යාපාරයක් බළන්ගොඩ නගර සභා බලප්‍රදේශය ඇතුළත 2017 වර්ෂයේ දී පවත්වාගෙන යන සෑම තැනැත්තෙකුගෙන්ම එම ව්‍යාපාරයේ 2016 වර්ෂයේ ආදායම මෙහි පහත උපලේඛනයෙහි පළමුවන කොටසේ I වන තීරුවේ නිරූපිත යම් විෂයාංක සීමාවන් ඇතුළත පවතින අවස්ථාවක එම උපලේඛනයෙහි පළමුවන කොටසේ II තීරුවේ අනුරූප සටහනේ නිරූපිත ප්‍රමාණයක ව්‍යාපාර බද්දක් 2017 වර්ෂය සඳහා නියමවිය යුතු බවට මම තීරණය කරමි.

*උපලේඛනය*

**පළමුවන කොටස**

| *I වැනි තීරුව* *2016 වර්ෂයේ දී ආදායම* | *II වැනි තීරුව* *රු. ශ.* |
|---|---|
| 1. රු.6,000 නොඉක්මවන අවස්ථාවක | කිසිවක් නැත |
| 2. රු. 6,000 ඉක්මවන නමුත් රු. 12,000 නොඉක්මවන විට | 90 0 |
| 3. රු.12,000 ඉක්මවන නමුත් රු. 18,750 නොඉක්මවන විට | 180 0 |
| 4. රු. 18,750 ඉක්මවන නමුත් රු. 75,000 නොඉක්මවන විට | 300 0 |
| 5. රු. 75,000 ඉක්මවන නමුත් රු. 1,50,000 නොඉක්මවන විට | 1,200 0 |
| 6. රු. 1,50,000 ඉක්මවන විට | 3,000 0 |

**දෙවන කොටස**

බද්ද අදාළ වන ව්‍යාපාරයන් :

01. දුරකථන සේවා ස්ථාන (කොමියුනිකේෂන්)
02. නියෝජිත තැපැල් කාර්යාල
03. පොදු සේවා ස්ථාන
04. කොන්ත්‍රාත්කරුවන්
05. රක්ෂණ නියෝජිතයින්
06. මූල්‍ය ආයතන
07. පෞද්ගලික ඉංජිනේරුවන්
08. පෞද්ගලික ආරෝග්‍යශාලා
09. පෞද්ගලික අධ්‍යාපන ආයතන
10. කොමිස් නියෝජිතවරුන්/වෙන්දේසිකරුවන්
11. පෞද්ගලික මිනින්දෝරුවන්
12. සිනමා ශාලාවක් පවත්වාගෙන යාම
13. උකස්බඩු ගන්නා ස්ථානයක් පවත්වාගෙන යාම
14. ඉන්ධන පිරවුම්හලක් පවත්වාගෙන යාම
15. රටබීම (මත්වතුර) අළෙවිසැලක් පවත්වාගෙන යාම
16. ලොතරැයි අලෙවි කිරීම
17. රථවාහන හා යන්ත්‍ර සූත්‍ර කුලී පදනම මත සැපයීම
18. වෛද්‍ය සේවාවන් පවත්වාගෙන යාම
19. රන් භාණ්ඩ අළෙවි කිරීම
20. ගොඩනැගිලි ද්‍රව්‍ය අලෙවි කිරීම
21. රෙදිපිළි හා නිමි ඇඳුම් අලෙවිය
22. ලී වෙළඳාම් කිරීම
23. යතුරු පැදි හා වාහන අමතර කොටස් අළෙවි කිරීම
24. රියදුරු පුහුණු ස්ථානයක්
25. පෞද්ගලික පන්ති පැවැත්වීම
26. ළදරු පාසලක් පවත්වාගෙන යාම
27. සිල්ලර වෙළඳාම
28. කුළුබඩු මිළදී ගැනීම
29. තොග වෙළඳ මධ්‍යස්ථාන පවත්වාගෙන යාම
30. ප්‍රචාරක දැන්වීම් සකසන ස්ථානයක් පවත්වාගෙන යාම
31. මිශ්‍ර වෙළඳාම
32. රේස් ඔට්ටු පොළක් පවත්වාගෙන යාම
33. පාපැදි අමතර කොටස් අලෙවි කිරීම
34. පොත්පත්, ලිපිද්‍රව්‍ය අළෙවිකිරීම
35. ශබ්ද විකාශන යන්ත්‍ර කුලී පදනම මත සැපයීම
36. රා තැබෑරුමක් පවත්වාගෙනයාම
37. සාප්පු බඩු විකිණීම
38. උළු හෝ ගඩොල් ගබඩා කිරීම
39. ගෝනි, හිස් බෝතල් ගබඩා කිරීම.
40. දර ගබඩා කිරීම
41. දැව ගබඩා කිරීම
42. දේශීය වෛද්‍ය මධ්‍යස්ථාන
43. බටහිර වෛද්‍ය මධ්‍යස්ථාන
44. මෝටර් වාහන සේවා කිරීම
45. උත්සව භාණ්ඩ කුලී පදනම මත සැපයීම
46. සමූපකාර ප්‍රාදේශික පවත්වාගෙන යාම
47. පාවහන් වෙළඳසැල්
48. ගෘහ භාණ්ඩ වෙළඳාම
49. විවිධ වෘත්තිකයන්ගේ සේවා සැපයීමේ ස්ථාන
50. සංචාරක වෙළඳාම
51. ඉංග්‍රීසි බෙහෙත් අළෙවිය (ෆාමසි)
52. සිංහල/ආයුර්වේද බෙහෙත් අලෙවිය
53. ඡායා පිටපත් කිරීමේ ස්ථාන
54. ග්‍රොසරිය
55. අළෙවි ප්‍රවර්ධන වැඩසටහන්
56. වෙළඳ නියෝජිත ස්ථාන
57. එක් ආයතනයක් තුළ වෙළඳ ආයතන කිහිපයක් පවත්වන ස්ථාන පවත්වාගෙන යාම
58. මෝටර් වාහන සඳහා බොඩි නිපදවන ස්ථාන
59. ලියවන පට්ටල
60. ඇස් කණ්නාඩි අලෙවිය
61. මෝටර් බයිසිකල් අලෙවිය
62. රථ වාහන අලෙවිය
63. ජල පොම්ප හා අමතර කොටස් අලෙවිය
64. ටයිල් අලෙවිය
65. නොතාරිස්/නීතිඥ කාර්යාලයක් පවත්වාගෙන යාම
66. මෙහි පහත සඳහන් නොවන එහෙත් ලාභ ඉපැයීමේ පරමාර්ථයෙන් පවත්වාගෙන යනු ලබන වෙනත් ඕනෑම ව්‍යාපාරයක්

10-1430/5

## බළන්ගොඩ නගර සභාව

### රථ වාහන නැවතුම් ගාස්තු පැනවීම

බළන්ගොඩ නගර සභාවේ බලතල ක්‍රියාත්මක කරන, කාර්ය, කර්තව්‍ය ඉටුකරන බළන්ගොඩ නගර සභාවේ ලේකම් සමරවීර හෙන්ඩ්‍රිලාගේ අමිතා කරුණාරත්න වන මම 1939 අංක 61 දරණ නගර සභා ආඥා පනත හෙවත් නීති ප්‍රඥප්තියේ 255 වන අධිකාරයේ 184 වන වගන්තිය සමඟ කියවිය යුතු එම පනතේ 94 (1) වන වගන්තියේ හා 157(14අ) වගන්තිය සහ ඊට අදාල අතුරු ව්‍යවස්ථාවන් යටතේ මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර බළන්ගොඩ නගර සභා සීමාවේ රථ වාහන නතර කිරීමේ දී ගාස්තු අය කරනු ලබන නව සීමාව පහත I වන උපලේඛනයේ සවිස්තරාත්මකව දක්වනු ලබන ආකාරයටත්, එම ස්ථානවල නතර කරනු ලබන මෝටර් වාහන වලින් අය කරනු ලබන ගාස්තුව II වන උපලේඛනයේ සවිස්තරාත්මකව දැක්වෙන ආකාරයට වියයුතු බවටත් නියම කිරීම උදෙසා ඒ සම්බන්ධ වර්ෂ 2016 ක්වූ සැප්තැම්බර් මස 30 වැනි දින බළන්ගොඩ නගර සභා කාර්යාලයේ පැවති විශේෂ කමිටුවේ තීරණ අංක බනස/16/09/30/6 යටතේ තීරණය කල බවට මෙයින් නිවේදනය කරමි.

එස්. එච්. ඒ. කරුණාරත්න,
ලේකම්,
බළන්ගොඩ නගර සභාව.

2016 ඔක්තෝබර් මස 04 වැනි දින,
බළන්ගොඩ නගර සභාවේදීය.

### I වැනි උපලේඛනය (සීමාව)

බළන්ගොඩ නගරයේ වෙළඳපල සීමාවන් තුළ බළන්ගොඩ බදුල්ල මාර්ගයේ කිරිඳිගල පල්ලිය (වැලිහරනාව හන්දිය) දක්වා ද, බළන්ගොඩ රාස්සගල පාරේ කොන්වට් විදුහල දක්වා ද, බළන්ගොඩ රත්නපුර මාර්ගයේ HLW ඉන්ධන පිරවුම්හල දක්වා ද, බළන්ගොඩ කල්තොට පාරේ ධර්මරත්න බස්නායක මහතාගේ නිවස දක්වා ද, දොරවළ නව අතුරු මාර්ගය (මොහාන් සාලිය එල්ලාවල මාවත) ද ඇතුලත්වන පරිදි බළන්ගොඩ නගරයේ කෙළින් වීදිය, තානයම් පිවිසුම් පාර, බාන්ස් රත්වත්ත මාවත, බස් නැවතුම්පොල පාර, පල්ලිය පාර ඒ ඇතුළත ඇති සියලුම වීථීන්ද වේ.

II වන උපලේඛනය (ගාස්තු)

- ලොරියක්, බස්රථයක් හෝ වෙනයම් වාහනයකින් - රු. 50.00
- වෑන් රථයක්, ජීප් රථයක් - රු. 40.00
- මෝටර් රථයක් (කාර් රථයක්) - රු. 30.00
- ත්‍රී රෝද රථයක් - රු. 20.00

10-1430/1

---

## බළන්ගොඩ නගර සභාව

### 2017 වර්ෂය සඳහා වරිපනම් බදු පැනවීම

බළන්ගොඩ නගර සභාවේ ලේකම් සමරවීර හෙන්ඩ්‍රිලාගේ අමිතා කරුණාරත්න වන මවිසින් 1939 අංක 61 දරන නගර සභා ආඥා පනත හෙවත් 255 වන අධිකාරයේ 184(අ) වන වගන්තිය සමඟ කියවිය යුතු එම පනතේ 160 වගන්තිය ප්‍රකාරව බළන්ගොඩ නගර සභාවේ බලතල, කාර්යය හා කර්තව්‍ය ඉටුකරන හා ක්‍රියාත්මක කරන නිලධාරී වශයෙන් 2017 වසරට වරිපනම් බදු පැනවීම සම්බන්ධයෙන් පහත සඳහන් තීරණය වර්ෂ 2016 සැප්තැම්බර් මස 30 වැනි දින තීරණ අංක බනස/16/09/30/10 යටතේ ගන්නට යෙදුනු බව මෙයින් නිවේදනය කරමි.

එස්. එච්. ඒ. කරුණාරත්න,
ලේකම්,
බළන්ගොඩ නගර සභාව.

2016 ඔක්තෝබර් මස 06 වැනි දින,
බළන්ගොඩ නගර සභා කාර්යාලයේ දී ය.

1939 අංක 61 දරන නගර සභා ආඥා පනතේ 166 වන වගන්තිය යටතේ නගර සභාව වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව නගර සභා බල ප්‍රදේශය ඇතුළත පිහිටියාවූ නිවාසවල, ගොඩනැගිලි වල, ඉඩම්වල, ගෙපත්වල වාර්ෂික වටිනාකම සඳහා 2012 වර්ෂය සඳහා වූ තක්සේරුව / සත්‍යොක්ෂණය වර්ෂය සඳහා තක්සේරුව ලෙස සම්මත කළ යුතු බවටත්, එකී තක්සේරුව මත 1939 අංක 61 දරන නගර සභා ආඥා පනත හෙවත් 255 වන අධිකාරයේ 184(අ) වගන්තිය සමඟ කියවිය යුතු 160 වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර එකී දේපළ මත ඉහත කී තක්සේරුව සඳහා වාර්ෂික වටිනාකමින්,

(අ) නේවාසික ස්ථාන සඳහා සියයට හතර (4%) ක වාර්ෂික වරිපනම් බද්දක් ද,

(ආ) වෙළඳ හෝ වාණිජ කාර්යය සඳහා පාවිච්චි කරනු ලබන ස්ථාන මත සියයට පහ (5%) ක වාර්ෂික වරිපනම් බද්දක් ද,

නියම විය යුතු බවටත්,

තවද, 2017 වර්ෂයෙහි පහත උපලේඛනයෙහි සඳහන් එක් එක් කාර්තුව වෙනුවෙන් ඉදිරියෙන් නිරූපිත දිනයට පෙර එසේ නියම කරන ලද වාර්ෂික වරිපනම් බද්ද නගර සභා අරමුදලට ගෙවිය යුතු බවටත්, එලෙස වාර්ෂික වරිපනම් බද්ද 2017 වර්ෂයෙහි ජනවාරි මස 31 වැනි දින හෝ ඊට ප්‍රථම ගෙවන්නේ නම් වාර්ෂික වරිපනම් බද්දේ ප්‍රමාණයෙන් සියයට දහයක (10%) ක වට්ටමක් ද, එකී උපලේඛනයෙහි එක් එක් කාර්තුව ඉදිරියේ තුන්වන තීරුවේ නිරූපිත දිනයට පෙර අදාළ වරිපනම් බදු මුදල නගර සභා අරමුදලට ගෙවනු ලබන්නේ නම් එක කාර්තුවට අදාළ මුදලින් සියයට පහක (5%) ක වට්ටමක් ද නගර සභාව ලබා දිය යුතු බවටත් තීරණය කරමි.

උපලේඛනය

| කාර්තුව | ගෙවිය යුතු දිනය | 5% වට්ටම සඳහා හිමිකම් ලබන අවසාන දිනය |
|---|---|---|
| පළමු වන කාර්තුව | 2017.03.31 | 2017.01.31 |
| දෙවන කාර්තුව | 2017.06.30 | 2017.04.30 |
| තුන්වන කාර්තුව | 2017.09.30 | 2017.07.31 |
| හතරවන කාර්තුව | 2017.12.31 | 2017.10.31 |

10-1430/2

---

## මිනුවන්ගොඩ නගර සභාව

### 2017 වර්ෂය සඳහා වරිපනම් බදු පැනවීම

(255 අධිකාරය) නගර සභා ආඥාපනතේ 160 වැනි වගන්තියේ (3) වන උපවගන්තියෙන් මිනුවන්ගොඩ නගර සභාව වෙත පැවරී ඇති බලතල ප්‍රකාර මිනුවන්ගොඩ නගර සභා බල ප්‍රදේශය ඇතුළත පිහිටි සියලුම නිවාසවල, ගොඩනැගිලිවල, ඉඩම්වල, ගෙපත්වල 2011 වාර්ෂික වටිනාකම සඳහා 2010 වර්ෂයේ දී සිදුකරන ලද තක්සේරුව 2017 වර්ෂය සඳහා පිළිගැනීමටත්, එකී තක්සේරුව මත (255 අධිකාරය) 2016 වර්ෂයේ දී අය කරන ලද වරිපනම් බදු ප්‍රතිශතයම එනම් ව්‍යාපාරික දේපළවල වාර්ෂික වටිනාකමින් සියයට 11% ක වරිපනම් බද්දක් ද, ගෘහස්ත දේපළවල වාර්ෂික වටිනාකමින් සියයට 4%ක වරිපනම් බද්දක් ද, 2017 වසර සඳහා පනවා අයකළ යුතු බවටත් මිනුවන්ගොඩ නගර සභාවේ ලේකම් සහ සභාවේ බලතල, කාර්ය, කර්තව්‍ය ක්‍රියාත්මක කිරීමේ නිලධාරී වන එච්. ඒ. එස්. රත්නලතා වන මා විසින් 255 වන අධිකාරය වන නගර සභා ආඥපනතේ අංක 184(අ) වගන්ති ප්‍රකාරව පැවරී ඇති බලතල අනුව 2016.09.14 දින තීරණ අංක 84-XX යටතේ තීරණය කර ඇති බව මෙයින් නිවේදනය කරමි.

තව ද, පහත උපලේඛනයේ සඳහන් පරිදි අදළ ගාස්තු 2017.01.01 වැනි දින සිට අයකිරීම ක්‍රියාත්මක කරනු ලබන බව ද මෙයින් නිවේදනය කරනු ලැබේ :-
තවද

(1) 2017 ජනවාරි මස 31 වැනි දිනට හෝ ඊට ප්‍රථම මුළු වර්ෂයටම ගෙවිය යුතු වරිපනම් බද්ද ගෙවනු ලැබූ විට එම මුදලින් 10%ක වට්ටමක් දෙනු ලබන බව ද,

(2) එම මුදල කාර්තු වශයෙන් ගෙවන විට එම කාර්තුවට අදාළ පළමු මාසය තුළ ගෙවනු ලැබූ විට එසේ ගෙවන මුදලින් 5% ක වට්ටමක් දෙනු ලබන බව ද,

(3) ඉහත කී 1 හා 2 ඡේදයේ ගෙවිය යුතු බදු මුදල් අදාළ කාර්තුව තුළ නොගෙවන අවස්ථාවල දී ව්‍යාපාරික ස්ථාන සඳහා 20% ක් ද, නේවාසික ස්ථාන සඳහා 15% ක් ද වශයෙන් දඩ මුදලක් අය කරනු ලබන බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

එච්. ඒ. එස්. රත්නලතා,
ලේකම් සහ සභාවේ බලතල, කාර්ය
කර්තව්‍ය ක්‍රියාත්මක කිරීමේ නිලධාරී,
මිනුවන්ගොඩ නගර සභාව.

2016 සැප්තැම්බර් මස 14 වැනි දින,
මිනුවන්ගොඩ නගර සභා කාර්යාලයේ දී ය.

10-914/1

## මිනුවන්ගොඩ නගර සභාව

### නගර සභා ආඥාපනතේ 255 වැනි අධිකාරය යටතේ දැන්වීම

(255 අධිකාරය) නගර සභා ආඥාපනතේ 165 වගන්තියේ අ (1) උපවගන්තියෙන් පැවරී ඇති බලතල ප්‍රකාර මිනුවන්ගොඩ නගර සභා බල ප්‍රදේශය ඇතුළත පවත්වාගෙන යනු ලබන පහත උපලේඛනයේ 1 වැනි තීරුවේ නිරූපිත සෑම කර්මාන්තයක් සම්බන්ධයෙන් එකී උපලේඛනයේ 11 වැනි තීරුවේ දක්වා ඇති ප්‍රමාණයක කර්මාන්ත බද්දක් 2017.01.01 වැනි දින සිට බලපවත්වන පරිදි පනවා අය කිරීමට මිනුවන්ගොඩ නගර සභාවේ ලේකම් සහ සභාවේ බලතල, කාර්ය, කර්තව්‍ය ක්‍රියාත්මක කිරීමේ නිලධාරී වන එච්. ඒ. එස්. රත්නලතා වන මා විසින් 255 වන අධිකාරය වන නගර සභා ආඥාපනතේ අංක 184(අ) වගන්ති ප්‍රකාරව පැවරී ඇති බලතල අනුව 2016.09.14 වැනි දින තීරණ අංක 84 - XX යටතේ තීරණය කර ඇති බව මෙයින් නිවේදනය කරමි.

තව ද, පහත උපලේඛනයේ සඳහන් කර්මාන්ත බද්ද, එකී වර්ෂයේ මාර්තු 31 දිනට පෙර ගෙවා අවසන් කළ යුතු බව ද මෙයින් නිවේදනය කරනු ලැබේ.

එච්. ඒ. එස්. රත්නලතා,<br>
ලේකම් සහ සභාවේ බලතල, කාර්ය<br>
කර්තව්‍ය ක්‍රියාත්මක කිරීමේ නිලධාරී,<br>
මිනුවන්ගොඩ නගර සභාව.

2016 සැප්තැම්බර් මස 14 වැනි දින,<br>
මිනුවන්ගොඩ නගර සභා කාර්යාලයේ දී ය.

**උපලේඛනය**

| | *I වැනි තීරුව* | *II වැනි තීරුව* | | |
|---|---|---|---|---|
| | *ව්‍යාපාරයේ ස්වභාවය* | *වාර්ෂික වටිනාකම රු. 750 ට වැඩි නොවන විට* | *වාර්ෂික වටිනාකම රු. 750 ට වැඩි නමුත් රු. 1,500 ට වැඩි නොවන විට* | *වාර්ෂික වටිනාකම රු. 1,500 ට වැඩි* |
| | | *රු. ශත* | *රු. ශත* | *රු. ශත* |
| 01. | මෝටර් සයිකල් අලෙවි කිරීම සඳහා ගබඩා කර තබා ගැනීම | 500 0 | 750 0 | 1,000 0 |
| 02. | දන්ත ශල්‍යාගාරයක් සඳහා | 500 0 | 700 0 | 950 0 |
| 03. | ගීත පටිගත කිරීම හෝ ගීත තැටිගත කරන ස්ථානයක් සඳහා | 500 0 | 700 0 | 950 0 |
| 04. | විදුලි උපකරණ වෙළඳ මධ්‍යස්ථානයක් සඳහා | 500 0 | 750 0 | 1,000 0 |
| 05. | ගොඩනැගිලි ද්‍රව්‍ය හා සිමෙන්තියෙන් සාදන ලද භාණ්ඩ විකිණීමේ ව්‍යාපාර සඳහා | 450 0 | 750 0 | 1,000 0 |
| 06. | පෞද්ගලික අධ්‍යාපන ආයතනයක් සඳහා | 500 0 | 750 0 | 1,000 0 |
| 07. | පොල් ගබඩා කිරීමේ ස්ථානයක් සඳහා | 500 0 | 700 0 | 950 0 |
| 08. | වැලි ගොඩදැමීමේ ස්ථානයක් සඳහා | 500 0 | 700 0 | 950 0 |
| 09. | මහන මැෂින් විකිණීමේ ස්ථානයක් සඳහා | 500 0 | 750 0 | 1,000 0 |
| 10. | ඇස්කණ්ණාඩි විකිණීමේ ස්ථානයක් සඳහා | 500 0 | 700 0 | 950 0 |
| 11. | රූපවාහිනී යන්ත්‍ර, කැසට් යන්ත්‍ර, ශීතකරණ ගබඩා කිරීම හෝ විකිණීමේ ස්ථානයක් සඳහා | 500 0 | 750 0 | 1,000 0 |
| 12. | ඡායා පිටපත් නිකුත් කිරීමේ ස්ථානයක් සඳහා | 500 0 | 700 0 | 950 0 |
| 13. | විසිතුරු භාණ්ඩ විකිණීමේ ස්ථානයක් සඳහා | 500 0 | 700 0 | 950 0 |
| 14. | රෙදිපිළි වෙළඳ ස්ථානයක් සඳහා | 500 0 | 750 0 | 1,000 0 |
| 15. | සිල්ලර බඩු ගබඩා කිරීම හෝ වෙළදාම් කිරීමේ ස්ථානයක් සඳහා | 500 0 | 700 0 | 950 0 |
| 16. | සාප්පු බඩු කඩයක් සඳහා | 500 0 | 750 0 | 1,000 0 |
| 17. | ආයුර්වේද බෙහෙත් ශාලාවක් පවත්වාගෙන යාම සඳහා | 500 0 | 700 0 | 950 0 |
| 18. | ඉංග්‍රීසි බෙහෙත් ශාලාවක් පවත්වාගෙන යාම සඳහා | 500 0 | 750 0 | 1,000 0 |
| 19. | සාප්පු බඩු විකිණීමේ ස්ථානයක් සඳහා | 500 0 | 750 0 | 1,000 0 |

| | I වැනි තීරුව | II වැනි තීරුව | | |
|---|---|---|---|---|
| | ව්‍යාපාරයේ ස්වභාවය | වාර්ෂික වටිනාකම රු. 750 ට වැඩි නොවන විට<br>රු. ශත | වාර්ෂික වටිනාකම රු. 750 ට වැඩි නමුත් රු. 1,500 ට වැඩි නොවන විට<br>රු. ශත | වාර්ෂික වටිනාකම රු. 1,500 ට වැඩි<br>රු. ශත |
| 20. | ආයුර්වේද බෙහෙත් බඩු විකිණීමේ ස්ථානයක් සඳහා | 500 0 | 700 0 | 950 0 |
| 21. | ඉංග්‍රීසි බෙහෙත් බඩු විකිණීමේ ස්ථානයක් සඳහා | 500 0 | 750 0 | 1,000 0 |
| 22. | පාවහන් විකිණීමේ ස්ථානයක් සඳහා | 500 0 | 700 0 | 950 0 |
| 23. | පිඟන් බඩු, ඇනමල් බඩු හා වීදුරු භාණ්ඩ විකිණීමේ ස්ථානයක් සඳහා | 450 0 | 750 0 | 1,000 0 |
| 24. | රේඩියෝ සහ රේඩියෝ උපකරණ විකිණීමේ ස්ථානයක් සඳහා | 500 0 | 700 0 | 950 0 |
| 25. | යන්ත්‍රෝපකරණ ගබඩා කිරීම හා කුළියට දීම | 500 0 | 750 0 | 1,000 0 |
| 26. | ස්වර්ණාභරණ උකස් ගන්නා ස්ථානයක් සඳහා | 500 0 | 750 0 | 1,000 0 |
| 27. | පුටු, මඩු සහ පිඟන් භාණ්ඩ කුළියට දීම (උත්සව භාණ්ඩ) | 500 0 | 750 0 | 1,000 0 |
| 28. | රූපවාහිනී යන්ත්‍ර, විදුලි උපකරණ අලුත්වැඩියා කරන ස්ථානයක් සඳහා | 500 0 | 700 0 | 950 0 |
| 29. | ශබ්ද විකාශන යන්ත්‍ර හා විදුලි උත්පාදනය කරන යන්ත්‍ර කුලියට දීම | 500 0 | 700 0 | 950 0 |
| 30. | වීඩියෝ කැසට් පට කුලියට දීම හා අලෙවි කිරීම | 500 0 | 700 0 | 950 0 |
| 31. | ඒජන්සි තැපැල් කාර්යාලයක් පැවැත්වීම | 500 0 | 750 0 | 1,000 0 |
| 32. | ප්‍රචාරක සේවා ආයතනයක් පැවැත්වීම | 450 0 | 750 0 | 1,000 0 |
| 33. | පැන්ට්‍රි කබඩ් සෑදීමේ හෝ විකිණීමේ ස්ථානයක් සඳහා | 500 0 | 750 0 | 1,000 0 |
| 34. | නොතාරිස් කාර්යාලයක් හෝ නීතිඥ සේවා කාර්යාලයක් පැවැත්වීම සඳහා | 500 0 | 750 0 | 1,000 0 |
| 35. | විශේෂඥ වෛද්‍ය සේවා සැපයීමේ ස්ථාන සඳහා | 500 0 | 750 0 | 1,000 0 |
| 36. | ශීත කළ ආහාර අලෙවිය හා ගබඩා කිරීම | 500 0 | 750 0 | 1,000 0 |
| 37. | ග්‍රොසරියක් පවත්වාගෙන යාම | 500 0 | 700 0 | 950 0 |
| 38. | වෛද්‍ය පරීක්ෂණ ආයතනයක් පැවැත්වීම සඳහා | 500 0 | 700 0 | 950 0 |
| 39. | යකඩ බඩු කඩයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 40. | දේශීය හා විදේශීය මත්පැන් විකිණීමේ ස්ථානයක් පැවැත්වීම | 500 0 | 650 0 | 1,000 0 |
| 41. | ගෑස් ගබඩා කිරීමේ හා අලෙවි කිරීමේ ව්‍යාපාරයක් පැවැත්වීම සඳහා | 500 0 | 750 0 | 1,000 0 |
| 42. | බයිසිකල් හා ට්‍රයිසිකල් වෙළෙඳාම | 500 0 | 700 0 | 1,000 0 |
| 43. | දුරකථන සේවා කුටි පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 44. | ජංගම දුරකථන අලෙවි කිරීමේ ව්‍යාපාර සඳහා | 500 0 | 750 0 | 1,000 0 |
| 45. | පරිගණක හා පරිගණක උපාංග අලෙවි කිරීමේ ව්‍යාපාර සඳහා | 500 0 | 700 0 | 950 0 |
| 46. | ජංගම දුරකථන අමතර කොටස් වෙළෙඳාම හා ජංගම දුරකථන අලුත්වැඩියා කිරීමේ ව්‍යාපාරය සඳහා | 500 0 | 700 0 | 950 0 |
| 47. | පරිගණක අමතර කොටස් වෙළෙඳාම හා පරිගණක අලුත්වැඩියා කිරීමේ ව්‍යාපාරය සඳහා | 500 0 | 700 0 | 950 0 |
| 48. | අළුත් හෝ පරණ මෝටර් රථ අමතර කොටස් ගබඩා කිරීමේ හෝ විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 49. | උළු හෝ ගඩොල් කර්මාන්තය සඳහා | 500 0 | 700 0 | 950 0 |
| 50. | කොහු ලණු කර්මාන්ත ශාලාවක් පවත්වාගෙන යාම සඳහා | 500 0 | 700 0 | 950 0 |
| 51. | කෘත්‍රිම පොහොර සකස් කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 700 0 | 950 0 |
| 52. | ගෝනි ගබඩා කිරීම | 500 0 | 700 0 | 950 0 |
| 53. | පාපැදි අලුත්වැඩියා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම සඳහා | 500 0 | 700 0 | 950 0 |

| *I වැනි තීරුව* | | *II වැනි තීරුව* | | |
|---|---|---|---|---|
| | *ව්‍යාපාරයේ ස්වභාවය* | *වාර්ෂික වටිනාකම රු. 750 ට වැඩි නොවන විට* <br> *රු. ශත* | *වාර්ෂික වටිනාකම රු. 750 ට වැඩි නමුත් රු. 1,500 ට වැඩි නොවන විට* <br> *රු. ශත* | *වාර්ෂික වටිනාකම රු. 1,500 ට වැඩි* <br> *රු. ශත* |
| 54. | ලියවන පට්ටලයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 55. | සිගරට් නිෂ්පාදනය කිරීමේ හෝ ගබඩා කර තබා ගැනීමේ ස්ථානයක් පවත්වාගෙන යාම සඳහා | 500 0 | 700 0 | 950 0 |
| 56. | සුරුට්ටු හෝ බීඩි නිපදවීමේ ස්ථානයක් සඳහා | 500 0 | 700 0 | 950 0 |
| 57. | ගොඩනැගිලි විදුලි රැහැන් ඇදීම සඳහා | 500 0 | 700 0 | 950 0 |
| 58. | ගොඩනැගිලි ජලනළ ඇදීම සඳහා | 500 0 | 700 0 | 950 0 |
| 59. | මිනී පෙට්ටි සෑදීම, ගබඩා කිරීම හෝ අලෙවි කිරීම සඳහා | 500 0 | 750 0 | 1,000 0 |
| 60. | ඔරලෝසු අලුත්වැඩියා කිරීම | 500 0 | 700 0 | 950 0 |
| 61. | පින්තූර රාමු කිරීමේ ස්ථානයක් සඳහා | 500 0 | 700 0 | 950 0 |
| 62. | රේස් ඔට්ටුපලක් පවත්වාගෙන යාම සඳහා | 500 0 | 750 0 | 1,000 0 |
| 63. | පොත්පත්, ලිපි ද්‍රව්‍ය නිපදවීමේ හෝ අලවිකිරීමේ මධ්‍යස්ථානයක් සඳහා | 500 0 | 700 0 | 950 0 |
| 64. | ත්‍රිරෝද රථ අලෙවි කිරීමේ මධ්‍යස්ථානයක් සඳහා | 500 0 | 750 0 | 1,000 0 |
| 65. | ත්‍රිරෝද රථ අලුත්වැඩියා කරන ස්ථානයක් සඳහා | 500 0 | 700 0 | 950 0 |
| 66. | අළුත් හෝ පරණ මෝටර් සයිකල් අමතර කොටස් ගබඩා කිරීමේ හෝ අලෙවි කිරීමේ ස්ථානයක් පැවැත්වීම | 500 0 | 750 0 | 1,000 0 |
| 67. | කුෂන් වැඩපලක් පැවැත්වීම | 500 0 | 700 0 | 950 0 |
| 68. | වාහන අලංකරණ උපාංග සැකසීම | 500 0 | 700 0 | 950 0 |
| 69. | රියැදුරු පුහුණු පාසලක් කිරීම | 500 0 | 750 0 | 1,000 0 |
| 70. | ටයර් ගබඩාකර අලෙවි කිරීම | 500 0 | 700 0 | 950 0 |
| 71. | මෝටර් වාහන කුලියට ලබාදීම | 500 0 | 700 0 | 950 0 |
| 72. | ත්‍රීරෝද රථ අමතර කොටස් අලෙවි කිරීම | 500 0 | 700 0 | 950 0 |
| 73. | උත්සවශාලා පහසුකම් සැපයීම | 500 0 | 750 0 | 1,000 0 |
| 74. | වාහන දුම් පරීක්ෂා කිරීම සඳහා | 500 0 | 750 0 | 1,000 0 |
| 75. | අන්තර්ජාල පහසුකම් සැලසීම | 500 0 | 750 0 | 1,000 0 |
| 76. | ස්වර්ණාභරණ අලෙවිය | 500 0 | 700 0 | 1,000 0 |
| 77. | මල් පැළ අලෙවිය | 500 0 | 700 0 | 950 0 |
| 78. | යතුරු කැපීම | 500 0 | 700 0 | 950 0 |
| 79. | පාවහන් හා බෑග් අලුත්වැඩියා කිරීම | 500 0 | 700 0 | 950 0 |
| 80. | උපදේශන සේවා සැපයීම | 500 0 | 700 0 | 950 0 |
| 81. | බෑග් අලෙවි කිරීම | 500 0 | 700 0 | 950 0 |
| 82. | සුරතල් මසුන් අලෙවිය | 500 0 | 700 0 | 950 0 |
| 83. | රූපලාවන්‍ය ආයතනයක් පවත්වාගෙන යාම | 500 0 | 700 0 | 950 0 |
| 84. | වීදුරු කබඩ් අලෙවිය | 500 0 | 700 0 | 950 0 |
| 85. | තරාදි අලෙවිය හා අලුත්වැඩියාව | 500 0 | 700 0 | 950 0 |
| 86. | ශාරීරික යෝග්‍යතා මධ්‍යස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 700 0 | 950 0 |
| 87. | පෙර පාසලක් පවත්වාගෙන යාම | 500 0 | 700 0 | 950 0 |

10-914/2

## මීනුවන්ගොඩ නගර සභාව

### නගර සභා ආඥාපනතේ 255 වැනි අධිකාරය යටතේ දැන්වීම

(255 අධිකාරය) නගර සභා ආඥාපනතේ 164 වගන්තියේ (1) වැනි උපවගන්තිය සමඟ කියවිය යුතු 162 වන වගන්තිය යටතේ මීනුවන්ගොඩ නගර සභාවට පැවරී ඇති බලතල ප්‍රකාර එකී පනතේ හෝ එකී පනත යටතේ සාදන ලද අතුරු ව්‍යවස්ථාවක විස්තර කර ඇති මෙහි පහත උපලේඛනයෙහි 1 වන තීරුවේ නිරූපිත කාර්යයක් සඳහා මීනුවන්ගොඩ නගර සභා බල ප්‍රදේශය ඇතුළත යම් පරිශ්‍රයක් පාවිච්චි කිරීමට බලය දෙමින් 2017 වර්ෂයේ නිකුත් කරනු ලබන යම් බලපත්‍රයක් සම්බන්ධයෙන් එම උපලේඛනයේ II වැනි තීරුවේ අනුරූප සටහනේ නිරූපිත බලපත්‍ර ගාස්තුවක් 2017.01.01 වැනි දින සිට බලපවත්වන පරිදි පනවා අය කිරීමට මීනුවන්ගොඩ නගර සභාවේ ලේකම් සහ සභාවේ බලතල, කාර්ය, කර්තව්‍ය ක්‍රියාත්මක කිරීමේ නිලධාරී වන එච්. ඒ. එස්. රත්නලතා යන මා විසින් 255 වැනි අධිකාරය වන නගර සභා ආඥාපනතේ අංක 184(අ) වගන්ති ප්‍රකාරව පැවරී ඇති බලතල අනුව 2016.09.14 දින තීරණ අංක 84-XX යටතේ තීරණය කර ඇති බව මෙයින් නිවේදනය කරමි.

තව ද පහත උපලේඛනයේ සඳහන් බලපත්‍ර ගාස්තු, එකී වර්ෂයේ මාර්තු 31 දිනට පෙර ගෙවා අවසන් කළ යුතු බව ද මෙයින් නිවේදනය කරනු ලැබේ.

එච්. ඒ. එස්. රත්නලතා,
ලේකම් සහ සභාවේ බලතල, කාර්ය,
කර්තව්‍ය ක්‍රියාත්මක කිරීමේ නිලධාරී,
මීනුවන්ගොඩ නගර සභාව.

2016 සැප්තැම්බර් මස 14 වැනි දින,
මීනුවන්ගොඩ නගර සභා කාර්යාලයේ දී ය.

**උපලේඛනය**

*1 කොටස - අන්තරාදායක ව්‍යාපාර*

| | *I වැනි තීරුව* | *II වැනි තීරුව* | | |
|---|---|---|---|---|
| | *ව්‍යාපාරයේ ස්වභාවය* | *වාර්ෂික වටිනාකම රු. 750 ට වැඩි නොවන විට* | *වාර්ෂික වටිනාකම රු. 750 ට වැඩි නමුත් රු. 1,500ට වැඩි නොවන විට* | *වාර්ෂික වටිනාකම රු. 1,500 ට වැඩි* |
| | | *රු. ශත* | *රු. ශත* | *රු. ශත* |
| 01. | අළුත් හෝ පාවිච්චි කරන ලද ටයර් හෝ ටියුබ් 50කට වැඩි ප්‍රමාණයක් ගබඩාකර තබාගැනීම | 500 0 | 700 0 | 950 0 |
| 02. | අත්‍යන්ත්‍ර ක්‍රමයකින් හැර වෙනත් ක්‍රමයකින් රෙදි නිපදවීම සඳහා | 500 0 | 700 0 | 950 0 |
| 03. | අත්‍යන්ත්‍ර ක්‍රමයකින් හැර වෙනත් ක්‍රමයකින් නූල් කැටීම හෝ විවීම සඳහා | 500 0 | 700 0 | 950 0 |
| 04. | අතින් ලී ඉරන ඉරුම් වලක් හෝ ඉරුම් මෝලක් පවත්වාගෙන යාම සඳහා | 500 0 | 700 0 | 950 0 |
| 05. | අයිස් නිපදවීම සඳහා | 500 0 | 675 0 | 950 0 |
| 06. | ඉඹුල් පුළුන් හෝ කපු හෝ කපු පුළුන් ගබඩාකර තබා ගැනීම සඳහා | 500 0 | 700 0 | 950 0 |
| 07. | උළු හෝ ගඩොල් ගබඩාකර තබා ගැනීම සඳහා | 500 0 | 700 0 | 950 0 |
| 08. | කබුක්, බොරළු හෝ කලුගල් කැණීම හා ගබඩා කිරීම | 500 0 | 700 0 | 950 0 |
| 09. | කුලියට දීම සඳහා ලාම්පු ගබඩා කිරීම | 500 0 | 700 0 | 950 0 |
| 10. | කොප්පරා නිෂ්පාදනය කිරීම, සකස් කිරීම හෝ ගබඩාකර තබා ගැනීම | 500 0 | 700 0 | 950 0 |
| 11. | කොහු හෝ වෙනත් කෙඳි වර්ග නිපදවීම හෝ ගබඩා කර තබාගැනීම | 500 0 | 700 0 | 950 0 |
| 12. | කොහු හෝ වෙනත් කෙඳි වර්ගවලින් සාදන ලද භාණ්ඩ නිෂ්පාදනය කිරීම හෝ ගබඩාකර තබා ගැනීම | 500 0 | 700 0 | 950 0 |

| I වැනි තීරුව | | II වැනි තීරුව | | |
|---|---|---|---|---|
| | ව්‍යාපාරයේ ස්වභාවය | වාර්ෂික වටිනාකම රු. 750 ට වැඩි නොවන විට | වාර්ෂික වටිනාකම රු. 750 ට වැඩි නමුත් රු. 1,500ට වැඩි නොවන විට | වාර්ෂික වටිනාකම රු. 1,500 ට වැඩි |
| | | රු. ශත | රු. ශත | රු. ශත |
| 13. | ගිනි පෙට්ටි නිෂ්පාදනය සඳහා | 500 0 | 700 0 | 950 0 |
| 14. | ගිනි පෙට්ටි ගබඩා කිරීම (ග්‍රොස් 10කට වැඩි) | 500 0 | 700 0 | 950 0 |
| 15. | ගෙන්දගම් හෝ ගෙන්දගම් කුඩු හොණ්ඩර 1කට වැඩි ප්‍රමාණයක් ගබඩා කිරීම | 500 0 | 700 0 | 950 0 |
| 16. | තේ පෙට්ටි හෝ ලෑලි පෙට්ටි නිෂ්පාදනය කිරීම හෝ ගබඩා කිරීම | 500 0 | 700 0 | 950 0 |
| 17. | දර ගබඩා කරන ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 950 0 |
| 18. | දැව ගබඩා කරන ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 19. | ධාන්‍ය හෝ මාංශ භෝග හොණ්ඩර 05කට වැඩි ප්‍රමාණයක් ගබඩා කිරීම | 500 0 | 700 0 | 950 0 |
| 20. | පාවිච්චි කරන ලද ඇඳුම් ගබඩා කරන ස්ථානයක් සඳහා | 500 0 | 700 0 | 950 0 |
| 21. | පාවිච්චි කරන ලද කඩදාසි හෝ පත්‍ර ගබඩා කරන ස්ථානයක් සඳහා | 500 0 | 700 0 | 950 0 |
| 22. | පිදුරු ගබඩාකර තබා ගැනීම සඳහා | 500 0 | 700 0 | 950 0 |
| 23. | පොල් කටු ගබඩාකර තබා ගැනීම | 500 0 | 700 0 | 950 0 |
| 24. | පොල් තෙල් හැර වෙනත් එළවළු තෙල් වර්ග ගබඩා කිරීම (ගැලුම් 12කට වැඩි) | 500 0 | 700 0 | 950 0 |
| 25. | පොල් තෙල් ගබඩා කිරීම (ගැලුම් 50කට වැඩි) | 500 0 | 700 0 | 950 0 |
| 26. | මෝටර් සයිකල් හෝ බයිසිකල් අලුත්වැඩියා කිරීමේ ස්ථානයක් සඳහා | 500 0 | 700 0 | 950 0 |
| 27. | මැතිලේටඩ් ස්ප්‍රීතු නිෂ්පාදනය කිරීම හෝ ගබඩා කර තබා ගැනීම සඳහා | 500 0 | 700 0 | 950 0 |
| 28. | මැසූ ඇදුම් නිෂ්පාදනය සඳහා | 500 0 | 750 0 | 1,000 0 |
| 29. | මුද්‍රණාලයක් පැවැත්වීම සඳහා | 500 0 | 700 0 | 950 0 |
| 30. | යන්ත්‍රානුසාරයෙන් හෝ වෙනත් ක්‍රමයකින් එළවළු තෙල් නිෂ්කර්ෂණය කිරීම | 500 0 | 700 0 | 950 0 |
| 31. | යන්ත්‍ර උපකරණ පාවිච්චි කරන කම්හලක් සඳහා | 500 0 | 750 0 | 1,000 0 |
| 32. | යන්ත්‍ර උපකරණ පාවිච්චි නොකරන කම්හලක් සඳහා | 500 0 | 700 0 | 950 0 |
| 33. | විසිතුරු පින්තාරු කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම (ස්ප්‍රේ පේන්ටින්) | 500 0 | 700 0 | 950 0 |
| 34. | ස්වර්ණාභරණ නිපදවීමේ හෝ අලුත්වැඩියා කිරීමේ ස්ථානයක් සඳහා | 500 0 | 750 0 | 1,000 0 |
| 35. | සිසිල් බීම නිෂ්පාදනය කිරීම | 500 0 | 700 0 | 950 0 |
| 36. | සිල්ක් හෝ කෘත්‍රිම රෙදි විවීම හා විසිතුරු කිරීමේ ස්ථානයක් සඳහා | 500 0 | 700 0 | 950 0 |
| 37. | ග්‍රොස් එකකට වැඩි සිසිල් බීම බෝතල් ගබඩාකර තබා ගැනීම | 500 0 | 750 0 | 1,000 0 |
| 38. | හිරිගල් හෝ හුණුගල් සඳහා හෑරීම | 500 0 | 700 0 | 950 0 |
| 39. | හිස් බෝතල් හෝ හිස් ගෝනි ගබඩාකර තබාගැනීම සඳහා | 500 0 | 700 0 | 950 0 |
| 40. | තොග වශයෙන් විකිණීම සඳහා පිටි, ලුණු, සීනි ගබඩා කර තබා ගැනීම (කිලෝග්‍රෑම් 750ට වැඩි) | 500 0 | 700 0 | 950 0 |
| 41. | යන්ත්‍රෝපකරණ පාවිච්චි කරන ලී ඉරුම් මෝලක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 42. | ඇඳුම් මැසීමේ ව්‍යාපාරය | 500 0 | 700 0 | 950 0 |

| I වැනි තීරුව | II වැනි තීරුව | | |
|---|---|---|---|
| ව්‍යාපාරයේ ස්වභාවය | වාර්ෂික වටිනාකම රු. 750 ට වැඩි නොවන විට | වාර්ෂික වටිනාකම රු. 750 ට වැඩි නමුත් රු. 1,500ට වැඩි නොවන විට | වාර්ෂික වටිනාකම රු. 1,500 ට වැඩි |
| | රු. ශත | රු. ශත | රු. ශත |
| 43. කෘත්‍රිම අත් පා නිෂ්පාදනය | 500 0 | 700 0 | 950 0 |
| 44. තොරතුරු තාක්ෂණය සම්බන්ධ උපකරණ සවිකිරීම හා අලෙවිය | 500 0 | 750 0 | 1,000 0 |
| 45. මෝටර් වාහන පිරිසිදු කිරීම (ජංගම) ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 46. බිම අතුරන විසිතුරු ගල් හා බ්ලොක් ගල් නිපදවීම | 500 0 | 750 0 | 1,000 0 |

### II කොටස - අප්‍රසන්න ව්‍යාපාර

| | | | |
|---|---|---|---|
| 01. මිනිරන් ශුද්ධ කිරීම හෝ ගබඩා කිරීම | 500 0 | 700 0 | 950 0 |
| 02. පොහොර හෝ රසායනික පොහොර ද්‍රව්‍ය නිපදවීම හෝ ගබඩා කිරීම | 500 0 | 700 0 | 950 0 |
| 03. සම්පදම් කරන ආයතනයක් සඳහා | 500 0 | 700 0 | 950 0 |
| 04. සම් ගබඩාකර තබාගැනීමේ ස්ථානයක් සඳහා | 500 0 | 700 0 | 950 0 |
| 05. උම්බලකඩ නිෂ්පාදනය කිරීම හෝ හොණ්ඩර 5කට වැඩි ප්‍රමාණයක් ගබඩාකර තබාගැනීම | 500 0 | 700 0 | 950 0 |
| 06. කුකුළන් 100කට වැඩි ප්‍රමාණයක් සඳහා කුකුළු ගාලක් හෝ කොටුවක් පවත්වාගෙන යාම | 500 0 | 700 0 | 950 0 |
| 07. බැටළුවන්, එළුවන්, හෝ ඌරන් 10කට වැඩි ප්‍රමාණයක මඩුවක් හෝ ගාලක් පවත්වාගෙන යාම | 500 0 | 700 0 | 950 0 |
| 08. රබර් නිෂ්පාදනය හෝ ගබඩා කිරීම සඳහා | 500 0 | 700 0 | 950 0 |
| 09. පශු වෛද්‍ය ගිලන්හලක් පවත්වාගෙන යාම සඳහා | 500 0 | 700 0 | 950 0 |
| 10. පුවක් සකස් කිරීම හෝ ගබඩාකර තබාගැනීම | 500 0 | 700 0 | 950 0 |
| 11. කරවල, ලුණු, මාළු හෝ ජාඩි හොණ්ඩර 3කට වැඩි ප්‍රමාණයක් ගබඩා කර තබා ගැනීම | 500 0 | 700 0 | 950 0 |
| 12. මස්, මාළු හෝ ජාඩි දැමීම වේලීම හෝ අයිස් දැමීමේ ස්ථානයක් සඳහා | 500 0 | 700 0 | 950 0 |
| 13. අඟුරු සඳහා දැව හෝ පොල් කටු දැවීම හෝ අඟුරු ගබඩා කරන ස්ථානයක් සඳහා | 500 0 | 700 0 | 950 0 |
| 14. සිමෙන්ති හොණ්ඩර 25 ට වැඩි ප්‍රමාණයක් ගබඩාකර තබා ගැනීමේ ස්ථානයක් සඳහා | 500 0 | 700 0 | 950 0 |
| 15. අලවන ද්‍රව්‍ය නිෂ්පාදනය කිරීම | 500 0 | 700 0 | 950 0 |
| 16. දුම්කොළ සකස් කිරීම හෝ ගබඩා කිරීම | 500 0 | 700 0 | 950 0 |
| 17. සත්ව ආහාර ගබඩාවක් පවත්වාගෙන යාම | 500 0 | 700 0 | 950 0 |
| 18. පුන්නක්කු ටොන් 01කට වැඩි ප්‍රමාණයක් ගබඩාකර තබාගැනීම | 500 0 | 700 0 | 950 0 |
| 19. සත්ව ආහාර හෝ කුකුළු කෑම නිපදවීම | 500 0 | 700 0 | 950 0 |
| 20. සතුන්ගේ මාංශ පේශි හෝ ලේ පැස්සීමේ ස්ථානයක් සඳහා | 500 0 | 700 0 | 950 0 |
| 21. සබන් නිපදවන ස්ථානයක් සඳහා | 500 0 | 700 0 | 950 0 |
| 22. සව් හෝ මඤ්ඤොක්කා කැට (ටැපියොක්කා) නිපදවීමේ ස්ථානයක් සඳහා | 500 0 | 700 0 | 950 0 |
| 23. ඇටකටු ගබඩා කිරීම සඳහා අංගනයක් හෝ ගබඩාවක් පවත්වාගෙන යාම | 500 0 | 700 0 | 950 0 |
| 24. ට්‍රන්ක පෙට්ටි නිපදවීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 700 0 | 950 0 |

| | *I වැනි තීරුව* | *II වැනි තීරුව* | | |
|---|---|---|---|---|
| | *ව්‍යාපාරයේ ස්වභාවය* | *වාර්ෂික වටිනාකම රු. 750 ට වැඩි නොවන විට* | *වාර්ෂික වටිනාකම රු. 750 ට වැඩි නමුත් රු. 1,500ට වැඩි නොවන විට* | *වාර්ෂික වටිනාකම රු. 1,500 ට වැඩි* |
| | | *රු. ශත* | *රු. ශත* | *රු. ශත* |
| 25. | අළුත් හෝ පරණ ලෝහ ගබඩාකර තැබීම | 500 0 | 750 0 | 1,000 0 |
| 26. | ගෘහ භාණ්ඩ නිපදවීම හෝ ගබඩාකර තැබීම | 500 0 | 750 0 | 1,000 0 |
| 27. | මෙරට හෝ රට වේවැල් වලින් භාණ්ඩ සෑදීම හෝ ඒවා ගබඩා කිරීමේ ස්ථානයක් සඳහා | 500 0 | 700 0 | 950 0 |
| 28. | වඩු කර්මාන්ත ශාලාවක් සඳහා | 500 0 | 700 0 | 950 0 |
| 29. | කොන්ක්‍රීට් හෝ මැටි පයිප්ප ගබඩා කර තැබීම | 500 0 | 700 0 | 950 0 |
| 30. | සිරප් හෝ පළතුරු බීම සෑදීම | 500 0 | 700 0 | 950 0 |
| 31. | රස කැවිලි නිපදවීම | 500 0 | 700 0 | 950 0 |
| 32. | පොල් ලෙලි හෝ දැව පල් කිරීම සඳහා කොටුවක් පැවැත්වීම | 500 0 | 700 0 | 950 0 |
| 33. | මේද නිපදවීම හෝ නිෂ්කර්ෂණය කිරීම සඳහා | 500 0 | 700 0 | 950 0 |
| 34. | දත් බුරුසු හැර වෙනත් බුරුසු නිෂ්පාදනය කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 700 0 | 950 0 |
| 35. | දත් බුරුසු නිපදවීම | 500 0 | 700 0 | 950 0 |
| 36. | රා එකතු කිරීමේ ස්ථානයක් සඳහා | 500 0 | 700 0 | 950 0 |
| 37. | විනාකිරි නිපදවීමේ හෝ ගබඩා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 700 0 | 950 0 |
| 38. | ඇසිඩ් වර්ග නිපදවීම හෝ ගබඩා කිරීම | 500 0 | 700 0 | 950 0 |
| 39. | හුණුගල් හෝ හුණු ගබඩාකර තැබීම සඳහා | 500 0 | 700 0 | 950 0 |
| 40. | ලෑලි සකස් කිරීම හෝ ලෑලි පදම් කිරීම සඳහා | 500 0 | 700 0 | 950 0 |
| 41. | ගෝඩා නිපදවීම | 500 0 | 700 0 | 950 0 |
| 42. | කොකෝවා හෝ වියළි පැපොල් කිරි ගබඩා කර තබා ගැනීම | 500 0 | 700 0 | 950 0 |
| 43. | පින්තාරු තීන්ත, වාර්නිෂ්, ඩිස්ටැම්පර් සායම් හෝ ඒවා හොණ්ඩර 05කට වැඩියෙන් ගබඩා කරන ස්ථානයක් සඳහා | 500 0 | 700 0 | 950 0 |
| 44. | පළතුරු, මාළු හෝ වෙනත් කෑම වර්ග ටින්වල ඇසිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 700 0 | 950 0 |
| 45. | කෝපි, ධාන්‍ය වර්ග, කුළු බඩු හෝ පිටි ඇඹරීම | 500 0 | 700 0 | 950 0 |
| 46. | බේකින් පවුඩර් නිපදවීම සඳහා | 500 0 | 700 0 | 950 0 |
| 47. | ගෑස් මැන්ටල් නිපදවීම | 500 0 | 700 0 | 950 0 |
| 48. | පොටි නිපදවීම සඳහා | 500 0 | 700 0 | 950 0 |
| 49. | ඉටිපන්දම් නිපදවීම සඳහා | 500 0 | 700 0 | 950 0 |
| 50. | කපුරු නිපදවීම | 500 0 | 700 0 | 950 0 |
| 51. | සායම් කුඩු නිපදවීම | 500 0 | 700 0 | 950 0 |
| 52. | ලාකඩ නිපදවීම | 500 0 | 700 0 | 950 0 |
| 53. | සුවද පුයර නිපදවීම | 500 0 | 700 0 | 950 0 |
| 54. | පාසැල් රටහුණු නිපදවීම | 500 0 | 700 0 | 950 0 |
| 55. | ලියන තීන්ත, අච්චු තීන්ත හෝ ස්ටෙන්සිල් තීන්ත නිපදවීම | 500 0 | 700 0 | 950 0 |
| 56. | ටයර් කට්ටා කැපීම හෝ පිරවීම සඳහා ආයතනයක් පවත්වාගෙන යාම | 500 0 | 700 0 | 950 0 |
| 57. | ටයර් හෝ ටියුබ් වොල්කනයිස් කිරීම සඳහා ආයතනයක් පවත්වාගෙන යාම | 500 0 | 700 0 | 950 0 |
| 58. | පැණි නිපදවීම හෝ ගබඩාකර තබාගැනීම සඳහා | 500 0 | 700 0 | 950 0 |
| 59. | වැලි කඩදාසි නිපදවීම සඳහා | 500 0 | 700 0 | 950 0 |
| 60. | ගල් නිපදවීම, ඇඹරීම හෝ ඔප දැමීම සඳහා | 500 0 | 750 0 | 1,000 0 |
| 61. | පාසල් ගල් ලෑලි නිපදවීම | 500 0 | 700 0 | 950 0 |

| *I වැනි තීරුව* | | *II වැනි තීරුව* | | |
|---|---|---|---|---|
| | *ව්‍යාපාරයේ ස්වභාවය* | *වාර්ෂික වටිනාකම රු. 750 ට වැඩි නොවන විට* | *වාර්ෂික වටිනාකම රු. 750 ට වැඩි නමුත් රු. 1,500ට වැඩි නොවන විට* | *වාර්ෂික වටිනාකම රු. 1,500 ට වැඩි* |
| | | *රු. ශත* | *රු. ශත* | *රු. ශත* |
| 62. | සෞඛ්‍ය තුවා කඩ නිපදවීම | 500 0 | 700 0 | 950 0 |
| 63. | ප්ලාස්ටික් භාණ්ඩ නිපදවීම | 500 0 | 700 0 | 950 0 |
| 64. | මුහුදු පාසි සකස් කරගැනීම හෝ ගබඩාකර තැබීමේ ස්ථානයක් සඳහා | 500 0 | 700 0 | 950 0 |
| 65. | සෙල්ලම් බඩු නිපදවීම | 500 0 | 700 0 | 950 0 |
| 66. | ශීතකළ මස් හෝ මාළු ගබඩාකර තබාගැනීම සඳහා | 500 0 | 700 0 | 950 0 |
| 67. | ඡායාරූප ශාලාවක් පැවැත්වීම සඳහා | 600 0 | 900 0 | 1,000 0 |
| 68. | මැණික් ගල් කැපීමේ හෝ ඔප දැමීමේ ස්ථානයක් සඳහා | 500 0 | 700 0 | 1,000 0 |
| 69. | දිය හුණු, සුදු හුණු හෝ හිරිගල් නිපදවීමේ ස්ථානයක් සඳහා | 500 0 | 700 0 | 950 0 |
| 70. | එනසහල්, කරදමුංගු සකස් කිරීම හෝ වේලීම | 500 0 | 700 0 | 950 0 |
| 71. | රෙදි සෝදන නිල් නිපදවීම සඳහා | 500 0 | 700 0 | 950 0 |
| 72. | කපාපු පොල් නිපදවීම | 500 0 | 700 0 | 950 0 |
| 73. | යන්ත්‍රානුසාරයෙන් ධාන්‍ය හෝ මාංශ භෝග කෙටීම සඳහා | 500 0 | 700 0 | 950 0 |
| 74. | මාගරින් නිපදවීමේ ස්ථානයක් සඳහා | 500 0 | 700 0 | 950 0 |
| 75. | සිමෙන්ති භාණ්ඩ හෝ ඇස්බැස්ටස් සිමෙන්ති භාණ්ඩ නිපදවීමේ ස්ථානයක් පැවැත්වීම | 500 0 | 700 0 | 950 0 |
| 76. | තොග වශයෙන් විකිණීම සඳහා නරක්වන සුළු කෑම වර්ග සහ ආහාර ද්‍රව්‍ය ගබඩාකර තබාගැනීම | 500 0 | 750 0 | 1,000 0 |
| 77. | ලෝහමය සුන්බුන් ද්‍රව්‍ය ගබඩාකර තබාගැනීම | 500 0 | 750 0 | 1,000 0 |
| 78. | සම් භාණ්ඩ නිෂ්පාදනය සඳහා කර්මාන්ත ශාලාවක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 79. | කෙඳි සායම් කිරීම | 500 0 | 700 0 | 950 0 |
| 80. | බාබර් සාප්පු ව්‍යාපාරය | 500 0 | 700 0 | 950 0 |
| 81. | බේකරි ව්‍යාපාරය | 500 0 | 700 0 | 950 0 |
| 82. | නවාතැන්පොල හා භෝජන ශාලා ව්‍යාපාරය | 500 0 | 700 0 | 1,000 0 |
| 83. | භෝජන ශාලා ව්‍යාපාරය | 500 0 | 700 0 | 1,000 0 |
| 84. | තේ කඩ ව්‍යාපාරය | 500 0 | 700 0 | 950 0 |
| 85. | ශීත කළ කිරි අලෙවිය (කිරි ශීත කිරීම) | 500 0 | 700 0 | 950 0 |
| 86. | පළතුරු හා එළවළු අලෙවිය | 500 0 | 700 0 | 950 0 |
| 87. | ඇන්ටනා නිෂ්පාදනය | 500 0 | 700 0 | 950 0 |
| 88. | වතුර පොම්ප, ජෙනරේටර්, තණකොළ කපන මැෂින් අලුත්වැඩියාව | 500 0 | 700 0 | 950 0 |

III කොටස

*අප්‍රසන්න හා අන්තරාදායක ව්‍යාපාර*

| | | | | |
|---|---|---|---|---|
| 01. | තලාතු, මිනිරන් ශුද්ධ කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 700 0 | 950 0 |
| 02. | ඩ්‍රයි ක්ලීන් කරන හෝ සායම් දමන ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 700 0 | 950 0 |
| 03. | විද්‍යුත් ලෝහ ආලේපනය කිරීමේ ස්ථානයක් සඳහා | 500 0 | 700 0 | 950 0 |
| 04. | රෙදි මුද්‍රණය කරන හෝ සායම් දමන ස්ථානයක් සඳහා | 500 0 | 700 0 | 950 0 |
| 05. | සත්ව මේද හෝ තෙල් පැස්සීමේ ස්ථානයක් සඳහා | 500 0 | 700 0 | 950 0 |
| 06. | හුණු පිළිස්සීම, සකස් කිරීම, ගබඩා කිරීම හෝ හුණුගල් කැඩීම සඳහා | 500 0 | 700 0 | 950 0 |
| 07. | ගිනිකෙළි භාණ්ඩ, රතිඤ්ඤා විකිණීම | 500 0 | 700 0 | 950 0 |
| 08. | මෝර වරල් සකස් කිරීම හා ගබඩා කර තබා ගැනීම | 500 0 | 700 0 | 950 0 |

| | *I වැනි තීරුව* | *II වැනි තීරුව* | | |
|---|---|---|---|---|
| | *ව්‍යාපාරයේ ස්වභාවය* | *වාර්ෂික වටිනාකම රු. 750 ට වැඩි නොවන විට* | *වාර්ෂික වටිනාකම රු. 750 ට වැඩි නමුත් රු. 1,500ට වැඩි නොවන විට* | *වාර්ෂික වටිනාකම රු. 1,500 ට වැඩි* |
| | | *රු. ශත* | *රු. ශත* | *රු. ශත* |
| 09. | තේ හොණ්ඩර 03කට වඩා ගබඩාකිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 700 0 | 950 0 |
| 10. | බැටරි චාජ් කිරීමේ හෝ අළුත්වැඩියා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 700 0 | 950 0 |
| 11. | වැල්ඩින් කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 700 0 | 950 0 |
| 12. | බෝට්ටු තැනීම සඳහා ස්ථානයක් පවත්වාගෙන යාම සඳහා | 500 0 | 700 0 | 950 0 |
| 13. | යන්ත්‍රානුසාරයෙන් ලෝහ කුඩු කිරීම සඳහා | 500 0 | 700 0 | 950 0 |
| 14. | වාත්තු මඩුවක් පවත්වාගෙන යාම සඳහා | 500 0 | 700 0 | 950 0 |
| 15. | බෙලෙක් වැඩපලක් පවත්වාගෙන යාම සඳහා | 500 0 | 700 0 | 950 0 |
| 16. | ගල් ස්මාරක නිපදවීම | 500 0 | 700 0 | 950 0 |
| 17. | පෙට්‍රල්, ඩීසල් හෝ වෙනත් ඛණිජ තෙල් ගබඩාකර තබා ගැනීම සඳහා | 500 0 | 750 0 | 1,000 0 |
| 18. | පෙට්‍රල් නිකුත් කරන ස්ථානයක් පවත්වාගෙන යාම සඳහා | 500 0 | 750 0 | 1,000 0 |
| 19. | මෝටර් වාහන සඳහා බොඩි නිපදවීමේ ස්ථානයක් පවත්වාගෙන යාම සඳහා | 600 0 | 750 0 | 1,000 0 |
| 20. | පොලිෂ් හෝ ඉටි වර්ග නිපදවීම | 500 0 | 700 0 | 950 0 |
| 21. | කෘෂි රසායනික ද්‍රව්‍ය නිපදවීම හෝ ගබඩාකර තබාගැනීම | 500 0 | 700 0 | 950 0 |
| 22. | විෂ බීජ නාශක ද්‍රව්‍ය නිපදවීමේ ස්ථානයක් සඳහා | 500 0 | 700 0 | 950 0 |
| 23. | මදුරුකව (කොයිල්) නිපදවීම සඳහා | 500 0 | 700 0 | 950 0 |
| 24. | ලී බඩු ආරක්ෂක ද්‍රව්‍ය නිපදවීම සඳහා | 500 0 | 700 0 | 950 0 |
| 25. | රබර් ද්‍රාවක හෝ රබර් සිමෙන්ති නිපදවීමේ ස්ථානයක් සඳහා | 500 0 | 700 0 | 950 0 |
| 26. | ගල් තාර නිෂ්පාදන නිපදවීම | 500 0 | 700 0 | 950 0 |
| 27. | වීදුරු භාණ්ඩ නිපදවන ස්ථානයක් සඳහා | 500 0 | 700 0 | 950 0 |
| 28. | වීදුරු කැටපත් නිපදවන ස්ථානයක් සඳහා | 500 0 | 700 0 | 950 0 |
| 29. | යකඩ තහඩු ගැල්වනයිස් කිරීමේ ස්ථානයක් සඳහා | 500 0 | 700 0 | 950 0 |
| 30. | පාස්සන ඊයම් නිපදවන ස්ථානයක් පවත්වාගෙන යාම සඳහා | 500 0 | 700 0 | 950 0 |
| 31. | ඇළුමිනියම් භාණ්ඩ නිපදවීම | 500 0 | 700 0 | 950 0 |
| 32. | කටුකම්බි නිපදවීම | 500 0 | 700 0 | 950 0 |
| 33. | කම්බි ඇණ නිපදවීම | 500 0 | 700 0 | 950 0 |
| 34. | කාබන් කඩදාසි හෝ යතුරුලියන පටි නිපදවීම සඳහා | 500 0 | 700 0 | 950 0 |
| 35. | බෙලෙක් බඳුන්, වානේ පයිප්ප හෝ ගබඩා ටැංකි නිපදවීමේ ස්ථානයක් සඳහා | 500 0 | 700 0 | 950 0 |
| 36. | ජී. අයි. බාල්දි නිපදවීම | 500 0 | 700 0 | 950 0 |
| 37. | වායුසමීකරණ, ශීතකරණ හෝ අධිශීතකරණ නිපදවන ස්ථානයක් සඳහා | 500 0 | 700 0 | 950 0 |
| 38. | බ්‍රේක් ලයිනින් හෝ ක්ලච් ලයිනින් නිපදවීම | 500 0 | 700 0 | 950 0 |
| 39. | යන්ත්‍ර උපකරණ නිපදවීම සඳහා | 500 0 | 750 0 | 1,000 0 |
| 40. | විදුලි භාණ්ඩ නිපදවීම | 500 0 | 700 0 | 950 0 |
| 41. | රබර් කවන ලද කෙඳි වර්ග නිපදවීම සඳහා | 500 0 | 700 0 | 950 0 |
| 42. | සංචායක බැටරි නිපදවීම | 500 0 | 700 0 | 950 0 |
| 43. | වියළි කෝෂ බැටරි නිපදවීම | 500 0 | 700 0 | 950 0 |
| 44. | ඊයම් බැටරි නැවත චාජ් කිරීම සඳහා ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 700 0 | 950 0 |
| 45. | රන්කම් සුන්බුන්වලින් වටිනා ලෝහ නිෂ්කර්ෂණය කිරීමේ ස්ථානයක් සඳහා | 500 0 | 700 0 | 950 0 |

| | I වැනි තීරුව | II වැනි තීරුව | | |
|---|---|---|---|---|
| | ව්‍යාපාරයේ ස්වභාවය | වාර්ෂික වටිනාකම රු. 750 ට වැඩි නොවන විට | වාර්ෂික වටිනාකම රු. 750 ට වැඩි නමුත් රු. 1,500ට වැඩි නොවන විට | වාර්ෂික වටිනාකම රු. 1,500 ට වැඩි |
| | | රු. ශත | රු. ශත | රු. ශත |
| 46. | ට්‍රැක්ටර් රථ එකලස් කිරීම | 300 0 | 600 0 | 1,000 0 |
| 47. | රේඩියේටර් නිපදවීම සඳහා | 500 0 | 700 0 | 950 0 |
| 48. | විදුලි කර්මාන්ත වැඩපළක් හෝ ගුවන් විදුලි යන්ත්‍ර අළුත්වැඩියා කරන වැඩපලක් හෝ ගුවන් විදුලි යන්ත්‍ර නිපදවන ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 700 0 | 950 0 |
| 49. | රසායන ද්‍රව්‍ය භාවිතා කොට කුරුඳු, කරදමුංගු, එනසහල් හෝ කෙඳි වර්ග සකස් කිරීමේ ස්ථානයක් සඳහා | 500 0 | 700 0 | 950 0 |
| 50. | මැටි බඳුන් ඔප දැමීම | 500 0 | 700 0 | 950 0 |
| 51. | මෝටර් වාහන සර්විස් කිරීම හෝ අළුත්වැඩියා කිරීම සඳහා වැඩපලක් පවත්වාගෙන යාම | 500 0 | 700 0 | 950 0 |
| 52. | සර්විස් කිරීම හෝ අළුත්වැඩියා කිරීම | 500 0 | 700 0 | 950 0 |
| 53. | ලංකා සංචාරක මණ්ඩලයේ ලියාපදිංචි හෝ එකී මණ්ඩලයේ අනුමත හෝටල්/ආපනශාලා/නවාතැන්පොල | 2015 වර්ෂයේ ලැබීම්වලින් 1%ක මුදලක් | | |
| 54. | පොලිතින් ප්‍රතිචක්‍රීකරණය මගින් පොලිතින් නිපදවීම | 500 0 | 750 0 | 1,000 0 |
| 55. | ඇලුමිනියම් භාණ්ඩ නිපදවීම හා අලෙවිය | 500 0 | 750 0 | 1,000 0 |
| 56. | කෘෂි භෝග, බීජ, නිෂ්පාදන සහ අලෙවිය | 500 0 | 750 0 | 1,000 0 |

10-914/3

---

## මිනුවන්ගොඩ නගර සභාව

### නගර සභා ආඥාපනතේ 255 වැනි අධිකාරය යටතේ දැන්වීම

(255 අධිකාරය) නගර සභා ආඥාපනතේ 164 වගන්තිය සහ 162 වගන්තිය යටතේ මිනුවන්ගොඩ නගර සභාවට පැවරී ඇති බලතල ප්‍රකාර එකී පනතේ හෝ ඒ යටතේ සාදන ලද අතුරු ව්‍යවස්ථාවක විධිවිධාන යටතේ බලපත්‍රයක් ලබාගැනීම හෝ එම පනතේ 165 අ (1) වන වගන්තිය යටතේ යම් බද්දක් ගෙවීම අවශ්‍ය නොවන්නා වූ යම් ව්‍යාපාරයක් මිනුවන්ගොඩ නගර සභා බල ප්‍රදේශය ඇතුළත 2017 වර්ෂයේ දී පවත්වාගෙන යන සෑම තැනැත්තෙකුගෙන්ම (255 අධිකාරය) නගර සභා ආඥපනතේ 165 (ආ) වගන්තියේ බලතල ප්‍රකාරව, එම ව්‍යාපාරයේ 2016 වර්ෂයේ ආදායම මෙහි පහත උපලේඛනයේ I වන තීරුවේ නිරූපිත යම් විෂයාංකයක සීමාවන් ඇතුළත පවතින අවස්ථාවක එකී II තීරුවේ අනුරූප සටහනේ නිරූපිත අනුප්‍රමාණයක ව්‍යාපාර බද්දක් පහත 2017 වර්ෂය සඳහා පනවා අයකළ යුතු බවට මිනුවන්ගොඩ නගර සභාවේ ලේකම් සහ සභාවේ බලතල කාර්ය කර්තව්‍ය ක්‍රියාත්මක කිරීමේ නිලධාරි වන එච්. ඒ. එස්. රත්නලතා වන මා විසින් 255 වන අධිකාරය වන නගර සභා ආඥපනතේ අංක 184(අ) වගන්ති ප්‍රකාරව පැවරී ඇති බලතල අනුව 2016.09.14 දින තීරණ අංක 84-XX යටතේ තීරණය කර ඇති බව මෙයින් නිවේදනය කරමි.

තව ද, පහත උපලේඛනයේ සඳහන් ව්‍යාපාර බද්ද, එකී වර්ෂයේ මාර්තු 31 දිනට පෙර ගෙවා අවසන් කළ යුතු බව ද මෙයින් නිවේදනය කරනු ලැබේ.

එච්. ඒ. එස්. රත්නලතා,
ලේකම් සහ සභාවේ බලතල කාර්ය
කර්තව්‍ය ක්‍රියාත්මක කිරීමේ නිලධාරි,
මිනුවන්ගොඩ නගර සභාව.

2016 සැප්තැම්බර් මස 14 වැනි දින,
මිනුවන්ගොඩ නගර සභා කාර්යාලයේ දී ය.

*උපලේඛනය*

| | *I වැනි තීරය* *ව්‍යාපාරයෙන් වර්ෂයක ලැබීම්* | *II වැනි තීරය* *ගෙවිය යුතු බද්ද* *රු. ශත* |
|---|---|---|
| (1) | රු. 6,000 නොඉක්මවන විට | නැත |
| (2) | රු. 6,000 ඉක්මවන නමුත් රු. 12,000 නොඉක්මවන විට | 90 0 |
| (3) | රු. 12,000 ඉක්මන නමුත් රු. 18,750 නොඉක්මවන විට | 180 0 |
| (4) | රු. 18,750 ඉක්මවන නමුත් රු. 75,000 නොඉක්මවන විට | 360 0 |
| (5) | රු. 75,000 ඉක්මවන නමුත් රු. 1,50,000 නොඉක්මවන විට | 1,200 0 |
| (6) | රු. 1,50,000 ඉක්මවන විට | 3,000 0 |

10-914/4

---

## කිරින්ද පුහුල්වැල්ල ප්‍රාදේශීය සභාව

### 2017 වර්ෂයට පරිසර ආරක්ෂණ බලපත්‍ර ගාස්තු හා පරීක්ෂණ ගාස්තු පැනවීම

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9 (3) වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව, තීරණ ලේඛනයේ අංක 395(6) යටතේ පහත සඳහන් පරිදි පරිසර ආරක්ෂණ බලපත්‍ර ගාස්තු හා පරීක්ෂණ ගාස්තු පනවා අය කිරීමට තීරණය කරන ලද බව මෙයින් නිවේදනය කරමි.

2000 අංක 53 සහ 1988 අංක 56 දරන පනත්වලින් සංශෝධිත 1980 අංක 47 දරන ජාතික පාරිසරික පනත සහ ඒ යටතේ පනවන ලද රෙගුලාසිවලට අනුකූලව අංක 1533/16 දරන වර්ෂ 2008 ක් වූ ජනවාරි 25 දිනැති අති විශෙෂ ගැසට් පත්‍රයේ 'ඇ' කොටසේ නියමිත ව්‍යාපෘති ලෙස ප්‍රකාශිත පහත සඳහන් ක්‍රියාකාරකම් සම්බන්ධයෙන් මෙහි සඳහන් උපලේඛනයේ සඳහන් ක්‍රියා පටිපාටියට අනුව 2017 වර්ෂය සඳහා කර්මාන්ත හිමිකරුවන් විසින් පරිසර ආරක්ෂණ බලපත්‍ර ගාස්තු හා පරීක්ෂණ ගාස්තු ගෙවිය යුතු බවටත්, ඒ අනුව පරිසර ආරක්ෂණ බලපත්‍ර නිකුත් කිරීම, අළුත් කිරීම, අවලංගු කිරීම, ප්‍රතික්ෂේප කිරීම සහ අත්හිටුවීම සම්බන්ධව සලකා බැලිය යුතු බවට කිරින්ද පුහුල්වැල්ල ප්‍රාදේශීය සභාවේ ලේකම් දික්කුඹුරගේ දයාසීලි වන මා 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9 (3) වැනි වගන්තිය ප්‍රකාරව තීරණය කරමි.

දික්කුඹුරගේ දයාසීලි,
ලේකම්,
කිරින්ද පුහුල්වැල්ල ප්‍රාදේශීය සභාව.

2016 සැප්තැම්බර් මස 03 වැනි දින,
කිරින්ද පුහුල්වැල්ල ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

***කර්මාන්තයේ ස්වභාවය අනුව :***

| | | |
|---|---|---|
| 01. | පරීක්ෂණ ගාස්තු මුදල | - රු. 3,000 සිට රු. 10,000 දක්වා වූ උපරිමයට යටත්ව අය කිරීම |
| 02. | පරිසර බලපත්‍ර ගාස්තු මුදල | - රු. 4,000 |
| | පරිසර බලපත්‍රය සඳහා මුද්දර ගාස්තු | - රු. 400 |

***උපලේඛනය***

'ඇ' කොටස ඃ

01. සියලුම වාහන ඉන්ධන පිරවුම්හල් (ද්‍රව පෙට්‍රෝලියම් හා ද්‍රවීකෘත පෙට්‍රෝලියම් වායු).
02. සේවක සංඛ්‍යාව 10ක් හෝ ඊට වැඩි සංඛ්‍යාවක් සේවයේ යෙදෙන ඉටිපන්දම් නිෂ්පාදන කර්මාන්ත.
03. සේවක සංඛ්‍යාව 10ක් හෝ ඊට වැඩි සංඛ්‍යාවක් සහ 25ට අඩු සේවක සංඛ්‍යාවක් සේවයේ යොදවන පොල්තෙල් සිඳීමේ කර්මාන්ත.

04. සේවක සංඛ්‍යාව 10ක් හෝ ඊට වැඩි සංඛ්‍යාවක් සහ 25ට අඩු සේවක සංඛ්‍යාවක් සේවයේ යොදවන මධ්‍යසාර අඩංගු නොවන බීම වර්ග නිෂ්පාදනය කිරීමේ කර්මාන්ත.
05. විදුලි ක්‍රියාවලි සහිත වී මෝල්.
06. මාසික නිෂ්පාදන ධාරිතාව කි. ග්‍රෑම් 1,000කට අඩුවන ඇඹරුම් හල්.
07. දුම්කොළ වේලීමේ කර්මාන්ත.
08. සල්ෆර් දුම් ගැසීම සහිත එක් ක්‍රියාවලියක දී නිෂ්පාදන ධාරිතාව කි. ග්‍රෑම් 500ක් හෝ එයට වැඩි ධාරිතාවක් සහිත කුරුඳු දුම්ගැසීමේ කර්මාන්ත.
09. කෑමට ගන්නා ලුණු ඇසිරීමේ හා සැකසීමේ කර්මාන්ත.
10. ක්ෂණික තේ කර්මාන්තශාලා හැර අනෙකුත් තේ කර්මාන්ත ශාලා.
11. කොන්ක්‍රීට් පෙරසවි කර්මාන්ත.
12. යන්ත්‍රානුසාරයෙන් සිමෙන්ති බ්ලොක්ගල් නිෂ්පාදනය කිරීමේ කර්මාන්ත.
13. දිනකට මෙට්‍රික් ටොන් 20ට අඩු නිෂ්පාදන ධාරිතාවක් සහිත හුණු පෝරණු.
14. ප්ලාස්ටර් ඔෆ් පැරිස් නිෂ්පාදනය කිරීමේ කර්මාන්ත හෝ සේවකයින් 25ට අඩු සංඛ්‍යාවක් සේවයේ නියුක්ත පිඟන් මැටි භාණ්ඩ නිෂ්පාදනය කිරීමේ කර්මාන්ත.
15. සියලු බෙලිකටු ඇඹරීමේ කර්මාන්ත.
16. උළු සහ ගඩොල් කර්මාන්ත.
17. එක් වරකට එක් බෝරවලක් බැගින් පුපුරවමින් මසකට ඝන මීටර් 600ක නිෂ්පාදන ධාරිතාවකට අඩු මිනිස් ශ්‍රමය හා පුපුරණ ද්‍රව්‍ය භාවිතයෙන් සිදුකරනු ලබන කැණීම්.
18. දිනකට ඝන මීටර් 50ට අඩු දැව ඉරුම් ධාරිතාවයක් ඇති ලී මෝල් හෝ බෝරෝන් පිරියම් ක්‍රමය භාවිතයෙන් දැව පිරියම් කිරීමේ කර්මාන්ත හෝ දැව පදම් කිරීමේ කර්මාන්ත.
19. බහු කාර්ය යන්ත්‍ර භාවිතා කරන වඩු කර්මාන්ත හෝ සේවකයින් 5ට වැඩි 25ට අඩු ගණනක් සේවයේ යෙදෙන දැව ආශ්‍රිත කර්මාන්ත.
20. නේවාසික කාමර 05ක් හෝ ඊට වැඩි සහ 20ට අඩු හෝටල් ආගන්තුක නිවාස සහ තානායම්.
21. වාහනවල වායු සමීකරණ යන්ත්‍ර අළුත්වැඩියා කිරීමේ , නඩත්තු කිරීමේ හා සවි කිරීමේ කටයුතු හෝ විසිරි පින්තාරු කටයුතු සිදුකරන ගරාජ හැර අනෙකුත් වාහන අලුත්වැඩියා කිරීමේ/නඩත්තු කිරීමේ කටයුතු සිදුකරන ගරාජ.
22. ශීතකරණ හා වායු සමීකරණ යන්ත්‍ර අළුත්වැඩියා කිරීම, නඩත්තු කිරීම හා සවිකිරීම සිදුකරන ස්ථාන.
23. වාහන සේවා කටයුතු සිදු නොකරන කන්ටේනර් බහාලූ පර්යන්ත.
24. සේවකයින් 10ක් හෝ ඊට වැඩි සංඛ්‍යාවක් සේවයේ යෙදෙන සියලුම විදුලි හෝ ඉලෙක්ට්‍රොනික් භාණ්ඩ අළුත්වැඩියා කිරීමේ ස්ථාන.
25. ඊයම් උණු කිරීම සිදු කිරීම ඇතුළත් නොවන මුද්‍රණාල සහ අකුරු මුද්‍රණය කිරීමේ යන්ත්‍ර.

02. ඉහත උපලේඛන 1 හි "ඇ" කොටසේ සඳහන් ක්‍රියාකාරකම් හා සම්බන්ධ වන පරිසර දූෂණයන් වලක්වාලීම අඩු කිරීම හා පාලනය කිරීම සඳහා වැඩ සටහන් ක්‍රියාත්මක කිරීම.
03. ඉහත උපලේඛන 1 හි "ඇ" කොටසේ සඳහන් ක්‍රියාකාරකම් සම්බන්ධයෙන් එන පැමිණිලි පරීක්ෂා කිරීම හා විමර්ශන කිරීම් කරගෙන යාම හා ජාතික පාරිසරික පනත හා එහි රෙගුලාසිවලට අනුකූල බව තහවුරු කිරීම සඳහා සුදුසු ක්‍රියා මාර්ග ගැනීම.

04. දැනට ඇති පාරිසරික පැතිකඩ සැලකිල්ලට ගෙන අදාළ පාලන ප්‍රදේශ සඳහා ක්‍රියාකාරි සැලසුම් සූදානම් කිරීම.

05. පරිසරය සම්බන්ධයෙන් මහජනයා දැනුවත් කිරීම සඳහා වැඩ සටහන් ක්‍රියාත්මක කිරීම.

06. පාරිසරික පරිහානියේ යම් අංශයකට අදාළව පර්යේෂණ පැවැත්වීම ප්‍රවර්ධනය කිරීම සහ සම්බන්ධීකරණය කිරීම හෝ එවැනි පරිහානියක් වැළැක්වීම සහ පරිසරය ආරක්ෂා කිරීමට ද වැඩි දියුණු කිරීමට ද උපමානයන් වර්ධනය කිරීම.

07. පරිසරය කරා අපද්‍රව්‍ය සහ දූෂිත ද්‍රව්‍ය පිටවීමට සහ පරිසර තත්ත්වය ආරක්ෂා කිරීමට සහ වැඩි දියුණු කිරීමට අදාළ සියලු විධිමත් කිරීමේ කටයුතු සම්බන්ධීකරණය කිරීම කුණු අපද්‍රව්‍ය කසල සහ මළ අනවසරයෙන් බැහැර කිරීම, පිට කිරීම හෝ තැන්පත් කිරීම තහනම් කිරීම.

08. බිත්තිවල හෝ ගොඩනැගිලිවල හෝ වෙනත් යම් අවසර නොලත් ස්ථානවල පෝස්ටර් හෝ දැන්වීම් පත්‍රිකා ප්‍රදර්ශනය කිරීම තහනම් කිරීම සහ ප්‍රචාරක දැන්වීම් පුවරු ඉදිකිරීම විධිමත් කිරීම.

09. දර්ශනීය ස්ථාන සහ රජයේ දේපළ විරූපී කිරීම වැළැක්වීම.

10. ශබ්ද දූෂණය පාලනය කිරීම.

11. අධිකාරිය විසින් නිකුත් කරනු ලබන උපදේශක මාලාවන්ට අනුකූලව සෞඛ්‍යය හා පරිසරයට උපද්‍රවකාරී යම් ද්‍රව්‍යයක් ගබඩා කිරීම, ප්‍රවාහනය කිරීම සහ බැහැර කිරීම පාලනය කිරීම.

## කිරින්ද පුහුල්වැල්ල ප්‍රාදේශීය සභාව

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 152 වගන්තිය යටතේ ව්‍යාපාර බදු පැනවීම - 2017 වර්ෂය

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9 (3) වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව, තීරණ ලේඛනයේ අංක 395(3) යටතේ පහත උපලේඛනයෙහි සඳහන් පරිදි ව්‍යාපාර බද්දක් පනවා අය කිරීමට තීරණය කරන ලද බව මෙයින් නිවේදනය කරමි.

දික්කුඹුරගේ දයාසීලි,
ලේකම්,
කිරින්ද පුහුල්වැල්ල ප්‍රාදේශීය සභාව.

2016 සැප්තැම්බර් මස 03 වැනි දින,
කිරින්ද පුහුල්වැල්ල ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 152 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තියෙන් ප්‍රාදේශීය සභාවලට ලැබී ඇති බලතල ප්‍රකාර, එකී පනතේ හෝ ඒ යටතේ සාදන ලද යම් අතුරු ව්‍යවස්ථාවක විධිවිධාන යටතේ බලපත්‍රයක් ලබා ගැනීම හෝ එකී පනතේ 150 වැනි වගන්තිය යටතේ යම් කර්මාන්ත බද්දක් ගෙවීම අවශ්‍ය නොවන්නාවූ හා වෘත්තියක් නොවන්නා වූ කිසියම් ව්‍යාපාරයක් කිරින්ද පුහුල්වැල්ල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය ඇතුළත 2017 වර්ෂයේ දී කරගෙන යනු ලබන සෑම තැනැත්තෙකුගෙන්ම එකී ව්‍යාපාරයේ ඊට පෙර වර්ෂයේ ලැබීම් මෙහි පහත උපලේඛනයේ I තීරුවේ නිරූපිත යම් විෂයාංකයක සීමාවක් ඇතුළත පවත්නා අවස්ථාවක එහි II තීරුවේ අනුරූප සටහනෙහි නිරූපිත අනු ප්‍රමාණය අනුව වූ ව්‍යාපාර බද්දක් 2017 වර්ෂය සඳහා පනවා අය කිරීමටත් බද්දට යටත් යම් තැනැත්තෙකු එකී ව්‍යාපාර බද්ද 2017 වර්ෂයේ ජූනි මස 30 වැනි දිනට පෙර කිරින්ද පුහුල්වැල්ල ප්‍රාදේශීය සභාවට ගෙවිය යුතු බවට කිරින්ද පුහුල්වැල්ල ප්‍රාදේශීය සභාවේ ලේකම් දික්කුඹුරගේ දයාසීලි වන මා 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9 (3) වගන්තිය ප්‍රකාරව තීරණය කරමි.

### උපලේඛනය I

01. පෞද්ගලික අධ්‍යාපන ආයතනයක් පවත්වාගෙන යාම.
02. පෙර පාසල් දිවා සුරැකුම් මධ්‍යස්ථානයක් පවත්වාගෙන යාම.
03. පරිගණක මෘදුකාංග සංවර්ධන මධ්‍යස්ථානයක් පවත්වාගෙන යාම.
04. පරිගණක පුහුණු පාඨමාලා මධ්‍යස්ථානයක් පවත්වාගෙන යාම.
05. ජ්‍යොතිෂ්‍ය සේවා සපයන ආයතනයක් පවත්වාගෙන යාම.
06. රියැදුරු පුහුණුව සපයන ආයතනයක් පවත්වාගෙන යාම.
07. ආයුර්වේද වෛද්‍ය මධ්‍යස්ථානයක් (ඩිස්පැන්සරියක්) පවත්වාගෙන යාම.
08. බටහිර වෛද්‍ය මධ්‍යස්ථානයක් පවත්වාගෙන යාම.
09. වෛද්‍ය රසායනාගාරයක් පවත්වාගෙන යාම.
10. සත්ත්ව සායන මධ්‍යස්ථානයක් පවත්වාගෙන යාම.
11. නීතිඥ නොතාරිස් සේවා සපයන ආයතනයක් පවත්වාගෙන යාම.
12. පෞද්ගලික විගණන හෝ ගණකාධිකාරි සේවා සපයන ආයතනයක් පවත්වාගෙන යාම.
13. බැංකු සේවා සපයන ආයතනයක් (බැංකුවක්) පවත්වාගෙන යාම.
14. රක්ෂණ සේවා සපයන ආයතනයක් පවත්වාගෙන යාම.
15. මූල්‍ය පහසුකම් සපයන මූල්‍ය සමාගමක් පවත්වාගෙන යාම.
16. ප්‍රසිද්ධ සමාගමක භාණ්ඩ බෙදාහැරීමේ නියෝජිතයෙකු වශයෙන් කටයුතු කිරීම.
17. ප්‍රසිද්ධ සමාගමක භාණ්ඩ ප්‍රදර්ශනය කිරීම හා විකිණීම සඳහා ප්‍රදර්ශනාගාරයක් පවත්වාගෙන යාම.
18. යතුරු පැදි හා මෝටර් වාහන අලෙවි කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම.
19. ඉන්ධන පිරවුම්හලක් පවත්වාගෙන යාම.
20. රටබීම (අරක්කු) තොග වශයෙන් ගබඩා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම.
21. අරක්කු, බියර් විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම.
22. සිනමා ශාලාවක් පවත්වාගෙන යාම.
23. මගී ප්‍රවාහන සේවාවක් පවත්වාගෙන යාම.
24. භාණ්ඩ ප්‍රවාහන සේවාවක් පවත්වාගෙන යාම.
25. අමු තේ දළු එකතු කිරීමේ ව්‍යාපාරයක් පවත්වාගෙන යාම.
26. තේ කර්මාන්ත ශාලාවක් පවත්වාගෙන යාම.
27. වෙන්දේසිකරුවෙකු හෝ .තැරැව්කරුවෙකු වශයෙන් කටයුතු කිරීම.
28. කොන්ත්‍රාත්කරුවෙකු වශයෙන් කටයුතු කිරීම.
29. මිනින්දෝරු සේවා සපයන ආයතනයක් පවත්වාගෙන යාම.
30. ගෘහ නිර්මාණ සේවා සපයන ස්ථානයක් පවත්වාගෙන යාම.
31. වාස්තු විද්‍යා සේවා සපයන ආයතනයක් පවත්වාගෙන යාම.
32. ඉදිකිරීම් ඉංජිනේරු සේවා සපයන ආයතනයක් පවත්වාගෙන යාම.
33. විශේෂඥ වෛද්‍ය චැනල් සේවා සපයන ආයතනයක් පවත්වාගෙන යාම.
34. පෞද්ගලික රෝහලක් පවත්වාගෙන යාම.
35. විදුලි බලාගාරයක් පවත්වාගෙන යාම.
36. ඇඟලුම් කම්හලක් පවත්වාගෙන යාම.
37. දන්ත ශල්‍යාගාරයක් පවත්වාගෙන යාම.
38. නියෝජිත තැපැල් කාර්යාලයක් පවත්වාගෙන යාම.
